

# වාස්තු

ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයින්ගේ ආයතනය

## වාස්තු විද්‍යාවේ ප්‍රජා නියෝජනය

16 වෙළුම • 2 වන කලාපය • 2018 • රු 300/-

ISSN 1800 - 2129

MASTER ENGINEERING

# MASTER MODERN HOME



- *Fully Stainless Steel Colorful Pantry Cupboards*
- *Fully Zinc Steel Colorful Pantry Cupboards*
- *Closet Wardrobes/Dressing Table Bath room vanity Cupboards*
- *Power Operater Sliding /Swing Gates*
- *Timber/Galvanized Wicked Gates*
- *Galvanized /SS/Timber Hand Railing*
- *Galvanized Balcony Railing*
- *Steel Staircases*
- *Spiral Staircases*
- *Polycarbonate Canopy*
- *Timber Staircases with Landin*
- *Steel and Stainless Stell Farication*

## MASTER SMART FABRICATION

සුන්දර නිවසක් සඳහා...







*Show Room/Office*

**Master Modern Home**
# 34/B, Makola North, Makola.

- www.masterengineering.lk
- masterengineering144@gmail.com
- masterengineering34b
- 077 8152869
- masterengineering144

*Work Shop/Factory*

**Master Engineering**
# 611/3A, Ihala Biyanwila, Kadawatha.

***Hot Line***
**077 8152869/ 075 2954194**

පටුන

# වාස්තු

ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයින්ගේ ආයතනය

16 වන වෙළුම | 2 වන කලාපය | 2018

06 **සංස්කාරක සටහන**
වරලත් වාස්තු විද්‍යාඥ රන්ජන සුරවීර

08 **පිවිසුම**
වරලත් වාස්තු විද්‍යාඥ රන්ජන සුරවීර

10 **චරිතාංගය**
ශ්‍රී ලාංකීය නූතන නගර නිර්මාණකරණයේ මහා ටැඹ: ඔලිවර් වීරසිංහ
සටහන: වරලත් වාස්තු විද්‍යාඥ ආචාර්ය නිශාන් රසාංග විජේතුංග
පර්යේෂණ සහාය: මනෝරි ජයලත්

14 **වාස්තු විද්‍යාවේ ප්‍රජා නියෝජනය**
සරල අඩු වියදම් පසන් නිවස
සටහන - වරලත් වාස්තු විද්‍යාඥ සුසන්ත මුණමල්පේ

18 **විශේෂාංගය**
ජාතික වාස්තු විද්‍යා සම්මන්ත්‍රණය
සටහන - වරලත් වාස්තු විද්‍යාඥ සුසිල් ලමාහේවා

25 **වාස්තු විද්‍යාවේ ප්‍රජා නියෝජනය**
අතේ ඇති මුදලට නිවසක් - පළමු කොටස
සටහන - වරලත් වාස්තු විද්‍යාඥ අනුක වෙත්තසිංහ

28 **වාස්තු විද්‍යාවේ ප්‍රජා නියෝජනය**
අසන්න, දකින්න, විඳින්න අවකාශයේ නාටකීය අත්දැකීම
සටහන - වරලත් වාස්තු විද්‍යාඥ චානා සමරසිංහ

42 **යටගියාව**
වටදාගේ: වාස්තු විද්‍යා නිර්මාණ, ලක්ෂණ සහ කල්පිතයන්...
සටහන - වරලත් වාස්තු විද්‍යාඥ ආචාර්ය නිලාන් කුරේ

50 **වාස්තු දැක්ම**
වාස්තු ශාස්ත්‍රය සහ නවීන වාස්තු විද්‍යාවේ ගැලපීම
සටහන - වරලත් වාස්තු විද්‍යාඥ රෝහණ බණ්ඩාර හේරත්

53 **අභ්‍යන්තර අලංකරණය**
ස්වභාවික ඉතිහාස කෞතුකාගාරය
සටහන - වරලත් වාස්තු විද්‍යාඥ චානා සමරසිංහ

64 **වාස්තු විද්‍යාවේ ප්‍රජා නියෝජනය**
පසු නූතනත්වයේ රිදී එළිය: රොන්වැම්ප් දෙව් මැදුර
සටහන - වරලත් වාස්තු විද්‍යාඥ සුමුදු අතුකෝරල

71 **ආවර්ජනා**
හදන ගෙදර
සටහන - වරලත් වාස්තු විද්‍යාඥ අනුක වෙත්තසිංහ

72 **වාස්තු විද්‍යාවේ ප්‍රජා නියෝජනය**
ආත්මීය නිවහන
සටහන - වරලත් වාස්තු විද්‍යාඥ සමීර ධර්මසේන

80 **වාස්තු විද්‍යාවේ ප්‍රජා නියෝජනය**
ඔබේ වාස්තු විද්‍යාඥයා සහ ඔබ
සටහන - වරලත් වාස්තු විද්‍යාඥ සුමුදු අතුකෝරල

84 **කලාව**
විස්මෘතියේ හා විදුරණයේ වාස්තු විද්‍යාත්මක ප්‍රකාශනය
THE BELLY ON ARCHITECT
සටහන - වරලත් වාස්තු විද්‍යාඥ ආචාර්ය නිශාන් රසාංග විජේතුංග

88 **නික්මණ**
වරලත් වාස්තු විද්‍යාඥ රන්ජන සුරවීර



















SUPERIOR JAPANESE TECHNOLOGY
ඉන්සිනරේටර්
FUEGO
On-Site Clean Incineration System
Industrial, Medical & Solid Waste Management Solutions
Odor free, Black smoke free operation
Eco-Friendly
Easy maintenance & Safe operation
අපද්‍රව්‍ය තවදුරටත් ඔබට
හිසරදයක් නොවේවි...
LOWEST Running Cost In Sri Lanka
Perfect Choice
Ideal for
Factories | Hospitals | Hotels & Apartments
කර්මාන්ත ශාලා රෝහල් හෝටල් සහ නිවාස
සංකීර්ණ සඳහා යෝග්‍යයි
Exclusively from
BOSTON DEVICES
the growth strategists
+94774558901
+94777698820
www.bostondevices.lk

**වාස්තු විද්‍යා ග්‍රන්ථ ප්‍රකාශන මණ්ඩලය**


**ප්‍රධාන සංස්කාරක**
ව. වා. වි. රන්ජන සුරවීර
E-mail: rannjana@gmail.com

වාස්තු විද්‍යා ග්‍රන්ථ ප්‍රකාශන මණ්ඩලය
ව.වා.වි. රන්ජන සුරවීර, FIA (SL) - සභාපති
ව.වා.වි. සාගර ජයසිංහ, FIA (SL) - ලේකම්
ව.වා.වි. රසල් දන්දෙනිය, FIA (SL)
ව.වා.වි. රෝහණ බණ්ඩාර හේරත්, FIA (SL)
ව.වා.වි. ආචාර්ය ජගත් මුණසිංහ, FIA (SL)
ව.වා.වි. චින්තන පියදිගම, FIA (SL)
ව.වා.වි. චානා සමරසිංහ, AIA (SL)
ව.වා.වි. සාලින්ද්‍ර රතුගම, AIA (SL)
ව.වා.වි. දමිත් ප්‍රේමතිලක, AIA (SL)
ව.වා.වි. චින්තක තිකපිටිය, AIA (SL)
ව.වා.වි. ආචාර්ය නිශාන් විජේතුංග, AIA (SL)
ව.වා.වි. කාන්චනා අබේසිංහ, AIA (SL)
ව.වා.වි. සුමුදු අතුකෝරාල, AIA (SL)
ව.වා.වි. සුසිල් ළමාහේවා, AIA (SL)
ව.වා.වි. සමීර ධර්මසේන, AIA (SL)

නිර්මාණ සැකසුම-
අයි. එස්. හෝල්ඩින්ග්ස්
දුරකථන: 0773-850-840-ඉන්දික
E.mail : indika0773850840@gmail.com

මුද්‍රණය-
සොෆ්ට්වේව් ප්‍රින්ටින් සහ පැකේජින්
107D, හැව්ලොක් පාර, කොළඹ 5.
දුරකථන: 011-250-2295
E.mail : krishantha@softwave.lk

ප්‍රකාශනය-
වාස්තු විද්‍යා ග්‍රන්ථ ප්‍රකාශන මණ්ඩලය
ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයින්ගේ ආයතනය
120/7, විද්‍යා මාවත, කොළඹ 7.
දුරකථන: 011-269-7109, 267-9507
ෆැක්ස්: 011-268-2757



මෙහි පළවන ලිපි හෝ ඒවායේ කොටස් වාස්තු සඟරාවේ සංස්කාරකතුමාගේ හෝ වාස්තු විද්‍යා ග්‍රන්ථ ප්‍රකාශන මණ්ඩලයේ සභාපතිතුමාගේ හෝ අවසර නොමැතිව නැවත පළකරන්නේ නම් ඒ ලිපි සමග මේ සඟරාව හා ලිපියේ මුල් කර්තෘ සඳහන් කළ යුතු අතර, ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයින්ගේ ආයතනයට දැනුම් දීමක්ද කළ යුතුයි. මෙහි පළවන ලිපි මගින් ප්‍රකාශිත අදහස් එම ලිපි ලියන ලද්දන්ගේ අදහස් වන අතර එම අදහස් සඳහා ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයින්ගේ ආයතනය හෝ වාස්තු සඟරාවේ කර්තෘ මණ්ඩලය වගකිවයුත්තෝ නොවෙති.





කවරය

*"...නිවැසියා තම ස්වභාවික චර්යාවෙන් තම නිවස තුළ ජීවත්විය යුතුය. එම නිවස තමා තුල මෙන්ම තමාගේ ආත්මය තුලටද කා වැදී ඇත්නම් එය සැබැවින්ම නිවැසියා වෙනුවෙන්ම නිර්මාණය වුවක් වේ."* වරලත් වාස්තු විද්‍යාඥ දමිත් ප්‍රේමතිලකගේ "ආත්මීය නිවසින්" මෙය වඩා පැහැදිලිවේ.

## වාස්තු සංස්කාරක මණ්ඩලය


ව.වා.වි. රන්ජන සුරවීර, FIA (SL) - ප්‍රධාන සංස්කාරක
ව.වා.වි. රෝහණ බණ්ඩාර හේරත්, FIA (SL)
ව.වා.වි. චානා සමරසිංහ, AIA (SL)
ව.වා.වි. ආචාර්ය නිශාන් විජේතුංග, AIA (SL)
ව.වා.වි. සුමුදු අතුකෝරාල, AIA (SL)
ව.වා.වි. සුසිල් ළමාහේවා, AIA (SL)
ව.වා.වි. සුසන්ත මූණමල්පේ , AIA (SL)
ව.වා.වි. අනුක වෙත්තසිංහ, AIA (SL)
ව.වා.වි. සමීර ධර්මසේන, AIA (SL)


## ආරාධිත සාමාජිකයින්


ව.වා.වි. ආචාර්ය නිලාන් කුරේ, AIA (SL)
වා.වි. ඉරෝෂ් මෙන්ඩිස්
වා.වි. ඉමාශි ඕපාත


Exclusive Agents
ROMASTONE 羅馬崗石
Manufacturer and Supplier of Agglomerated Marble
POWER STONE
Manufacturer and Supplier of Quartz Stone and Artificial Marble
Distributor
Manufacturer and Supplier of Conmix Tile Adhesive - C500 White, C500 Grey and C800
Free Lanka granite
GRANITE
MARBLE
AGGLOMERATED MARBLE
TERRACOTTA
QUARTZ
PORCELAIN
SLATE
SANDSTONE
LIMESTONE
Free Lanka Granite (Pvt) Ltd
(Office & Showroom)
No: 48A, Ward Place, Colombo-7, Sri Lanka.
Tel: 4944637 / 8, 2693757 / 8 Fax: 4715828
E-mail: fggranite@sltnet.lk / info@freelankagranite.com
Web Site: www.freelankagranite.com
Factory :
P.O.Box 03, 96, Gemunu Mawatha, Homagama, Sri Lanka.
Tel/Fax: 94-11-2855334, 94-11-4442023
SMART MATERIALS FOR ULTIMATE FINISHES

සතර පැතිරූ හැමට අකුරූ
නිතර මැතිරූ ගුරුය දිනිරූ
සසර හමුවූ කලණ මිතුරූ
අඳුර දුරලූ ඔබය රිවිරූ

පැතිරු කරුණා ගුණය මහරූ
වැතිරු හදෙහී පතුලෙ ගැඹුරූ
මැදුරු පවුරූ අතැර සොඳුරූ
අකුරු කරවූ ඔබය දෙගුරූ

අසුරු සැනෙකින් වළා ඇතිරූ
අඳුරු අඹරේ ගිලූණි ලහිරූ
නිසරු දිවි මග අතැර තිසරූ
රුදුරු මරු හා වීය මිතුරූ

ඇසුරු කළ ඔබ ළඟම මිතුරූ
නිසරු දේහය අසල මැතිරූ
මියුරු ගීයකි කණට කෙඳිරූ
ඇදුරු ලෙස යලි දකිමු ඔබ රූ

# වාස්තු විද්‍යාවේ ප්‍රජා නියෝජනය; වාස්තු නිර්මාණ තුලින් මිනිසා සහ ඔහු ජීවත්වන ස්ථානය නියෝජනය වේ...

බොහෝ වාස්තු විද්‍යාඥයන් අතර මත බේදයකට තුඩු දෙන්නක් සේම විවිධවු අර්ථකතනයන් ඔස්සේ යමින් විවිධ වූ අදහස් ඉදිරිපත් කිරීමට පෙලඹී සිටීම නිසා, මෙය ඉතා සරලව, සාරාංශය පමණක් ඉදිරිපත් කිරීම පාඨකයන්ට අවබෝධය කර ගැනීම වඩා පහසු කරනු ඇත.

ලංකාවේ අපට බොහෝමයක් දක්නට ඇත්තේ ප්‍රජාව සහ ස්ථානය සම්බන්ධව කිසිදු තැකීමකින් තොරව, වාස්තු විද්‍යාවේ මූලික සංකල්පයන්ද උල්ලංඝණය කරමින්, මිත්‍යාව වපුරමින් වාස්තු විද්‍යාඥයන් යයි කියාගන්නා පුද්ගලයන් විසින් කරන ලද ගොඩනැගිලිය. එහෙත් මෙවැනි තත්ත්වයක් ලෝකයේ දියුණු රටවල්වල දක්නට නොමැත. ප්‍රජාව සහ ස්ථානය සිහි තබා නොගෙන කරන්නාවූ නිර්මාණයක්, තර්කානුකූලව, මේ මිහිපිට ඕනෑම තැනකටත් මේ මිහිපිට වෙසෙන ඕනෑම පුද්ගලයෙකුට හෝ පුද්ගල සමූහයකටත් ගැලපෙනවා වියයුතුය. එහෙත් එය එසේ නොවෙන බව වටහා ගැනීම ඉතා ගැඹුරු දහමක් නම් නොවේ. අදාළ පරිසරයට මෙන්ම ප්‍රජාවගේ චර්යාව හරි හැටි අවබෝධ නොකරගෙන නිර්මාණයවූ ඉතා විශාල ගොඩනැගිලි සංකීර්ණ අත්හැර දමා (Abandoned) හෝ ප්‍රතිජනනය කර (Regeneration) ඇති අවස්ථා සොයා බැලීමේදී මෙය හොඳින් වටහා ගත හැක.

වාස්තු විද්‍යාඥයකුගේ නිර්මාණයක් සඳහා දායක වන ප්‍රාථමික උත්පාදකයන් (Primary generators) කිහිපයක් අතුරින් ප්‍රජාව සහ ස්ථානය ප්‍රධාන තැනක් ගනී. වාස්තු විද්‍යාඥයකු නිර්මාණ කාර්යයක් සඳහා අනුගතවීමේදී එකී නිර්මාණය සඳහා වඩා උචිත උත්පාදකය නිරන්තරයෙන්ම ඔහු අභ්‍යන්තරයේ සිදුවන ක්‍රියාදාමයක් තුලින් පැන නගින අතර මෙම ප්‍රාථමික උත්පාදකයන් තමා අභ්‍යන්තරිකවම කළමනාකරණය කරමින් නිර්මිත පරිසරය සැකසීමේදී, එකී නිර්මාණය නිතැතින්ම එම ස්ථානයත් එහි ප්‍රජාවත් නියෝජනය කරන කැඩපතක් බවට පරිවර්තනය වේ.

එසේ නම් වාස්තු විද්‍යාවේ ප්‍රජා නියෝජනය යන්න වඩාත් පුළුල් ලෙස සළකා බැලීමෙන් පෙනීයන්නේ, ඒ ඒ ප්‍රජාවගේ චර්යා රටාව සහ ස්ථානයේ භූගෝලීය සාධක සමග දෝලනය වන පාරිසරික විචල්‍යන් කෙරෙහි දක්වන සංවේදීතාවය තුලින් බිහිවන නිර්මාණ, ගුණාත්මකභාවය අතින් ඉතා ඉහළ බවයි. එය එසේ නම් මෙහි ප්‍රතිවර්තය වන්නෙ, යම් නිර්මාණයක් ප්‍රජාවට මෙන්ම ඔවුන්ගේ පරිසරයට හොඳින්ම අනුගතවේ නම්, එම නිර්මාණය තුලින් එකී ප්‍රජාව මෙන්ම ස්ථානයද නියෝජනය කරන බව නොවේද?



# ශ්‍රී ලාංකීක නූතන නගර නිර්මාණකරණයේ මහා පහන් ටැඹ:

# ඔලිවර් වීරසිංහ

ශ්‍රී ලංකාවේ නගර හා ග්‍රාම නිර්මාණකරණයේ ආරම්භය සොයා බැලූවහොත් එය ඉතා ඈත අතීතයට දිව යන්නකි. නවීන ග්‍රාම හා නගර නිර්මාණ ඉතිහාසය තුල නිල වශයෙන් සලකා නොබැලූවද අනුරාධපුර රාජධානිය ඇරඹීමටත් පෙර පටන්ම සැලසුම්සහගත ග්‍රාම හා නගර නිර්මාණ ලක්දිව තුල තිබු බවට සාක්ෂි හමුවේ. දිවයින තුල පුරාවිද්‍යාත්මක සාධක හමුවන ප්‍රථම ජනාවාස සැලසුම්කරණය ලෙස සැලකෙන්නේ තම්මැන්නා ගම හා අනුරාධ ග්‍රාමයයි. එතැන් පටන් ශ්‍රී ලංකා ඉතිහාසයේ අනුරාධපුර රජ සමයේ පටන් විධිමත් ග්‍රාම හා නගර පද්ධතියක් පවත්වාගෙන ගොස් ඇත. මෙසේ ආරම්භක ජනාවාස බොහොමයකම දක්නට ලැබුනේ ගංගා නිම්නයන් කේන්ද්‍ර කොටගත් සැලසුම්කරණයකි. නූතනයේ පවතින ග්‍රාම හා නගර නිර්මාණකරණය යන විෂය අවධානයට භාජනය කළහොත් එය භෞතිකමය ලෙස පමණක් නොව සාමාජීය, ආර්ථිකමය හා පාරිසරික සාධකයන් ඔස්සේද සැලසුම් සහගත විය යුතුය. අපගේ අතීත රජධානින් පවා මෙවන් සැලසුම්කරණයන්ගෙන් හෙබි සාර්ථක නිර්මාණයන් වී තිබීම කැපී පෙනෙන ලක්ෂණයකි.

කෙසේ නමුත් නූතන ලෝකයේ 'නගර නිර්මාණ ශිල්පියා' (Town Planner) නමින් වෘත්තියක් ආරම්භ වූයේ 1914 වසරේ බ්‍රිතාන්‍ය රාජකීය නගර සැලසුම්කරණ ආයතනය (Royal Town Planning Institute) පිහිටුවීමත් සමගය. යටත් විජිත සමයේ ලංකාවේ නගර නිර්මාණකරණය ප්‍රධාන වශයෙන් කොළඹ අග නගරය මූලික කොටගත් සංවර්ධන ව්‍යාපෘතියක් විය. 16 වන සියවසේ සිට පෘතුගීසි ආගමනයත් සමග කොළඹ නගරයේ සංවර්ධන කටයුතු ආරම්භ කරන ලද්දේ එහි වෙළෙඳ මධ්‍යස්ථානයක් (Trading Station) පිහිටුවීමත් සමගය. 17 වෙනි සියවසේ සිදුවූ ලන්දේසි ආක්‍රමණයත් සමග එම සංවර්ධනය කොළඹට පමණක් සිමා නොවී ත්‍රිකුණාමලය (Trincomalee), යාපනය (Jaffna), මීගමුව (Negombo) සහ ගාල්ල (Galle) වැනි දේශීය අග නගරයන් දක්වාද විහිදුණි.

බ්‍රිතාන්‍ය යුගයේදී එවකට යටත් විජිත රජය විසින් පැට්‍රික් ගෙඩිස් (Patrick Geddes) නම්වූ නගර සැලසුම් ශිල්පියා බ්‍රිතාන්‍යයේ සිට මෙරටට ගෙන්වාගත් අතර කොළඹ නගරය සැලසුම් කිරීම සඳහා ඔහු වාර්තාවක් පිළියෙල කලේය. මෙසේ නිර්මාණය කරන ලද සැලසුම් 'Plan for the City of Colombo' නම් වූ අතර කොළඹ වරායේ ප්‍රගමනය සහ අර්ධ-නාගරික ප්‍රදේශයන්ගේ පිහිටුවීම වැනි සංකල්පයන් මත පදනම්වූ එය එතරම් සාර්ථක නොවූ බව විචාරකයන්ගේ අදහසයි. 1947 වසරේදී නගර හා ග්‍රාම නිර්මාණකරණ ආඥා පණත (Town and Country Planning Ordinance) දෙවන ලෝක යුද්ධයෙන් පසුව අවධියේදී මෙරටට පැමිණි ක්ලිෆර්ඩ් හොලිඩේ (Clifford Holliday) නගර නිර්මාණ ශිල්පියාගේ යෝජනාවලීන් මත පිහිටවූ අතර, 1948 වර්ෂයේදී ප්‍රසිද්ධ නගර නිර්මාණ ශිල්පී ශ්‍රීමත් පැට්‍රික් ඇබර්කොම්බි (Patrick Abercombie) ලංකාවට පැමිණියේ කොළඹ නැවත සැලසුම් කිරීම සඳහාය. එහිදී එවකට ශ්‍රී ලංකාවේ විසූ එකම හා ප්‍රථම වෘත්තිය නගර සැලසුම් ශිල්පියා වූ ඔලිවර් වීරසිංහ මහතාගේ දායකත්වය මෙම ව්‍යායාමයට නිතැතින්ම ලැබිණි. වාස්තු විද්‍යා විෂයේ මෙන්ම නගර නිර්මාණකරණයේද දක්නට තිබූ බටහිර ආභාෂය ප්‍රයෝජනයට ගැනීමේ ස්වභාවය (Core-oriented Nature) මෙලෙස කාලානුක්‍රමිකව යටත් විජිත රජයේ ආරාධනයෙන් මෙරටට සම්ප්‍රාප්තවූ බ්‍රිතාන්‍යයේ මෙන්ම බ්‍රිතාන්‍ය යටත් විජිතයන් තුලද නමක් දිනාගෙන සිටි නගර නිර්මාණ ශිල්පීන්ගේ ක්‍රියාකාරකම් ඔස්සේ සිදු විය.

මෙවන් සන්දර්භයක් තුල ඔලිවර් වීරසිංහ මහතා ශ්‍රී ලංකාවේ ප්‍රථම නගර නිර්මාණ ශිල්පියා (City Lanner) ලෙස සේවය කිරීමට වරම් ලද්දේය. නගර නිර්මාණකරණ ක්ෂේත්‍රය තුල එතුමා ඉටුකල ඉමහත් සේවය හේතුවෙන් 'ශ්‍රී ලාංකීය නගර නිර්මාණකරණයේ පියා' ලෙස එදා මෙදා තුර හැඳින්වීම විශේෂිතය. කොළඹ රාජකීය විද්‍යාලයෙන් (Royal College, Colombo) සිප්සතර හැදෑරූ එතුමා ප්‍රභූ (Elite) පසබිමකින් යුක්ත වූ පවුලක දරුවන් තිදෙනෙකුගෙන්



බාලයා විය. උසස් අධ්‍යාපනය ලබාගැනීම සඳහා මහා බ්‍රිතාන්‍ය බලා පිටත්ව ගිය එතුමා එහිදී වාස්තු විද්‍යා විෂයට අමතරව නගර නිර්මාණකරණය හැදෑරූ අතර, 1920 ගණන්වලදී ලිවර්පූල් විශ්ව විද්‍යාලයේදී (University of Liverpool) සුප්‍රකට නගර නිර්මාණ ශිල්පී ශ්‍රීමත් පැට්‍රික් ඇබර්කොම්බි යටතේ පුහුණුව ලැබීමට තරම් වාසනාවන්ත වූයේය. තරුණවියට පත් ඔලිවර් වීරසිංහ ක්‍රිස්ටෝබල් කොතලාවල මෙනවිය හා අතිනත ගත් අතර ඇය රාජ්‍ය මන්ත්‍රණ සභාවේ (State Council of Ceylon) සාමාජික ශ්‍රීමත් හෙන්රි කොතලාවල මහතාගේ එකම දියණිය වූවාය. මෙලෙස පාලන තාන්ත්‍රික ප්‍රභූ (Governing Elite) පවුල් පසුබිමකට තම විවාහය හරහා උරුමකම් කීමට සමත් වූ එතුමාගේ වෘත්තිය ප්‍රගමණය උදෙසා ද මෙම සම්බන්ධතාවය බෙහෙවින් ඉවහල්වන්නට ඇත.

ශ්‍රී ලාංකීය නගර නිර්මාණකරණය තුල ඔලිවර් වීරසිංහ මහතාගේ සේවාවන් අතර වඩාත් කැපීපෙනෙන කාර්යය ලෙස අනුරාධපුර නව නගරය සැලසුම්කිරීම හා සංවර්ධනය කිරීම පෙන්වාදිය හැක. 1940 වර්ෂයේ ඇරඹූ මෙම සුවිශේෂ ව්‍යාපෘතිය අතීත ලාංකීය උරුමයන් සංරක්ෂණය කිරීමට අත්‍යාවශ්‍ය ක්‍රියාවලියක් ලෙස සැලකිණි. ඔහුගේ විධිමත් හා කල්පනා සහගත යොමුවීම (Methodical and Thoughtful Approach) තුලින් අනුරාධපුර නව නගර සැලසුම්කරණයේදී ඔහු අපේක්ෂා කල අරමුණු ත්‍රිත්වය කරා යොමුවීමට ඔහුට හැකිවිය. මෙම ක්‍රියාවලිය තුලදී ඔහුගේ ඉතාමත් තීරණාත්මක අපේක්ෂාව වූයේ පෞරාණික නගරය, අනාගතයේ සිදුවිය හැකි අනවසර ඉඩම් පරිභෝජනයෙන් (Further Encroachments) ආරක්ෂා කරගැනීම හා නව ඉදිකිරීම් අතරින් පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුතු භූමීන් (Sites of Archaeological Value) වෙන්කොටගෙන සුරැකීමයි. දෙවැන්න වූයේ වන්දනාකරුවන් සඳහා සාමකාමී හා ගෞරවනීය පරිසරයක් සකසා දීමයි. අවසාන වශයෙන් පුරාවිද්‍යාඥයන් සඳහා අවහිරතාවයකින් තොරව තම කාර්යයන් කරගෙන යාම සඳහා පහසුකම් සලසා දීමත්, වටිනා නටඹුන් පාලනයකින් තොර සංවර්ධන ක්‍රියාදාමයන් තුලින් අවට පරිසරය විනාශ වී යාම වැලැක්වීමටත්ය. අනුරාධපුර නව නගරයේ යටිතල පහසුකම් නිර්මාණකරණයේදී එය පුද්ගලයන් 25,000 කට නේවාසිකව සිටිය හැකිසේ සකසා තිබූ අතර වර්තමානය වන විට එම ධාරිතාවය 60,000 දක්වා සංවර්ධනය කොට ඇත. මීට අමතරව ලංකාවේ වෙනත් නගර නැවත නිර්මාණකරණයේදී මෙම අනුරාධපුර නව නගරය ආදර්ශයක් ලෙස ගෙන තිබීම විශේෂත්වයකි. මෙයට කදිම නිදසුනක් වනුයේ කතරගම නව නගරයයි. කේසේ නමුත් මෙවැනි ව්‍යාපෘතීන්ගේ කැපී පෙනෙන නිරීක්ෂණයක් වූයේ නව ඉදිකිරීම් වල වර්ධනය නොනැවැත්විය හැකි වීමයි. මෙහිදී මෙවන් ගැටළු නිරාකරණය කිරීම සඳහා විවිධ රටවල් තුල සිදු වූ විවිධ මාදිලියේ ව්‍යාපෘතීන් අධ්‍යයනය කරමින් නව නගර සැලසුම් කිරීමට තරම් ඔලිවර් වීරසිංහ මහතා සැලකිලිමත් විය. අනුරාධපුර නව නගරය 'උද්‍යාන නගරයක්' (Garden City) ලෙස සැලසුම් වූ අතර ඔලිවර් වීරසිංහ මහතාගේ ගුරුවරයා වූ ඇබකොම්බි මහතා මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන උපදේශකවරයෙකු වශයෙන් සේවය කිරීම කැපී පෙනෙයි.

ඔලිවර් වීරසිංහ මහතා තම නගර නිර්මාණ ව්‍යාපෘතීන් තුලදී මනා ලෙස සැලසුම් සහගත විය. ව්‍යාපෘති සඳහා බලපෑ හැකි විවිධාකාරයේ බලපෑම්, අවහිරතා සලකා බැලූ එතුමා සාමාන්‍ය ජනතාව වෙත ව්‍යාපෘතීන් තුලින් වන බලපෑම විශ්ලේෂණය කළේය. අනාගතයේදී එහි සිදුවිය හැකි වෙනස්කම්, සංවර්ධනය තුලින් සිදුවන වෙනස්කම් හා කොපමණ වියදමක් දැරිය යුතු වේද යන්න එතුමා මූලික අවස්ථාවන් වලදීම සලකා බැලීමට දුරදර්ශී විය. එසේම නගර නිර්මාණයේදී, එය ලාංකීය සංස්කෘතිකමය හා සමාජමය පසුබිමක් තුල කෙතරම් උචිත වේද යන්න මෙන්ම නීතිමය, තාක්ෂණිකමය මෙන්ම උපරිම සඵලතාවයකින් යුතුව භූමි භාවිතය පිළිබඳව එතුමා සැලකිලිමත් වූ අතර මෙම ව්‍යාපෘතිය තුලින් සාමාන්‍ය ජනතාවට අවශ්‍ය ප්‍රමාණයට ආලෝකය, පිරිසිදු ජල පහසුකම් හා අපද්‍රව්‍ය බැහැර කිරීමේ පද්ධතීන් සපයා




දීමට ද කටයුතු කළේය. ඔහු විසින් නූතන බටහිර නගර නිර්මාණ සංකල්ප හා ලාංකීය ඓතිහාසික නගර නිර්මනකරණයේ එන ලක්ෂණ මුසු කරමින් දෙමුහුම් (Hybrid) ආකාරයේ නගර නිර්මාණයේ යෙදීම කැපී පෙනෙයි.

වර්ෂ 1966-1971 කාල වකවානුවේදී ඔලිවර් වීරසිංහ මහතා එකසත් ජනපදයේ ලාංකීය තානාපතිවරයා වශයෙන් (Ceylon's Ambassador to the United States) සේවය කල අතර, 1956-1965 කාලය තුලදී එක්සත් ජාතීන්ගේ සංගමයේ (United Nations Organization) අධ්‍යක්ෂකවරයෙක් (Director) ලෙස නිව්යෝක්හි සේවයේ නිරත විය. මෙම සාධක වලින් පැහැදිලි වන්නේ තම ඉහත විස්තර කල සුවිශේෂ පවුල් පසුබිම සහ දේශපාලන සම්බන්ධතා තුලින් එතුමා මෙරට දේශපාලන තන්ත්‍රය මගින් පිරිනැමිය හැකි ඉහලම මට්ටමේ තනතුරු මඟින්ද පිදුම් ලැබූ බවයි. ඔහුගේ නිල කාලය තුල එක්සත් ජනපදයේ තානාපති මන්දිර (Consulates) සතරක් පිහිට වූ අතර වොෂින්ටනයේ බෞද්ධ විහාරස්ථානයක්ද ඇති කළේය. මෙකල ඔහුගේ බිරිඳ වූ ක්‍රිස්ටෝබල් මහත්මියද එක්සත් ජාතීන්ගේ සංගමයේ විකල්ප නියෝජිතවරියක් බවට පත්වූ අතර වොෂින්ටනයේ ඇමරිකානු විශ්වවිද්‍යාල මධ්‍යස්ථානයේ (American University Station in Washington) 'tales from the east' (පෙරදිග කතාන්දර) නමින් රේඩියෝ වැඩසටහනක්ද ඉදිරිපත් කළාය. ඔලිවර් වීරසිංහ මහතා බ්‍රිතාන්‍ය රාජකීය වාස්තු විද්‍යාඥයන්ගේ සංගමයේ (Royal Institute of British Architects) සාමාජිකත්වයට මෙන්ම රාජකීය නගර සැලසුම්කරණ ආයතනයේ (Royal Town Planning Institute) සාමාජිකත්වයටද පත් වීමට සමත් වූ ප්‍රථම ශ්‍රී ලාංකිකයා යැයි පැවසීම නිවැරදිය. පසු කලෙක ලංකා වාස්තු විද්‍යාඥයන්ගේ සංගමය (Ceylon Institute of Architecture) පිහිටුවීමේදීද එතුමා පුරෝගාමියෙක් බවට පත්වීම කැපී පෙනෙන ලක්ෂණයකි.

නගර නිර්මාණ කටයුතු සඳහා කළ මහඟු දායකත්වයට අමතරව වාස්තු විද්‍යා ක්ෂේත්‍රයටද ඔලිවර් වීරසිංහයන් අතින් වූ සේවාව අගැයිම වටී. කොළඹ පිහිටි සුප්‍රසිද්ධ ලේක් හවුස් (Lake House) ගොඩනැගිල්ල නිර්මාණය තුලින් එතුමා මහත් පිළිගැනීමකට පාත්‍රවිය. එය වූ කලී ඩී. ආර්. විජේවර්ධන මහතාට අයත්ව තිබූ සිලෝන් පුවත්පත් සමාගමේ (Associated Newspapers of Ceylon) ප්‍රධාන කාර්යාලයයි. 1929 වර්ෂයේදී නිර්මාණය වූ එම ගොඩනැගිල්ල ලංකාවේ ප්‍රථම ජාතික පුවත්පත් මුද්‍රණ සමාගම බවට පත්විය. මෙම නිර්මාණය නවීන යුගයට අයත්සේ කාර්යබද්ධවාදී (Rationalist) ආකාරයෙන් යකඩ සහ කොන්ක්‍රීට් මූලික අමුද්‍රව්‍යය ලෙස භාවිත කරමින් තැනුණු නමුත් ඓතිහාසික වාස්තු විද්‍යා ලක්ෂණ සම්ප්‍රේෂණය කොටගත් අපූරු නිර්මාණයක් විය. සම්ප්‍රදායික ද්විත්ව කුළුණු (Double Columns), සූර්යය ආවරණ (Sun Shades), තාප්ප බිත්ති (Parapet Walls), දොර ජනේල (Fenestration) සහ කැටයම්/අලංකරණ විධි (Adornments) අන්තර්ගත එම නිර්මාණය පෞරාණික විහාර වාස්තු විද්‍යාවේ (Old Temple Architecture) ලක්ෂණයන් සිහි ගන්වයි. කොළඹ නගරයේ වෙළෙඳ මධ්‍යස්ථානය (Commercial Center of the City) අසල තවමත් දැක ගත හැකි මෙම ගොඩනැගිල්ල එක්තරා සංක්‍රාන්ති යුගයක ගෘහ නිර්මාණ ශිල්පය පිළිඹිබු කරයි. එනම් බ්‍රිතාන්‍ය යටත් විජිත සමයෙහි අග භාගයේ ඇතිවූ නිදහස් අරගලයන් සමග ජනතාව තුල ඇතිවූ ජාතිමාමක චින්තනය උද්ගමනයකට පැමිණ තිබූ සමයක එය වාස්තු විද්‍යාවෙන්ද පිළිඹිබු වූ අවස්ථාවක් ලෙස මෙම නිර්මාණය සැලකිය හැක. තම යටත් විජිතයන්හි අභිනවයෙන් නිර්මාණය වූ නවීන කාර්යබද්ධවාදී ගොඩනැගිලිවලට එම රටවල ඉපැරණි සංස්කෘතික වාස්තු විද්‍යාත්මක නිර්මාණයන්හි එන අලංකරණයන්හි (Decorative) කොන්ක්‍රීට් ප්‍රතිනිෂ්පාදනයන් (Reproductions) මගින් දේශීය උරුවක් ලබාදීමට බ්‍රිතාන්‍ය වස්තු විද්‍යාඥයන් ඉමහත් තැනක් ගත් සමයක් මෙම ගොඩනැගිල්ල තුලින් මතකයට එයි. ඉන්දියානු අර්ධද්වීපය තුල මුලින්ම අත්හදා බැලුණු මෙම ගොඩනැගිලි සඳහා ඊනියා (Pseudo) වාස්තු විද්‍යාත්මක නිර්මාණ යන ලේබලය විචාරකයන් විසින් ලබා දී ඇත.

වීරසිංහයන් අතින් බිහිවූ තවත් කතාබහට ලක්වූ නිර්මාණයකි 1930 දශකයේ අග භාගයේ කොළඹ ටොරින්ටන් සහ බුලස් පෙදෙස අතර බිම්කඩක (Plot between Torrington Avenue & Bullers Place) බර්තා බාවා (Bertha Bawa) උදෙසා සැලසුම්ගත වූ නිවස. පසුකලෙක ඉමහත් ප්‍රසිද්ධියට පත්වූ ජෙෆ්රි බාවා වාස්තු විද්‍යාඥයාගේ මව සඳහා මෙලෙස නිර්මාණය

වූ නිවස එවකට ප්‍රචලිතව පැවති අධිරාජ්‍යවාදී බංගලා (Colonial Bungalow) වර්ගයට අයත් විය. මෙය P.W.D. බංගලාවන්ට පෙර යුගයේ පැවැති එතරම් සුවිශේෂී නොවූ ගොඩනැඟිල්ලක් යැයි පැවසීම වඩා නිවැරදිය. ඩේවිඩ් රොබිසන් (David Robson) ඔහුගේ Geofferey Bawa: The Complete Works යන (2002) බාවාගේ චරිතාපදානයෙහි (Autobiography) සඳහන් කරන්නේ, මෙම නිවසේ අභ්‍යන්තර අවකාශ නිර්මාණය සඳහා බාවාගේද යම් දායකත්වයක් ලැබුණු බවයි. ක්ලුනි (Cluni) නමින් හැඳින්වුණු මෙම බංගලාවේ යම් තරමකට ආර්ට් ඩෙකෝ (Art Deco) ඌරුවක්ද පැවති බව ඔහුගේ අදහසයි. 1946 වසරේ ජෙෆ්රි බාවා මෙය ඉයන් පීරිස් නම් ව්‍යාපාරිකයෙකු හට විකිණූ අතර වර්තමානය වනවිට අයිතිවාසිකම් හුවමාරු කිහිපයකට පසුව, වෙනස්කම් රාශියකට භාජනය වීමෙන් අනතුරුව ඕලන්ද මහ කොමසාරිස් කාර්යාලය ලෙස භාවිතයේ පවතියි. මීට අමතරව එතුමා අතින් බිහිවූ වෙනත් නිවාස සොයාගැනීම අපහසු වේ. මෙමගින් නිගමනය කල හැක්කේ, ඔලිවර් වීරසිංහයන් අතින් “ලාංකික නිවසට” එතරම් මෙහෙයක් නොවූ බවයි. කෙසේ වෙතත් බර්තා බාවාගේ වාස්තු විද්‍යාඥයන් තේරීමේ ව්‍යායාමයෙන් පසක් වන්නේ 1930-40 දශකය වනවිටද ශ්‍රී ලාංකික සමාජයේ හිනිපෙත්තේ වැජඹුණු ප්‍රභූන් තම නිවාස නිර්මාණකරණය වාස්තු විද්‍යාඥයන් හට පමණක් භාරදුන් බවයි. තමා අපේක්ෂා කල නූතනත්වය තමා හට ලබාදිය හැකි නූතන අධ්‍යාපනික හා සංස්කෘතික දැනුම එවකට විසූ බ්‍රිතාන්‍ය මෙන්ම ලාංකික වාස්තු විද්‍යාඥයන්ටද පැවති බවට ඔවුන් විශ්වාස කරන්නට ඇත.

එමෙන්ම දිවයිනේ ප්‍රථම අගමැතිතුමා වන ඩී. එස්. සේනානායක මහතාගේ සංකල්පයක් මත නිත්‍ය නිදහස් අනුස්මරණයක් සඳහා ආකෘතියක් ලෙස ශාලාවක් ගොඩනැගීම සඳහා කමිටුවක් සම්මත වූ අතර ඊට නගර සැලසුම් ශිල්පී හා වාස්තු විද්‍යාඥ ඔලිවර් වීරසිංහ මහතාද ඇතුලත් විය. අනෙක් නිලධාරීන් අතර වාස්තු විද්‍යාඥයන් වූ ටී. එන්. වින් ජෝන්ස් (T. N. Wynne Jones), එෆ්. එච්. බිලිමෝරියා (F. H. Billimoria), ෂර්ලි ද අල්විස් (Shirley de Alwis), එච්. ජේ. බිලිමෝරියා (H. J. Billimoria) හා ජස්ටින් සමරසේකර යන අය වූහ. මෙම සමූහ නිර්මාණ ක්‍රියාවලිය තුළින් ශ්‍රී ලාංකීය අනන්‍යතාවය කැටිකරගත් නව නිපැයුමක් ලෙස කොළඹ නිදහස් චතුරශ්‍රය (Independence Square) බිහිවිය. එය මහනුවර දළදා මාලිගාවෙහි ඇති මඟුල් මඩුවෙහි කොන්ක්‍රීට් අකෘතියයි (Concrete Replica). එයද ලාංකීය සංස්කෘතිකමය ලක්ෂණ විදහා දක්වන එහෙත් ව්‍යාපමය වාස්තු විද්‍යාත්මක අංගයක් විය.

ඔලිවර් වීරසිංහ මහතා ක්‍රමයෙන් ශ්‍රී ලංකාවේ පිහිටුවන ලද ප්‍රථම නගර හා ග්‍රාම සැලසුම් දෙපාර්තමේන්තුවේ (Department of Town and Country Planning) ප්‍රධානියා බවට පත්වූයේය. 1950 වර්ශවලදී එතුමා නිවාස සංවර්ධන සම්බන්ධ අධ්‍යන කටයුතු භාර කමිටුවක ප්‍රධානත්වයට පත්වූ අතර එම කමිටුව මගින් ලබාගත් නිර්දේශ ඔස්සේ 1954 වසරේදී ලංකාවේ නිවාස කටයුතු අමාත්‍යංශයක් (Ministry for Housing) බිහිවිය. එතුමාගේ දැනුම, අත්දැකීම්, තනතුරු හා වගකීම් දැරීමෙන් ලත් පන්නරය හේතුවෙන් එතුමා 1971-1993 කාල වකවානුව තුලදී ග්‍රාමීය සංවර්ධනය (Urban Development) සම්බන්ධ උපදේශකවරයෙකු (Advisor) වශයෙන් එක්සත් ජාතීන්ගේ සංගමය මගින් බඳවා ගන්නා ලදී. එහිදී මැදපෙරදිග, අප්‍රිකාව හා කැරිබියන් දූපත්වල මද්‍යස්ථාන රාශියකට ඔහු තම දායකත්වය ලබා දුන්නේය. 1974 වර්ෂයේ පටන් එතුමා එක්සත් ජාතීන්ගේ ප්‍රධාන සංවර්ධන උපදේශකවරයෙක් (Urban Development Consultant) ලෙස කටයුතු කළේය. එමෙන්ම පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ සැලසුම්කරණ කටයුතු වලදීද, කොළඹ නගරයේ කලාපිය සංවර්ධන ක්‍රියාවලිය තුලදීද ඔහු විශාල දායකත්වයක් ලබාදී තිබුණි. එතුමාගේ මෙවැනි සැලසුම් සහ සංකල්පයන් පසුකාලීනව කොළඹ නගරය ආශ්‍රිතව සැකසුණු ප්‍රගතිගාමී MRSP සහ CESMA වැනි නගර සැලසුම් සඳහාද නිතැතින්ම දායක වන්නට ඇත.

වාස්තු විද්‍යා හා නගර නිර්මාණකරණ කටයුතු වලට අමතරව ඔලිවර් වීරසිංහ මහතා ලේඛන කලාවේද නිරතවිය. එතුමා බුදුදහමට හා ශ්‍රී ලාංකීය සම්ප්‍රදායට දැක්වූ ගෞරවපූර්වක ඇල්ම, ලියන ලද ලිපි තුලින් පැහැදිලි වේ. එසේ ඔහු අතින් පලවූ ප්‍රකාශණ අතර Inaugural Address by the President of the CIA on 17 Sep 1957 (Silver Jubilee Souvenir SLIA-1982) හා The challenge of Washington: An Asian ambassador's memoirs, Sri Lanka (1976) යන ලේඛන විශේෂිත වේ.

මෙසේ ඉමහත් කීර්තියට පත් ඔලිවර් වීරසිංහ මහතා 1980 වර්ෂයේදී තමා අතින්ම නිර්මාණයට පත්වූ විහාරමහාදේවි උද්‍යානය තුලදීම හදිසියෙන්ම අභාවප්‍රාප්ත වීම දෛවෝපගත සිදුවීමකි. ඔහුගේ වියෝවෙන් පසු ඔහුගේ බිරිඳ ඔලිවර් වීරසිංහ නමින් පදනමක් පිහිටවූ අතර එයින් වාස්තුවිද්‍යා නගර නිර්මාණ ක්ෂේත්‍රයේ අධ්‍යයන කටයුතුවල යෙදෙන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට පොත්පත් ආදී දැනුම ලබාගැනීමේ පහසුකම් ඇති කලාය. ඔලිවර් වීරසිංහ මහතාගෙන් මෙරටට වූ සේවය ඉමහත් වූ අතර එය අනාගතයේදීද නිති අනුස්මරණයට හා ප්‍රශංසාවට ලක්වනු නොඅනුමානය. ■

*සටහන: වරලත් වාස්තුවිද්‍යාඥ, ආචාර්ය නිශාන් රසාංග විජේතුංග*

*පර්යේෂණ සහාය: මනෝරී ජයලත්*

# සරල අඩු වියදම්
# පසන් නිවස




බිම් සැළැස්ම




බිම් සැළැස්ම

වාස්තු විද්‍යාව යනු අහස සූරන ගොඩනැගිලි, සුවිසල් මහල් මන්දිර වල සිට කුඩා නිවහනක සැලසුම දක්වා ඒ ඒ මට්ටමට සරිලන ලෙස අවශ්‍ය වන නිර්මාණශීලී විධි ක්‍රම හා ප්‍රයෝගික භාවිතාවලින් සන්නද්ධ පුළුල් ක්ෂේත්‍රයක් බව තවමත් පොදු සමාජයට නිරාවරණය නොවූ සත්‍යයකි. එහෙයින් වාස්තු විද්‍යාව හා වාස්තු විද්‍යාඥයා යනු සුඛෝපභෝගී හා මිල අධික නිර්මාණයන් සඳහා පමණක්මය යන සාවද්‍ය මතය අප සමාජයේ මුල් බැසගෙන ඇත. එම ආකල්පමය අඩුව පුරවනු වස් ලංකාවේ ප්‍රකට වාස්තු විද්‍යාඥයන් විසින් සාමාන්‍ය පොදු මහජනතාව උදෙසා පිරිවැය අඩු නිර්මාණශීලී නිවාස අකෘති සංකල්පයන් ඉදිරිපත් කර ඇත්තේ යම් පර්යේෂණාත්මක අරමුණක්ද පෙරදැරිවමය. එම සංකල්පීය නිවාස අකෘති ඇසුරෙන් එම නිර්මාණකරුවන් විසින් පොදු ජනතාව උදෙසා යෝජනා කරනු ලබන වාස්තු විද්‍යා සංකල්ප විශ්ලේශනය කිරීම මෙම ලිපියේ මූලික අරමුණ වේ.

ඩී. එච්. විජේවර්ධන යනු අපේ රටේ සිටින ප්‍රවීණ වරලත් වාස්තු විද්‍යාඥයෙකි. එතුමන් විසින් ඉදිරිපත් කරන මෙම සැලසුම අනාගතයේදී පහසුවෙන් තවත් අවකාශ එකතුකර ගනිමින් පුළුල්කර ගැනීමේ හැකියාවෙන් යුක්තයි.

ප්‍රවීණ වරලත් වාස්තු විද්‍යාඥ මිෂෙල් ෆොන්සේකා විසින් පිරිවැය අඩු නිවාස සංකල්පය යටතේ ඉදිරිපත් කරන සැලසුම් දෙකම යුගල නිවාස ලෙස ඉදි කිරීමේ හැකියාවෙන් යුක්ත වීම ද විශේෂත්වයකි.

වරලත් වාස්තු විද්‍යාඥ සුදේශ් නනායක්කාර යනු නූතන ශ්‍රී ලාංකීය වාස්තු විද්‍යා ක්ෂේත්‍රය තුල මනා නිර්මාණශිලී නිර්මිතයන් එක් කළ ප්‍රකට වූ තරුණ නියෝජනයකි. ඔහු විසින් කුඩා පවුලක් සඳහා යෝජනා කරන නිවාස අකෘති දෙකක් පහත පෙන්නුම් කෙරේ.

මෙම නිවාස අකෘති සියල්ල සැලකිල්ලට ගැනීමේදී ඉදිරිපත් කිරීමේ විලාසයන් එකිනෙකට වෙනස් වුවද එකම ආකාරයේ පවුල් ඒකකයක අවශ්‍යතා හා සමපාතවන සමාන අවකාශයන් ගෙන් සමන්විත බව පහැදිලි වේ. පොදු අවකාශයක් වූ විසිත්ත කාමරය හා කෑම කාමරය, ප්‍රධාන නිදන කාමරය හා තවත් ළමුන්ගේ නිදන කාමරයක්, මුළුතැන්ගෙය, නාන කාමරය හා කුඩා ගබඩා කාමරයකින් යුතුව දරුවන් දෙදෙනෙකුගෙන් සමන්විත පවුලක ජීවන රටාවට සරිලන ලෙස නිර්මාණය කර ඇත.





එක නිවසක් අනෙකට වඩා සංකීර්ණ හෝ පැතිරුනු රටාව අනුව වෙනස් විය හැකි අතර එය එම කරුණින් නිවසේ වර්ග අඩි ප්‍රමාණය මෙන්ම ඉදිකිරීමට දැරිය යුතු පිරිවැයද ඒ හා සමානුපාතිකව විචලනය විය හැක. ඒ අනුව මේ නිදර්ශන මගින් එකම අවකාශීය අවශ්‍යතා වුවද එය අත්පත් කරගන්නා විධික්‍රමය අනුව පිරිවැය හා විශාලත්වය වෙනස්වන අයුරුද ඔප්පුකර පෙන්වයි.

එමෙන්ම මෙම ආකෘති දෙකටම පොදු අංගයන් ලෙස අඩුවියදම් නිවාස ඉදිකිරීම් පිලිබඳ විධික්‍රම හා වඩා සැපපහසු ජීවන රටාවකට ඔබින ක්‍රමෝපායන් පිළිබඳව පොදු යෝජනා රැසක් අධ්‍යයනය කළ හැක. එම පොදු අංග ලක්ෂණ ඇසුරෙන් සාමාන්‍ය ජන ජීවිතය වර්ණවත් කරන වාස්තු විද්‍යාත්මක සංකල්පීය හරයන් කුමක්ද යන්න සොයා බලා ආදර්ශයට ගත හැක.

## අවකාශ කලමනාකරණය

නිවසක් යනු පවුලක ජීවන අවශ්‍යතා සඳහා අවශ්‍ය වන අවකාශයන් පවුලේ ජීවන රටාවට අනුව පෙළගස්වන ලද අවස්ථාවකි. පොදුවේ ගත් කළ හතර දෙනෙකුගෙන් සමන්විත පවුලකට අවශ්‍ය වන අවම අවකාශීය අවශ්‍යතා මෙම නිවාස ආකෘති තුල සංගතව ඇත. එම අවකාශයන්ගේ ප්‍රමාණයන් මූලික අවශ්‍යතාව පිරිමහමින් අනවශ්‍ය පරිදි විස්තාරණය නොකරමින් සකසුරුවමින් භාවිතා කිරීම මගින් ඉදිකිරීම් පිරිවැය අවම කරගැනීම මෙහි ඇති මූලික ලක්ෂණයකි. විශේෂයෙන් විසිත්ත කාමරය හා කෑමකාමරය එකම පොදු අවකාශයක් වීම හා එය අවශ්‍යතාවයට සරිලන දිග පළලකින් යුතුවීම අනවශ්‍ය අවකාශ විස්ථාරයන් පාලනය කිරීමකි. තවද අනෙකුත් පුද්ගලික අවකාශයන් මනාව නිවසේ පොදු අවකාශයන් හා බද්ධ කරමින් අනවශ්‍ය කොරිඩෝ වැනි අවකාශ බිහිවීම පාලනයකර ඇත්තේ එම පුද්ගලික අවකාශයන්ගේ පුද්ගලිකත්වය ආරක්ෂා කරගනිමිනි. තවද නිවසේ පොදු අවකාශ ඉස්තෝප්පු වැනි අර්ධ සංවෘත අවකාශ හරහා බාහිර




බිම් සැළැස්ම



පරිසරය හා බද්ධ කිරීමෙන් එම අවකාශයන්ට නම්‍යශීලී බවක් එක් කර ඇත.

වරලත් වාස්තු විද්‍යාඥ මිෂෙල් ෆොන්සේකාගේ නිවාස සැලසුම් තුල කෑම කාමරය හා මුළුතැන් ගෙය එක්කර පොදු අවකාශයක් නිර්මාණය කිරීම තුළද අළුත් ජීවන රටාවක උපතකට මග පාදා ඇත. තවද මෙම අවකාශ පරිහරනය අළුත් කළමණාකරන රටාවකට ද මුල පුරණු පෙනෙන්නේ පවුලේ සම්බන්ධතාද ඒ හරහා ශක්තිමත් වන බැවිනි.

නිවාස තුල අවකාශ කළමණාකරනය මෙන්ම අද දවසේ ඉඩම්වල පවතින අධික මිල ගණන් හා සුදුසු ඉඩම් කට්ටියක් සොයා ගැනීමේ අපහසුව ආදි කරුණු සළකා බලන කල සකසුරුවම් ලෙස ඉඩම් පරිහරනයද ඉතා වැදගත් කරුණකි. වරලත් වාස්තු විද්‍යාඥ මිෂෙල් ෆොන්සේකා යෝජනා කරන ද්විත්ව නිවාස සංකල්පය අඩු ඉඩම් භාවිතයකින් වැඩි නිවාස ඒකක ප්‍රමාණයක් අඩු වියදමින් ඉදිකර ගත හැක. එකම පවුලේ උදවියට මෙවන් ද්විත්ව නිවාස ඉදිකිරීමෙන් සාමූහික ජීවිතයකටද මග පෙන්වනු ලැබේ.

## ආකෘතිය හා හැඩතල

මෙම නිවාස සැළසුම් දෙක අධ්‍යයනය කිරීමේදී මුලින්ම සරල සෘජුකෝණාශ්‍රාකාර හැඩය මූලික කරගෙන නිර්මාණය වී ඇතිබව පෙනේ. ඉදිකිරීම් පිරිවැය අඩු කිරීමට සරල ආකෘතියට ගොඩනැගිල්ල ඉදිකිරීම වඩා ඵලදායී විධික්‍රමයක් වන්නේ නිවසේ මූලික හැඩය අනුව නිවසේ පියස්ස කුමනාකාර වන්නේද යන්න තීරණය වන බැවිනි. මෙම සැලසුම් අධ්‍යනයේදී මූලික සෘජුකෝණාශ්‍රාකාර හැඩය අනුසාරයෙන් සරල දෙපල වහල නිර්මාණයට එකතුවී ඇති බවත් ඉන් නිවසේ සරල සුන්දරත්වයක් ඉපදී ඇති බවත් පෙනේ.

පොදුවේ අප අවට සමාජය හා නිර්මිත පරිසරයන් නිරීක්ෂණයේදී වහල යනු වඩා මෝස්තරකාරී හා වැඩි පල ගණනකින් වැඩි අලංකාරයක් නිවසට එකතුවේය යන වැරදි ආකල්පය දැකිය හැකිය. එහෙත් නිවසේ මූලික ආකෘතියෙන් උපදින සරල පියස්සක් මගින් නිවසට සරල සෞන්දර්යයක් එක්වනවා පමණක් නොව ඉදිකිරීම් පිරිවැය මෙන්ම නඩත්තු වියදමද අවම මට්ටමක පවත්වා ගතහැක.

## නිමාවන් හා අමුද්‍රව්‍ය භාවිතය

පොදු සමාජ මතයට අනුව බිත්ති කපරාදු කර සුදමැද හෝ පොටි ආලේප කර වර්ණ ගැන්වීම අත්‍යවශ්‍ය අංගයක් සේ සැලකේ. නමුත් වරලත් වාස්තු විද්‍යාඥ සුදේශ් නනායක්කාරගේ නිර්මාණ අධ්‍යනය කිරීමෙදී එම සාම්ප්‍රදායික රටාවෙන් පරිබාහිරව කපරාදු නොකල ගඩොල් බිත්තිද, අනෙක් නිවසේ තලන ලද මැටි බිත්තිද නිර්මාණකරු යෝජනා කරන්නේ පිරිවැය අඩු කරගනිමින් සුන්දර නිවසක් ගොඩ නගා ගත හැකි බැවිනි. එමගින් පරිසරයට වඩාත් බද්ධ වූ හා දේශගුණික තත්ත්වයන්ට වඩාත් සාර්ථකව මුහුණදිය හැකි නිර්මිත පරිසරයක්ද බිහිවන බවද කිවහැක.

දොර ජනෙල් සදහා දැව භාවිතා කල යුතුමය යන්නත් තවත් මුල්බැස ගත් වැරදි මතයකි. මෙම නිවාස ආකෘතිවලදී ජනෙල් ඇලූමිනියම් වලින් සැකසීම මෙන්ම විසිත්ත කාමරයේ ප්‍රධාන දොර දෙපස යකඩ ග්‍රීල්ද භවිතා කර ඇත. දැව භාවිතය අවම කිරීම මගින් ඉදිකිරීම් පිරිවැය මෙන්ම පරිසර හිතකාමී ඉදිකිරීමක්ද සිදුවනුයේ දැව යනු අද දවසේ පාරිසරික ගැටළුවක් දක්වා වර්ධනය වූ අමුද්‍රයක් වන බැවිනි.

වහලයක් ඇතුලතින් ආවරණය කරමින් සිවිලිමක් නිර්මාණය කල යුතුමද? නැත. මනා නිමාවකින් හා කිසියම් රටාවකට යොදා ගත් වහලක දැවමුවා රාමුවම උද්දීපනය කරමින් මෙම නිවාස සැලසුම් තුල අලංකාර පෙනුමක් එක්කර ඇත්තේ සිවිලිමකට වියදම් වන අධික පිරිවැය මුළුමනින්ම අහෝසි කරමිනි.




බිම් සැළැස්ම

**පොදුවේ අප අවට සමාජය හා නිර්මිත පරිසරයන් නිරීක්ෂණයේදී වහල යනු වඩා මෝස්තරකාරී හා වැඩි පල ගණනකින් වැඩි අලංකාරයක් නිවසට එකතුවේය යන වැරදි ආකල්පය දැකිය හැකිය. එහෙත් නිවසේ මූලික ආකෘතියෙන් උපදින සරල පියස්සක් මගින් නිවසට සරල සෞන්දර්යයක් එක්වනවා පමණක් නොව ඉදිකිරීම් පිරිවැය මෙන්ම නඩත්තු වියදමද අවම මට්ටමක පවත්වා ගතහැක**



## වාතාශ්‍රය සහ ස්වාභාවික ආලෝක කලමණාකරනය

අව් වැසි සුලං ආදී ස්වාභාවික තත්වයන්ගෙන් ආරක්ෂිතව පවුලකට දිවිගෙවිය හැකි අවකාශයක් නිර්මාණය කිරීම නිවසක් ඉදිකිරීමේ මූලික අරමුණකි. එනමුත් එම ස්වභාවික පාරිසරික තත්වයන්ගෙන් ආරක්ෂා වෙනවා මෙන්ම මුළුමනින්ම පාරිසරික තත්වයන් ගෙන් වියුක්තව සැපපහසු නිර්මිත පරිසරයක් නිර්මාණය කරගත නොහැකිය. එබැවින් නිවැරදි හා සාධනීය ලෙස එම පාරිසරික සාධක උපයෝග කර ගැනීම හා පාලනය කිරීම මනා වාස්තු විද්‍යාත්මක ලක්ෂණයකි.

අප අධ්‍යයනය කරනු ලබන නිවාස සැලසුම්වලට අදාලව සැලකීමේදී මනා වාතාශ්‍රයක් ගෙතුලට රැගෙන ඒමට ඉවහල් වන ලෙස දොර ජනෙල් ස්ථාපනය කර ඇති අයුරු දැක ගත හැකිය. විශේෂයෙන් සැලසුම් කිරීමේදී විසිත්ත කාමරය ප්‍රමුඛ පොදු අවකාශ දෙපසින්ම අවට පරිසරයට විවෘත කරමින් මනා ලෙස ස්වාභාවික වාතාශ්‍රයක් ගෙතුලට ගැනීමට කටයුතු යොදා ඇත.

තවද මෙය ක්‍රමානුකූලව ස්ථානගත කර ඇති දොර ජනෙල් මගින් හිරු එළිය දහවල් කාලයේදී ප්‍රමාණවත් පරිදි ඇතුලත අවකාශ වලට පැමිණීමෙන් සුවපහසු හා විදුලි බුබුළු දැල්වීමෙන් තොරව එදිනෙදා කටයුතු කරගැනීමේ පහසුවද ළඟාවේ.

රත්වූ වායු ධාරා ඉහලට ගමන් කිරීම සාමනය ස්වභාවය වේ. එහෙයින් නිවස තුල මනා සුවපහසු උෂ්ණත්වයකින් යුතු පරිසරයක් නිර්මාණය සඳහා නිවස තුළ ගොඩනැගෙන රත්වූ වායු ධාරා නිවසේ ඉහල ස්ථානයකින් පිටතට ගමන් කිරීමට සැලැස්විය යුතුය. එම මූලධර්මය අනුව යමින් මෙම නිවාස වල මුදුන් බිත්ති වල වැඩි වියදමකින් තොරව සකසන ලද බිත්ති කුහර, වා කවුළු ලෙස යොදා ඇත. තවද සිවිලිමකින් තොරව නිවසේ අවකාශ වහල මට්ටම තෙක් පැතිරෙන බැවින් නිතැතින්ම සෑම කාමරයකම අවකාශිය පරිමාව වැඩි වීමෙන් සැපපහසු වටපිටාවක් උෂ්ණත්වය පාලනය මගින් ළඟාකර දිය හැක.

නිවසක පිරිවැය ගැන සැලකීමේදී අප නිරන්තර අවධානය යොමු කරන්නේ ඉදිකිරීමට යන වියදම පිළිබඳවයි. එහෙත් නිවාස පරිහරණයේදී අවම පිරිවැයකින් අවශ්‍ය සැපපහසුව ළඟා කරගැනීමට මෙම ස්වභාවික ආලෝකය හා වාතාශ්‍රය ක්‍රමවත්ව පාලනය කිරීමට ඉවහල් වන්නේ අඩු විදුලි පරිභෝජනයකින් වියදම් තත්ත්වය පාලනය කරන බැවිනි.

අප අවට සමාජය නිරීක්ෂණය කිරීමේදී බොහෝ අය තමාට නොගැලපෙන විශාල නිවාස තම ජීවිතය පුරා ටිකෙන් ටික ගොඩ නගමින් ණය බරින් පීඩිතව තම සාරවත් ජීවිත කාලය අපතේ හරිනු දැකිය හැකිය. එහෙත් ඉහත සඳහන් කරුණු අධ්‍යනය කිරීමේදී වරලත් වාස්තු විද්‍යාඥයන් විසින් මෙවන් සමාජයක් උදෙසා යෝජනා කරන වාස්තු විද්‍යාත්මක සංකල්පයන්හි මූලික හරයක් මතු කරගත හැකිය. එනම් වඩා සුවපහසු අඩු වියදම් මෙන්ම වාස්තු විද්‍යාත්මකව නිර්මිත සොඳුරු පරිසරයක් බිහිකර ගැනීම සඳහා අප මුළු මහත් සමාජයම ආකල්පමය වෙනසකට සූදානම් විය යුතු බවයි. එනම් නිවාස හා ජීවිතය පිළිබඳව එළඹගෙන සිටින සාම්ප්‍රදායික සිතුවිලි ලෝකයෙන් අත්මිදිය යුතු බවයි.

අංග සම්පූර්ණව ඉදිවූ තම ආර්ථික වට පිටාවට ගැලපෙන සේ නිර්මාණය වූ සොඳුරු නිවසක ආරම්භයක් සඳහා මෙයින් අත්වැලක් සැපයෙනු ඇත.■

*සටහන - වරලත් වාස්තු විද්‍යාඥ සුසන්ත මුණමල්පේ*

# ජාතික වාස්තු විද්‍යා සම්මන්ත්‍රණය




ශ්‍රී ලංකා වාස්තු විද්‍යා ආයතනයේ 35 වැනි සැසිවාරය සහ සම්මන්ත්‍රණය බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේදී වාස්තු විද්‍යා ක්ෂේත්‍රයට මෙහෙවරක් සිදු කොට ඇති දේශීය සහ විදේශීය ආරාධිත වාස්තු විද්‍යාඥයන් විසින් පවත්වන්නට යෙදුනි. මෙහිදී මුඛ්‍ය දේශනයට අමතරව තවත් දේශන මාලාවක් වාස්තු විද්‍යාවේ ප්‍රජා නියෝජනය "Architecture to represent people and place" යන මාතෘකාව යටතේ සාකච්ඡා කරනු ලැබීය. මෙම දේශනයන්ට අමතරව මෙරට ඉදිකිරීම් කර්මාන්තයට සහ ජාතික ප්‍රතිපත්ති මූල්‍යය කළමණාකරණය සඳහා සෘජුවම සම්බන්ධ ප්‍රවීණ දේශපාලඥයෙකු විසින්ද සම්මන්ත්‍රණය විචිත්‍රවත් කළ අතර දිවයිනෙහි වාස්තු විද්‍යා පාසැල් දෙකෙහිම ශිෂ්‍යන් ද ඔවුන්ගේ නිර්මාණ ඉදිරිපත් කිරීම සිදු කළෝය.

# 35-A18









මෙවර සම්මන්ත්‍රණයේ සභාපතිත්වය දැරූ වරලත් වාස්තු විද්‍යාඥ මිගාර අල්විස්ගේ සහභාගීත්වයෙන් සහ සංගමයේ සභාපති වාස්තු විද්‍යාඥා ඩී. එච්. විජේවර්ධන මහතාගේ අධීක්ෂණය යටතේ මෙම සම්මන්ත්‍රණය පෙබරවාරි 22 දිනය පුරා පැවැත්විණි. මෙම සම්මන්ත්‍රණයේ මුඛ්‍ය දේශනය සඳහා චීන ජාතික වාස්තු විද්‍යාඥ මාහාචාර්ය ලී සියාඕ ඩොං මහතාත් දෙවැනි මුඛ්‍යය දේශනය සඳහා මැලේසියානු ජාතික වාස්තු විද්‍යාඥ සෙරීනා හිජාස් මහත්මියගේ දේශනයත් සමගින් සමුළුව අතිඋත්කර්ෂවත් ආකාරයෙන් ආරම්භවිනි. වරලත් වාස්තු විද්‍යා ආයතනයේ ජාතික සම්මන්ත්‍රණ කමිටුවේ ආරාධනය පරිදි ශ්‍රී ලංකා වත්මන් ජනාධිපති ගරු මෛත්‍රීපාල සිරිසේන මහතාත් නිවාස හා සංවර්ධන ඇමති ගරු සජිත් ප්‍රේමදාස මහතාත් යන දෙපළම මෙම අවස්ථාවට සහභාගී වීම ඉතා සුවිශේෂී සිද්ධියක් විය.







චින ජාතික වාස්තු විද්‍යාඥ ලී මහතා, ඔහු විසින් නිර්මාණය කරන ලද ස්ථාන සහ ඒවාට පදනම වූ මූලාශ්‍රයන් ද එම නිර්මාණ සිදු කරන ලද ස්ථානය අනුව ඒවා නොයෙක් ආකාරයන්ගෙන් රස විඳිය හැකි බවත් උදාහරණ සහිතව පෙන්වා දුන්නාය. ලී මහතා චින සමූහාණ්ඩුවේ වෙනස්වීමත් සමගම වාස්තු විද්‍යාව සහ එහි සංස්කෘතිය නවීන විද්‍යාවේ නවතම සංකල්පයන් හරහා ඔවුනට සරිලන අයුරින් ගලපා ගැනීම සහ එහි ඇති කාලීන සමාජ කථිකාව දීර්ඝව සාකච්ඡා කළේය. චීනයේ ඇති ඔහු විසින් නිර්මාණය කරන ලද පුස්තකාල සංකීර්ණය ස්වාභාවික පරිසරය සමග සුසංයෝගීව භාවිතා වන අයුරු සහ වසරේ ඍතු හතර තුළදී ගත් ඡායාරූප මගින් ඉතා අලංකාරව සභාගත කෙරුණි. මෙහිදී අමුද්‍රව්‍යය භාවිතය, ස්ථානීය අන්තර් සම්බන්ධතා, පරිසර වෙනස්වීමට අනුව වාස්තු නිර්මාණය හැඩගැසෙන අයුරුත් භාවිතා කරන්නන් එහි අවකාශ විඳගන්නා අයුරුත් රූප රාමු ආශ්‍රයෙන් මනාව පැහැදිලි කරන ලදි.












සෙරීනා හිජාස් වාස්තු විද්‍යාඥවරිය මලයාසියාවේ ඉතා විශාල ව්‍යාපෘති මෙහෙයවා ඇති අතර ඇයගේ වාස්තු සංකල්පයන් ස්වභාවධර්මයෙන් උකහා ගන්නා ආකාරය මොනවට පැහැදිලි කරමින් ඒ හරහා හරිත ගොඩනැගිලි නිර්මාණකරණය දක්වාම ගැඹුරින් සාකච්ඡා කළාය. ඇය විසින් පෙරදිග ලෝකයේ භාවිතා කරන ලද වාස්තු විද්‍යා ශිල්පීය ක්‍රම සහ විධික්‍රම අධ්‍යනය තුළින් හරිතවේදී නිර්මාණ සඳහා දායකත්වය ලබා ගැනීම ද සාකච්ඡා කෙරුණි.

විශ්වවිද්‍යාල පරිශ්‍රයක් සඳහා ඇය විසින් නිර්මාණය කරන ලද හරිත ගොඩනැගිල්ල සහ එහි පදනම ද මෙහිදී සාකච්ඡා කළාය. සෙරීනා විසින් නිර්මාණය කරන ලද එක්ස්පෝ ගොඩනැගිල්ල සඳහා භාවිතා කළ සංකල්පය, එම පරිසරයෙන්ම උකහා ගත් අයුරුත් ඒ සඳහා සම්පූර්ණයෙන්ම දේශීය අමුද්‍රව්‍ය යොදා ගැනීමත් නිසා එහි ඇති කාබන් පා සළකුණට සිදුවන බලපෑම (Impact to the Carban footprint) පිළිබඳව ද සාකච්ඡා කළාය.




















ශ්‍රී ලාංකික වාස්තු විද්‍යාඥයෙකු වු පිලිප් වීරරත්න මහතා (PWA ආයතනය) ලොව සුපතල වාස්තු විද්‍යාඥයින් වන ජපන් ජාතික තදාඕ අන්දෝ (Thadao Ando) ෂිගෙරු බාන් (Shigeru Ban) සහ සිංගප්පූරු වාස්තු විද්‍යාඥ සමාගමක් වන WATG සමගත් එකතුව අගනා වාස්තු නිර්මාණ බිහිකර ඇති අතර, PWA ආයතනය ශ්‍රී ලංකාව තුළ සහ ඉන් පිටත ඉන්දියාව, ඕමානය, ඕස්ට්‍රේලියාව, සිංග ප්පූරුව සහ මාලදිවයින් රාජ්‍ය තුලද වාස්තු විද්‍යා නිර්මාණ සිදු කොට තිබේ. පිලිප් විසින් සම්මන්ත්‍රණය සඳහා සාකච්ඡා කරනු ලැබුයේ පැරණි ස්ථානය සහ ඒවායෙහි ඇති පෞරාණික වටිනාකම මත නැවතත් එම ගොඩනැගිලි වලට ජීවය ලබාදීම සම්බන්ධවයි. මේ සඳහා ඇති අවස්ථාවන්, අධ්‍යනය කිරීම්, අනුග්‍රාහකයින්ගේ මතය, සමාජ මතය සහ වාස්තු විද්‍යාඥයාගේ කාර්යභාර්යත් එහි ඇති දුෂ්කරභාවයත් අභිබවා ව්‍යාපෘතිය සඵල කරගන්නේ කෙසේද යන තේමාව ඔස්සේ ඔහුගේ දේශනය ඉදිරිපත් කරන ලදි. මෙවැනි වැඩසටහන් සඳහා වාස්තු විද්‍යාඥයින්ට ඇති බාධා පිළිබඳව ද ඔහු විසින් සාකච්ඡා කරනු ලැබීය. විශේෂයෙන්ම ගොඩනැගිලි නීතිරීතිවල බලපෑම මත යල්පැන ගිය එහෙත් ස්ථානීය වටිනාමක් ඇති ජාතික උරුම ගොඩනැගිලි නැවත පණ ගැන්වීමේදී ඇති බාධා පිළිබඳව ද ඔහු නිරාවරණයක් කරන ලදි. පිලිප් වීරරත්න ඔහු විසින් නිර්මාණය කර ඇති (මෙරට හො පිටරට) කිසිම නිර්මාණයක් ඔහුගේ සාකච්ඡාව සඳහා යොදා නොගැනීම ප්‍රේක්ෂකාගාරය බලාපොරොත්තු නොවූවක් විය.

තමා විසින් නිර්මාණය කොට ඇති විවිධ ඇගයීම්වලට ලක් වී ඇති ගොඩනැගිලි ලොවට දායාද කර දුන් ලාංකික වාස්තු විද්‍යාඥයින් දෙපලම ඔවුන්ගේ දේශන තුළදී තම නිර්මාණ හුවා දැක්වීම මෙවර සම්මන්ත්‍රණයේදි අත්හිටුවා තිබුණි.













වරලත් වාස්තු විද්‍යාඥ චන්න දාස්වත්තයන් (MICD ආයතනය) ශ්‍රී ලංකාව තුල පමණක් නොව ලොව විවිධ ප්‍රදේශයන්හි ඔවුන්ගේ නිර්මාණය සිදු කර ඇති ආයතනයකි. නමුත් "වාස්තු විද්‍යාව මිනිසුන් සහ ස්ථානය සඳහා" නමැති තේමාව නිර්දය ලෙසින් විවේචනය කරමින් ඉතා හරවත් දේශනයක් චන්න විසින් ඉදිරිපත් කළේ සම්පූර්ණ ප්‍රේක්ෂාගාරය සහ සිය විදේශ විද්වතුන් ඔහුගේ ශිෂ්‍යයන් කර ගනිමිනි. මේ සඳහා චන්න විසින් ඉදිරිපත් කල "ස්ථානයක් නොමැත" යන තේමාව යටතේ ඉතා විචිත්‍රවත් සහ සංවේගාත්මක වාග් ප්‍රහාරයකින් සියලුම වගකිව යුතු ආයතනයන් විවේචනයට භාජනය කරන ලදි.

අප රට සතු සියලුම අලංකාර ස්ථානයන් වෙළඳ ව්‍යාපාර දැන්වීම්කරුවන් විසින් ආයෝජනය කර ඇති බැව් සාධක සහිතව පෙන්වා දුන් අතර චන්නගේ ඊළඟ උත්සාහය වූයේ දැරිය හැකි සංවර්ධනය හා හරිත වාස්තු විප්ලවය, ස්වභාවික සම්පත් කළමණාකරනය සහ එහි නොකළමණාකරනය හරහා ජාතියකට සිදුවන විනාශය පෙන්වාදීමයි. මෙහිදී දාස්වත්ත සතු දේශන මෙහෙයවීම් නිපුනතා සියල්ල අවි ලෙස භාවිතයට ගනිමින් මතකයේ රැඳෙන ආකාරයේ දේශනයක් සිදු කරන ලදි. දර්ශනීය ස්ථාන වනසා දැමීම සහ අතිශය සීඝ්‍රයෙන් සංවර්ධනය කරා ගමන් කිරීම නොහොත්, නාගරිකරණය නොහොත්, කොන්ක්‍රීට් වනාන්තරය, නගර හා ග්‍රාම නිර්මාණය මුවාවෙන් සරුසාර හා අලංකාර බිම්පෙත් කෙලෙසීම, පවත්නා පරිසරය කෙළෙසා කෙසේ හෝ මඩි තර කර ගැනීම ගැන ද දීර්ඝ වශයෙන් කරුණු පෙන්වා දුනි.

මෙම නව ආරක් ගත් ඉදිරිපත් කිරීම මගින් මුලු මහත් ප්‍රේක්ෂකාගාරයම තමා වෙතට නතු කර ගැනීමට චන්න මෙහිදී සමත් විය.















දැනට WATC ආයතනයෙහි උප සභාපති ලෙස ක්‍රියා කරන සිංගප්පූරු වාස්තු විද්‍යාඥ ජින් කොයාමා (Jin Koyama) විසින් "මිනිසුන් සඳහා අර්ථාන්විත ස්ථාන" මැයෙන් තම වාස්තු විද්‍යා නිර්මාණ උපයෝගි කරගෙන දේශනයක් ඉදිරිපත් කරන ලදි. මේ සඳහා ඔහු WATC විසින් නිර්මාණය කරන්නට යෙදුනු ඉතා උසස් ගොඩනැගිලි සහ ඒවා ස්ථාන ගත කිරීම තුළින් වාස්තු විද්‍යාව හරහා සමාජයට හා එහි වාසය කරන්නන්ට භාවිතා කල හැකි ස්ථානයක් ව්‍යුත්පන්න කර ගන්නා ආකාරය හා එහි භාවිතාව ගැන දීර්ඝව සාකච්ඡා කරන ලදි.



අවසන් වශයෙන් තිලාන් විජේසිංහ මහතාගේ දේශනය තුළින් නව සංකල්පයක් වන රාජ්‍ය සහ පෞද්ගලික ව්‍යවසාය (Public & Private Partnership) යටතේ දැනට පවත්වා ගෙන යන ව්‍යාපෘතීන් හරහා වාස්තු විද්‍යාවේ ස්ථානය පිළිබඳව කෙටියෙන් විමසුමක් කළ ඔහු ඒ සඳහා ලංකාව තුළ සිදුවන විදේශීය ව්‍යාපෘතීන් උදාහරණ ලෙස ගන්නා ලදි.



දැනට ඉදිවෙමින් පවතින කොළඹ වරාය නගරය

ශ්‍රී ලංකා ජනරජයේ වත්මන් පාර්ලිමේන්තු මන්ත්‍රී, රජයේ මුදල් රාජ්‍ය අමාත්‍ය ඉරාන් වික්‍රමරත්න මහතා විසින් ලංකාවේ නව සංවර්ධන සහ එහි ඉලක්ක, කොළඹ වරාය නගරය ඉදිකිරීම, ඒ වටා ඇති යටිතල පහසුකම් සංවර්ධනය කිරීමත්, එමගින් අපි ලබන්නට යන්නා වූ දියුණුව මැයෙන් කාලීන මෙන්ම විද්‍යාත්මක දේශනයක් ඉදිරිපත් කළේ ඔහුගේ දේශපාලන සංකල්ප සහ අභිමතාර්ථයන්ගෙන් සම්පූර්ණයෙන්ම ඉවත් වූ මධ්‍යස්ථ මතදාරියකු ලෙසිනි. ■

**සටහන - වරලත් වාස්තු විද්‍යාඥ සුසිල් ලමාහේවා**



**වාස්තු විද්‍යාවේ ප්‍රජා නියෝජනය**

# අතේ ඇති මුදලට නිවසක්

## පළමු කොටස

"අතේ ඇති ගානට ගෙයක් හදා ගන්න අපිට බැරි ද?" යන්න, නව නිවසක සිහින දකින බොහෝ දෙනෙක්ගේ සිතේ තිබෙන ගැටලුවකි. පිලිතුර... ඔව්.. හැකියාව තිබෙනවා. ඒත් බොහෝ දෙනෙක් කාලයක් තිස්සේ ඉබි ගමනින් තමන්ගේ නිවාසයන් ඉදි කරමින් සිටිනු දකින්නට පුළුවන්. එවැනි නිවාස වල පසුබිම් කතාවට එබිකම් කර බැලූ විට එසේ වීමට හේතු වන කාරණා කිහිපයක් හඳුනා ගැනීමට හැකියි. ඒවා නම්,

01. තමන්ගේ අවශ්‍යතාවන් හා සීමාවන් නිවැරදිව හඳුනා නොගැනීම.
02. අඩු වියදම්, ඉදිකිරීමේ තාක්ෂණික ක්‍රමවේදයන් හා නිමාවන් පිළිබඳව පවතින නොදැනුවත්කම හෝ ඒවා නොසලකා හැරීම යන කරුණුය.

**අවශ්‍යතාවන් හා සීමාවන් නිවැරදිව හඳුනා ගැනීම.**

නිවැසියාගේ අවශ්‍යතාව අනුව නිර්මාණය කරන නිවාස සැලසුමේ වර්ග ප්‍රමාණය (ඉඩකඩ) යොදන නිමාවන් (Finishes) මත ඉදිකිරීම් පිරිවැය තීරණය වේ. අතේ ඇති මුදල සීමාවත්ම සැලසුම් කරන නිවසේ වර්ග ප්‍රමාණය (ඉඩකඩ) ඉතා ඵලදායීව, සීමාසහිතව නිර්මාණය කර ගැනීමට සිදු වේ. නිවසේ වර්ග ප්‍රමාණය වැඩිවත්ම ඊට සාපේක්ෂව ඉදිකිරීම් පිරිවැය ද වැඩිවනවා. අනවශ්‍ය ලෙස නිදන කාමර ගණන වැඩි කර ගැනීම, බොහෝ පිරිසක් සිදු කරනු ලබන වැරදීමක් වන අතර කාමර ගණන වැඩිවත්ම ඊට අදාල නාන කාමර, ප්‍රවේශ ශාලා (Lobby) ඉඩකඩ හා කොරිඩෝ සඳහා යන ඉඩකඩ නිරායාසයෙන්ම වැඩි වීමක් සිදුවන අතර බොහෝ සේවාදායකයින් තම නිවසේ ඇතැම් කාමර භාවිතා නොකරන අවස්ථාද දක්නට හැකි වේ. එමෙන්ම ඒවා හරිහැටි නඩත්තු කර ගැනීමට ඔවුනට කාලයක් නොමැති බව පවසන අවස්ථාද නිතර අසන්නට හා දකින්නට ලැබේ.

අදියර වශයෙන් නිමා කර ගත හැකි පරිදි නිවසේ සැලසුම නිර්මාණය කර ගැනීම මගින් තමන්ට අත්‍යාවශ්‍ය අදියර පළමුවද දෙවනුව ඉතිරි අදියරද සම්පූර්ණ කර ගත හැකිය. එහිදී මුල සිටම අදියර සංකල්පය සිතේ තබාගෙන නිවස නිර්මාණය කල යුතු වනවා. තම අවශ්‍යතාවය, වියදම් කල හැකි මුදල් ප්‍රමාණය හා ඉදිකිරීම නිමා කල යුතු කාල සීමාව ආදිය පිළිබඳව තම වාස්තු විද්‍යාඥයා දැනුවත් කිරීම හා ඔහු අතර එකඟතාවකට පැමිණීම මගින් පසුව ඉදිකිරීම් වලදී ඇතිවිය හැකි ගැටලු අවම කර ගැනීමට හැකියාව පවතිනවා.

**අඩුවියදම් තාක්ෂණික ක්‍රමවේද පිළිබඳව දැනුවත් වීම.**

සාම්ප්‍රදායිකව ලාංකිකයින් වර්තමානයේ පුරුදුව සිටිනුයේ පුලුස්සන ලද මැටි ගඩොල් හෝ සිමෙන්ති ගඩොල් යොදාගෙන, දැවමය සැකිල්ලක් හා උළු හෝ සෙවිලි තහඩු සෙවිලි කල වහලයක් සහිතව නිවාස ඉදිකිරීමටය. එහෙත් එයින් ඔබ්බට ගිය අඩු වියදම් නමුත් ඉහල නිමාවෙන් යුතු ගොඩනැගිලි අමුද්‍රව්‍ය හා ඉදිකිරීම් ක්‍රමවේද කෙරෙහි අවධානය යොමු වී ඇත්තේ ඉතා අවම වශයෙනි.

නිවසක ප්‍රධාන වශයෙන් බිත්ති, කොන්ක්‍රීට් තට්ටු (Slab), හා වහලය යන ප්‍රධාන අංගයන් සඳහා ඉදිකිරීම් පිරිවැය අවම කර ගැනීමට එම අමුද්‍රව්‍ය හා ක්‍රමවේද උපකාරී වේ.



සම්පීඩන මැටි ගඩොලක්



සම්පීඩන මැටි ගඩොල් බිත්ති

## බිත්ති

සම්පීඩිත මැටි ගඩොල් (CSEB - Compressed Stabilized Earth Blocks), සාම්ප්‍රදායික මැටි ගඩොල් වෙනුවට යොදාගත හැකි අඩු වියදම් විකල්පයකි. මෙම ගඩොල් නිපදවනු ලබන්නේ මැටි හා සිමෙන්ති අඩංගු මිශ්‍රණයක්, යන්ත්‍රයක් මගින් සම්පීඩනය කිරීම මගිනුයි. එහිදී ගඩොල් පිළිස්සීමක් සිදු නොකරන බැවින් මෙය පරිසර හිතකාමී ගොඩනැගිලි ද්‍රව්‍යයක් ලෙස හැඳින්විය හැක. මෙම ගඩොල් වලින් බිත්තිය බැඳීමට භාවිතා කරන්නේ සිමෙන්ති හා මැටි මිශ්‍ර බදාමයකි. මෙහිදී බිත්ති කපරාරු කිරීමට අවශ්‍ය නොවන නිසා කපරාරුව සඳහා යන වියදම ඉතිරි වන අතර උසස් නිමාවක්ද බිත්ති වලට ලැබේ. ස්වභාවික පස්වල පැහැති, මැටි වතුරින් විශේෂිතව පිළියල කර ගන්නා ද්‍රාවණයක් බිත්ති මත ආලේප කර, අවර්ණ වාර්නිෂ් වාර දෙකක් ගැල්වීම මගින් බිත්තිවල කල් පැවැත්ම වැඩි කර ගැනීම මෙන්ම ආවරණ අලේප පටලයක් නිර්මාණය කර ගැනීමේ හැකියාවක් ද ඇත. මෙම බිත්ති මගින් පිටත හිරු රශ්මිය නිවස තුලට කාන්දු වීම අවම කර නිවස ඇතුලත සිසිල් පරිසරයක් නිර්මාණය කරගැනීමට ද උපකාරි වේ.

"තලන ලද පස් බිත්ති" (Rammed Earth Walls), සාම්පදායික ගඩොල් බිත්ති සදහා තවත් අඩු වියදම් විකල්ප ඉදිරිපත් කිරීමේ ක්‍රමවේදයකි. මෙහිදී සියුම් දැලක ආදාරයෙන් හලාගත් මැටි සිමෙන්ති හා ජලය අඩංගු මිශ්‍රණයක් යොදා ගනු ලැබේ. එම මිශ්‍රණය විශේෂිතව පිළියෙල කල ලෝහමය රාමුවක් තුලට දමා නියමිත ප්‍රමාණයකට තැලීම සිදු කරනු ලබයි. මෙම ක්‍රමවේදයේදී සිනිඳු සහ ශක්තිමත් මතුපිටක් සහිත විවිධ රටාවන්ගෙන් යුතු බිත්තියක් නිමා කර ගත හැකිය. මෙම බිත්ති සඳහා ද කපරාරුවක් අවශ්‍ය නොවන බැවින් කපරාරුව සදහා යන වියදම ඉතිරි කර ගත හැක. මෙහිදී  පෙර මෙන්ම නිවස ඇතුලත සිසිල් පරිසරයක් නිර්මාණය කර ගැනීමට හැකි වනවා ඇත. මෙම කාර්යය සඳහා ගැලපෙන පස් පහසුවෙන් සපයාගත හැකි ප්‍රදේශ වලදී මෙය ඉතා ලාභදායී ක්‍රමවේදයක් වන අතර එහිදී වියදමක් දැරීමට සිදු වනුයේ ලෝහමය රාමුව තනා ගැනීමට සහ වැයවන ශ්‍රමය සඳහා පමණකි.

බිත්තිය ඉදි කිරීමට උපයෝගී කරගන්නා ලෝහ රාමුව



"තලන ලද පස් බිත්ති " (Rammed Earth walls)



## කොන්ක්‍රීට් තට්ටු (Slabs)

මහල් කිහිපයක් ඇති ගොඩනැගිලි වල කොන්ක්‍රීට් තට්ටු සඳහා සාමාන්‍යයෙන් අඟල් 4ක පමණ ඝනකමින් යුත් වැරගැන්වූ කොන්ක්‍රීට් භාවිත කෙරේ. අඩු වියදම් කොන්ක්‍රීට් තට්ටු ක්‍රමයේදී (Slab System), බිත්ති මත පෙර සවි ගැන්වූ බාල්ක (Precast Beam) තැන්පත් කරන අතර අඩි 2ක පරතර වලින් අඟල් 2 කොටු වලින් යුක්ත කම්බි දැලක් මත කොන්ක්‍රීට් තට්ටුව අතුරනු ලබයි. මෙම කොන්ක්‍රීට් තට්ටුව සාමාන්‍ය සාම්ප්‍රදායික ක්‍රමයේදී ඝනකම මෙන්ම අඩකි. මෙහිදී තට්ටුව (Shuttering) සඳහා ද යන පිරිවැය ඉතා අඩුය. වියදමින් 35%ක පමණ ඉතිරියක් මෙම අඩු වියදම් කොන්ට් තට්ටු ක්‍රමය මගින් ඉතිරි කර ගත හැකි වේ.

සම්පීඩිත මැටි ගඩොල් බිත්ති, තලන ලද පස් බිත්ති හා අඩු වියදම් කොන්ක්‍රීට් තට්ටු ක්‍රමය ආදී ක්‍රමවේදයන් භාවිතයේදී අවශ්‍ය වන තාක්ෂණික දැනුම ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයෙන් (NERDC) ලබා ගත හැක.

**තම අවශ්‍යයතා නිවැරදිව හඳුනාගෙන අඩු වියදම් ඉදිකිරීමේ ක්‍රමවේදයන් සහ සංකල්ප උපයෝගී කර ගන්නේ නම් ඉබි ගමනින් අවුරුදු ගණනාවක් පුරා ඉදිකරන නිවාසය වෙනුවට අතේ ඇති මුදලට සරිලන නිවසක් ඉදිකර ගැනීම තවදුරටත් ඔබට සිහිනයක් නොවනු ඇත.**

## වහලය

බාහිරව අහසට නිරාවරණය වන කොන්ක්‍රීට් පැතලි වහලයන් (Fat Roof) )භාවිතයේදී ඒවා ජල වාරක (Water Proofing) කිරීමට සැලකිය යුතු වියදමක් යන බැවින් කොන්ක්‍රීට් වහල භාවිතය අවම කර ගැනීම වැදගත්ය.

වහලයට උළු සෙවිලි කිරීමට බලාපොරොත්තු වන බොහෝ දෙනා සිතනුයේ නිවසට සිවිලිමක් අත්‍යවශය බවකි. එහෙත් වැඩි දියුණු කල මැටි හෝ සිමෙන්ති උළු සෙවිලි කරන අවස්ථාවන් වලදී සිවිලිමක් අත්‍යවශය නොවන අතර රීප්ප පරාල පිටතට නිරාවරණය වන පරිදි නිර්මාණාත්මකව වහලය සැලසුම් කිරීමේ හැකියාව පවති. එමගින් සිවිලිම සඳහා වන වියදම ඉතිරි කරගත හැකි වන අතර සිවිලිමක් නොයෙදෙනවා නම් වැඩි දියුණු කල මැටි උළු වලට වඩා සිමෙන්ති උළු වඩා යෝග්‍ය වෙයි.

තම අවශ්‍යයතා නිවැරදිව හඳුනාගෙන අඩු වියදම් ඉදිකිරීමේ ක්‍රමවේදයන් සහ සංකල්ප උපයෝගී කර ගන්නේ නම් ඉබි ගමනින් අවුරුදු ගණනාවක් පුරා ඉදිකරන නිවාසය වෙනුවට අතේ ඇති මුදලට සරිලන නිවසක් ඉදිකර ගැනීම තවදුරටත් ඔබට සිහිනයක් නොවනු ඇත.

අඩු වියදම් ඉදිකිරීමේ ක්‍රමවේදයන් හා සංකල්ප ප්‍රායෝගිකව භාවිතාවට යොදවමින් වාස්තු විද්‍යාඥයින් විසින් නිර්මාණය කරන ලද නිර්මාණ කිහිපයක් පිළිබඳව ඉදිරි වාස්තු කලාපයෙන් සාකච්ඡා කරමු. ■

**සටහන - වරලත් වාස්තු විද්‍යාඥ අනුක වෙත්තසිංහ**




**පළමු ක්‍රමය** **දෙවන ක්‍රමය**

**කොන්ක්‍රීට් තට්ටු ක්‍රම**

# අසන්න, දකින්න, විඳින්න අවකාශයේ නාටකීය අත්දැකීම

වේලාව රාත්‍රී 7.00 ට ආසන්නය. කොළඹ කුරුඳුවත්තෙහි පිහිටි, ලයනල් වෙන්ඩ්ට් රඟහල තුළ, අඩ අඳුරේ, නොඉවසිලිමත්ව, අප බලා සිටින්නේ, තවත් එක් සොඳුරු, ආනන්දනීය, හෝරා දෙකක, චමත්කාරය විඳින්නටය.

"කරුණාකර ඔබගේ සියලුම ජංගම දුරකථන විසංදි කරන්න. එසේම රංගනයට කුඩාදරුවන්ගෙන් බාධා නොවීමට වග බලා ගන්න. සොඳුරු රංගනයක චමත්කාරය විඳින්න".

මේ සුපුරුදු ආරාධනය, ලයනල් වෙන්ඩ්ට් රඟහල පරිපාලනයෙනි.

ඉතිං විවිධ සමාජතල හා වයස් කාණ්ඩ නියෝජනය කරන ප්‍රේක්ෂක අප සෑම, රඟහල තුල, සිතින් ඒකාත්මිකව, මේ ගෙවන්නේ කුතුහලය මුසු ඒ අවසන් තත්පර කිහිපයයි.

සෙමෙන් තිරය ඇරේ.

අහා, ඒ සොඳුරු ප්‍රථම දර්ශනය.

වේදිකාව පිටුපස, කලු පැහැයෙන් සැරසුනවාදක කණ්ඩායම අසුන්ගෙන සිටි. ඔවුන්ගෙන් නිකුත් වන්නේ මිහිරි බට නලා නාදයන්ය. මද්දල නාදයන්ය. බෙර හඬය. වයලීන නාදයන්ය. දකුනු පසින්, දෙපෙලට අසුන්ගෙන සිටින්නේ අත්වැල් ගායක ගායිකා කන්ඩායම්ය. මනරම් වර්ණවත් ඇඳුමින් සැරසි සෑජු කයින් යුතුව ඔවුන් අත්වැල් ගායනා සපයයි.

ඉතා ගාම්භීර ලෙස සැරසී, පුස්තකයද දෑතින් දරාගෙන, ගායනයට මුලු ආත්මයම ඒකාත්මික කොට, ප්‍රේක්ෂක ඔබ සැම නාටකය සමඟ ආරම්භයේ සිට අවසානය දක්වා ඇද බැඳ තබන්නේ වේදිකාව ඉදිරිපස දකුණු පසට වන්නට සිටින්න පොතේ ගුරුය. ඔහු වියපත්ය, නමුත් වියත්ය. ගාම්භීරය. සුදෝසුදු දිගැති රැවුලින් යුතුය. කරුණාබරය. සංයමයෙන් යුතුව, මධ්‍යස්ථව, ඔබට නාටක පෙල දිග හරියි. ඔබට රැගුම් නැරඹුමට ආරාධනා කරයි. එසේම විවිධ දර්ශනයන් වේදිකාව මත මැවීමට ඉඩහසර සලසයි. නාටකය හරහා ඔබව විවිධ ජීවන අත්දැකීම් ඔස්සේ රැගෙන යයි. විවිධ පරිසරයනට ඔබව යොමු කරයි. ඒ අතර ඔබව විවිධ රසයන්ගෙන් නහවයි. එසේම, එක් එක් දර්ශනය තුල ඒකාත්මික වන අතර, එම අවස්ථාවන් දෙස කුලුනු ගුණයෙන් යුක්තව, මධ්‍යස්ථව බැලීමට, ඔබට ආරාධනා කරයි.

උචිත නාට්‍යය සිතේ මවා ගෙන, නලු නිලියන් සිතේ මවා ගෙන, නාටක පිටපත ලියා, ඔවුන් පුහුණුකොට සියලු දර්ශනයන් පෙළගස්වා, උචිත ගීත, දෙබස්, සංගීතය එක්කොට, නාටකය වර්ණ ගන්වන්නා, නාට්‍ය නිෂ්පාදකවරයාය. මනමෙහි නම්, මහා ඇදුරිඳු සරත්චන්ද්‍රයන්ය. අතීත දැනුමින් පෝෂිත වූ, සියලු රසයන් කැටිවූ අනන්දනීය, මනරංජනීය, ජීවන අත්දැකීමක්, ඔබට නාට්‍ය නිර්මාණය හරහා තිළිණ කරන්නේ, නාට්‍ය නිෂ්පාදක හෙවත් නිර්මාතෘය.



*කරුණාබර වියත් ගාම්භිර පොතේ ගුරු ඔබට නාටක පෙල දිග හරියි.*



ගාල්ල ට්‍රයිටන් හෝටලය තුලින් පෙනෙන දර්ශනය

එසේම, එහිදී, නාටකය හරහා, විවිධ රසයෙන් ඔබ නහවමින්, සියුම්, එසේම තීව්‍ර හා අතිතීව්‍ර, ඔබ අභ්‍යන්තරය ප්‍රකම්පනයට පත්කරන, ආනන්දයෙන් ප්‍රඥාවට ඔබ ඔසවා තබන, සදාතනික අත්දැකීම් ඔබට තිළිණ කරයි.

ඉතින්, වාස්තු විද්‍යාඥයෙකු වන ඔබගේද කාර්යය එයම නොවේ ද?

ඔබ දීර්ඝ කාලිනව අධ්‍යයනය කල, පරිශීලනය කල, නැරඹූ, ඔබව ප්‍රකම්පනය කල, ඔබව ආනන්දයෙන් නැහැවූ, ඔබ හද තුල තැන්පත් වූ, වාස්තු විද්‍යාත්මක නිර්මාණ ගුරු කොට ගනිමින්, ඔබ පෙළින් පෙළ, වියන, අමුණන, වාස්තු විද්‍යාත්මක නිර්මාණයද එයට සමාන නොවන්නේද?

ඔබ මනසින් දකිමින්, කොළ කැබලිලක් මත කුරුටු ගාමින්, මදින් මද ගොඩනංවන නිර්මාණයද මුල, මැද, අග සපිරි, එය විඳින්නා තුල විවිධ අවකාශයන් තුලදී, (During Spatial Progression), විවිධ රසයන්ගෙන් සනසයි. නලවයි.

මෙහිදී, මහානාට්‍යවේදී සරත්චන්ද්‍රයන්ගේ සුන්දර නිර්මාණයන් සමඟ වේදිකාව මත පෙළහරපාන අතර, එයට සමගාමීව වාස්තු විද්‍යාඥ ජෙෆ්රි බාවා තම සුන්දර නිර්මාණ හරහා තම අත්දැකීම් ජනයාට තිළිණ කරයි.

මෙහිදී මෙම කලාකරුවන් හෙවත් නිර්මාණකරුවන් දෙපලම දෙආකාරයකින් එකම අත්දැකීම අපහට ලබාදේ. එනම් අප හද කම්පනය වන ආනන්දනීය භාවමය විඳීම්ය.

මෙහිදී මෙම නිර්මාණකරුවන් දෙපළ ඔවුනගේ නිර්මාණවල විවිධ අවස්ථා හෝ අවකාශ තුලින් අපට ලබාදෙන විවිධ අත්දැකීම් උදාහරණ සහිතව සියුම්ව විමසා බලමු.

ජෙෆ්රි බාවා විසින් නිර්මිත, ගාල්ල ට්‍රයිටන් හෝටලය තුලින් පෙනෙන මෙම මනරම් දර්ශනය දෙස බලන්න. එහි ඉදිරිපස ජල තටාක ඉමක් කොනක් නැති මහ සයුර හා ඒකාත්මික වී අප දෑස් අනන්තය කරා ගෙන යන අයුරු දකින්න.

හෝටලය නිර්මිත කණු හා අසල තුරුලතාද එම ජල තලය හා ඒකාත්මික වී ඔබ මහා සාගරය හා විශ්වයේ කොටසක් බවට පත්වන අයුරු විඳින්න.

ඉතින් මෙය නාටකීය අත්දැකීමක් නොවන්නේද?



ට්‍රයිටන් හෝටලය ඉදිරිපස ජල තටාක ඉමක් කොනක් නැති මහ සයුර හා ඒකාත්මික වී අප දෑස් අනන්තය කරා ගෙන යන අයුරු



කෙමෙන් රාත්‍රියට එළඹෙමින් සැඳෑසමය තුල ගිලී ඇති ස්භාවධර්මයේ සුන්දරත්වය හා ඒකාත්මික වූ නාටකීය අත්දැකීම



ගාල්ල ට්‍රයිටන් හෝටලය තුලින් පෙනෙන මෙම රාත්‍රී මනරම් දර්ශනය



ජෙෆ්රි බාවා විසින් නිර්මිත ගාල්ල ලයිට් හවුස් හෝටලයේ මුහුද අද්දර ඇති මෙම සරළ සුන්දර ස්ථාන සහ මෙම පරිසරය සමඟ මනා ලෙස වෙලී ගැලපී යන ගෘහභාණ්ඩ හා ස්ථානගත කිරීම දෙස බලන්න.

අනන්තය තෙක් විහිදුනු මනරම් දර්ශනය, ගල්පර සිප ගනිමින් රළ නඟන හඬ සහ ඔබට ඉහළින් ඇති පරක් තෙරක් නැති නිල්වන් අහස් ගැබ දෙස බලන්න, අසන්න, දකින්න, විඳින්න.

පරිසරය සමඟ ඒකාත්මික වී සිටින ඔබද මෙම විශ්වයේම සුන්දර නිර්මාණයක් වන අතර මේ අත්දැකීම විඳින ඔබ කෙතරම් වාසනාවන්ත ද?

ගාල්ල ලයිට් හවුස් හෝටලයේ මුහුද අද්දර ඇති සුන්දර ස්ථාන





ගාල්ල ලයිට් හවුස් හෝටලයේ මුහුද අද්දර ඇති පරිසරය



ගාල්ල ට්‍රයිටන් හෝටලයේ මුහුද අද්දර ඇති පරිසරය



වෙරළ අද්දර රාත්‍රිය එළඹෙත්ම...

ජෙෆ්රි බාවාගේ කොළඹ බගතලේ පාරේ පිහිටි නො -33 නිවසේ පිහිටි විසිත්ත කාමරයයි මේ.

එහි විවිධ භාණ්ඩ පෙළ ගැස්ම හා වර්ණ සංයෝජනය බිත්තියේ ඇති කලාත්මක කලාලයේ වර්ණ සමඟම මුලු පරිසරයම බැඳී වෙලි ඇති අයුරු විඳින්න.

එකිනෙක වෙන්කල නොහැකි ලෙස සියල්ල බැඳී නිර්මාණය වී ඇති පරිසරයේ චමත්කාරය සුන්දර නාටකීය අත්දැකිමක් නොවන්නේද?



බගතලේ පාරේ පිහිටි නො -33 නිවසේ පිහිටි මෙම විසිත්ත කාමරය



එකිනෙක වෙන්කල නොහැකි නිර්මිත පරිසරය





නාටකීය අත්දැකිමක් වූ වර්ණ සංයෝජනයට ගැළපෙන භාණ්ඩ පෙළගැස්ම

වාස්තු විද්‍යාඥයින් මෙන්ම නාට්‍ය නිර්මාණකරුවෝද එකම භූමිකාවක් රඟපායි.

ඒ, ප්‍රේක්ෂකයා හෝ ගෘහ නිර්මාණය විඳින්නන් හට, (Building Users) විවිධ නාට්‍ය ජවනිකා තුළින් හෝ, පෙළ ගස්වා ඇති විවිධ අවකාශ තුලින් සොඳුරු, ආනන්දනීය අත්දැකීම් ලබා දීමයි. අවකාශ හරහා මදින් මද ප්‍රකම්පනය කරමින් ගොස් එක් උච්ච ස්ථානයකට ළඟා කරවීමයි.

නැතහොත් අවකාශ අත්දැකීම් හරහා අති සුවිශේෂි ස්ථාන කිහිපයකට රැගෙන යාමය (More than one Climax /Series of Climaxes).

මෙම, සුවිශේෂි අවකාශ අත්දැකීම්, මනමේ තුළින් අත්විඳීමට, නැවතත් පොතේගුරු සමග නාට්‍ය තුලට පිවිසෙමු.

පොතේගුරුන්, මනමේ කුමරුට, වේදිකාවට පිවිසීමට ඇරයුම් කරයි. එසේම, ඔබටද, එම ජවනිකාවට පිවිසීමට ඇරයුම් කරයි.









වර්ණවත් වස්ත්‍රයෙන් සැරසුන කඩවසම් මනමේ කුමරුගේ කන්කලු මියුරු ගී නද හා මුසු වූ ගාම්භීර රංගනය

එහිදි, මනමේ කුමරිය, වේදිකාවට පැමිණේ. එයද සුවිශේෂී ආනන්දනීය දර්ශනයකි. ඇයගේ රැඟුම් ගැයුම්, වස්ත්‍රාභරණ, අංග රචනය, සියලු අභිනය එකට කැටුව ඉතා සුන්දර දසුනක් මවයි.

එය, ගොඩනැගිල්ලක් තුල පිහිටි, මනා ලෙස වර්ණ ගැන්වූ, ඉතාම සුන්දර ස්ථානයකට පැමිණියාක් මෙනි.





එනම් ගොඩනැගිල්ලක සුන්දර අවකාශයට රැගෙන යන නිමැවුම්කරුගේ මග පෙන්වන්නකු ලෙසිනි.

ගොඩනැගිල්ලක් තුලට ඇතුලු වී, එහි ආරම්භක, නිර්මිත අවකාශයක (Main Lobby), ඉඩකඩ, වර්ණාවලිය, විදුලි ආලෝකය, ගෘහභාණ්ඩ, වැනි හැඩතල හා එහි සුන්දර සුසංයෝගය මෙහිදි වේදිකාව මත දිස්වන දර්ශනය නොවේද?

එහිදි සුවිශේෂ ආලෝකකරණය, සංගීත නාදය, වර්ණවත් වස්ත්‍රයෙන් සැරසුන කඩවසම් මනමේ කුමරුගේ කන්කලු මියුරු ගී නද හා මුසු වූ ගාම්භීර රංගනය, ආදි සියල්ල සුසංයෝග වී, මනරම්, ආනන්දනීය, අත්දැකීමක් ලබා දේ.

වාස්තුවිද්‍යාඥයෙකු හෙවත් අවකාශ නිර්මාණ කරුවකු විසින් නිර්මිත සුන්දර ගොඩනැගිල්ලක, විවිධ අවකාශ අතර සැරිසරමින්, විවිධ රසයන් විඳින්නා සේ, මනමේ නාටකයේ ජවනිකා අත්දකිමින්, ප්‍රේක්ෂකයා ඉදිරියට යයි.



සුන්දර මනමේ කුමරියගේ කන්කලු මියුරු ගී නද හා මුසු වූ රංගනය



සුන්දර ප්‍රේමණීය මනමේ යුවළ

ඉන් පසු සියලු ශිල්පයෙන් පදවි ප්‍රාප්ත මනමේ කුමරුන් දිසාපාමොක් ඇදුරු හා සහෝදර සිසුන්ගෙන් සමුගැනීම, මනමේ කුමරු හට කුමරිය විවාහ කරදීම, කුමරුගේ රාජධානිය වන බරණැස් පුරයට පිටත්ව යාම.



මනමේ කුමරු හට කුමරිය විවාහ කරදීම



කුමරුගේ රාජධානිය වන බරණැස පුරයට පිටත්ව යාම





මනමේ යුවළ, වනයේ සුන්දරත්වය හා ප්‍රේමණීය හැඟුම් ඒකාත්මක වූ " ප්‍රේමයෙන් මන රංජිත වේ" ගීතය ගැයීම





මෙසේ සුන්දර අවකාශ තුළ සැරිසරමින් ගොස්, සුවිශේෂ වූ අවකාශයකට පිවිසෙන්නා සේ, මනමේ යුවළ කූටප්‍රාප්ත අවස්ථාවකට එළඹෙයි. එනම්, වනයේ සුන්දරත්වය හා ප්‍රේමණීය හැඟුම් ඒකාත්මක වූ "ප්‍රේමයෙන් මන රංජිත වේ" ගීතය ගැයීමයි. එය මන රංජිත දසුනකි.

නාටකයේ අත්දැකීම් පෙල හා සමගාමී වන ගොඩනැගිල්ලේ අවකාශ දෙස යොමු වෙමු.

බෙන්තොට හෝටලයේ ඊනා ඩි සිල්වා විසින් නිර්මිත අතිශයින් විස්තරාත්මක වර්ණවත් සහ මනරම් වූ සිලිම සහිත ස්ථානයට පිවිසීම වේදිකාවට පිවිසෙන සුලලිත සුන්දර වර්ණවත් මනමේ කුමරියගේ දර්ශනය යන අත්දැකීම් ද්විත්වයම, සමාන චමත්කාරයක් ඔබට ගෙන දෙනු ඇත.





බෙන්තොට හෝටලයේ ඇති සුවිශේෂ අතිශයින් විස්තරාත්මක වර්ණවත් මනරම් සිලිම...



සැදෑසමය තුල ගිලි ඇති, ස්භාවධර්මයේ සුන්දරත්වය හා ඒකාත්මිකවූ විදුලි ආලෝකයෙන් අලංකෘත කණ්ඩලම



කෙමෙන් රාත්‍රිය එළඹෙමින් සැදෑසමය තුල ගිලි ඇති, ස්භාවධර්මයේ සුන්දරත්වය හා ඒකාත්මිකවූ ගොඩනැගිලි සහිත විදුලි ආලෝකයෙන් අලංකෘත කණ්ඩලමෙහි මෙම මනරම් දර්ශනය මනමේ යුවල වනයෙහි සුන්දරත්වයෙන් වසඟ ප්‍රේමණීය හැඟුමින් නැහැවී ගයන, රඟන, “ප්‍රේමයෙන් මනරංපිත වේ, නන්දිත වේ” දර්ශනයෙන් ලබාදෙන ආනන්දය එකිනෙකට සමාන අත්දැකීමක් ගෙන නොදෙන්නේද?



කුතුහලය දනවන, සහමුලින්ම වෙනස් අවකාශයක අත්දැකීම විඳින්නා සේ, ප්‍රේක්ෂකයාගේ අවධානය ගුප්ත වනයෙන් එන බලාපොරොත්තු විරහිත අනතුරකට යොමු කරයි.

මෙතෙක් ආන්නද ජවනිකා සමඟ ඉදිරියට ආ ප්‍රේක්ෂකයා ඉදිරියේ බිහිසුණු අත්දැකීම තිව්‍ර කරමින්, හැඩි දැඩි, උඩඟු වැදි රජ, මුලු වේදිකාවම කළඹවමින් සම්ප්‍රාප්ත වේ.

එම ජවනිකාවට මනා ලෙස සරිලන සේ සංගීතය, ආලෝකකරණය වැදි රජුගේ වස්ත්‍රාභරණ, අංග රචනය, ගායනය, නර්තනය, එක්වී ත්‍රාසය කැටිවු විශ්මයෙන් ප්‍රකම්පනය කරවයි.

ගොඩනැගිල්ලක ඇති ඉතා සජීවි තද වර්ණාලේපිත විදුලි බුබුලින් ඒකාලෝකික, උච්ච සංගීතය සහිත ස්ථානයකට පිවිස ඔබට සංගීතයට අනුව රඟන්නට ආරාධනා කරනවා මෙන් ඔබගේ සියුම් සංවේදනා අමතනවා වෙනුවට ඔබගේ හදවත ප්‍රබල ලෙස ප්‍රකම්පනය කරමින් ඔබව දැඩි ලෙස සසල කරන කණ්ඩලම හෝටලයේ ඇති මෙම ගුප්ත එහෙත් සුන්දර ස්ථාන දෙස බලන්න.

එම ස්ථාන ඔබව සුන්දර ආනන්දනීය, චමත්කාරජනක අත්දැකීමකින් වෙලනවා වෙනුවට වඩාත් ගුප්ත රසයකින් ඔබව ප්‍රකම්පනය කරනු ඇත.

එහි ඇති අඳුරු රළු පරිසරය හා සුවිශේෂ ආලෝකකරණය, වර්ණ සංයෝජනය ආදි සියල්ල වැදි රජුගේ පැමිණිමෙන් ලබාදෙන ගුප්ත නාටකීය අත්දැකීමම ඔබට ලබා දෙනු ඇත.




*බිහුසුන පෙනුමැති, හැඩි දැඩි, උඩඟු වැදි රජ ඔබව, ත්‍රාසය කැටිවු විශ්මයෙන් ප්‍රකම්පනය කරවයි.*



*ගුප්ත වනයෙන් එන බලාපොරොත්තු විරහිත අනතුරකට මනමේ කුමරියගේ යොමු කරයි.*





*කණ්ඩලම හෝටලයේ ඇති මෙම අඳුරු රළු පරිසරය, සුවිශේෂ ආලෝකකරණය සහ වර්ණ සංයෝජනය අබියස ගුප්ත රසයකින් ඔබව කම්පනය කරයි.*





බිහුසුන පෙනුමැති, හැඩි දැඩි, උඩඟු වැදි රජුගේ ත්‍රාසය මුසු වූ රංගනය

වැදිරජ දර්ශන තලයට පිවිසි පසු නාටකයේ දිග හැරුම මුලු මනින්ම වෙනත් අතකට යොමුවේ.

මනමේ කුමරියගේ සුන්දරත්වය දැක ප්‍රේමයෙන් මුසපත්වන වැදිරජ, මනමේ කුමරුට ඇය මෙහි නවත්වා වනයෙන් වහාම පිටවන ලෙස අණකරයි.

මෙම අනපේක්ෂිත තත්ත්වයෙන් දැඩි ලෙස සසල වන සියලු ශිල්ප ශාස්ත්‍රයෙන් පාරප්‍රාප්ත මනමේ කුමරු, වැදිරජුට සටනට එන ලෙස අභියෝග කරයි.

තමාගේ සියලු දක්ෂතා පිළිබඳ මනා ආත්ම විශ්වාසයත්, මනමේ කුමරියට ඇති අති මහත් නිමල ආලයත් යන කරුණු මෙහිදී මනමේ කුමරුගේ නොසැලෙන අධිෂ්ඨානයට මහා පිටුවහලක් වෙයි.

පෙලින් පෙල, මනමේ රජු හා වැදි රජු අතර වාග් සංග්‍රාමය, ඉන්පසු ඔවුන්ගේ ත්‍රාස්යජනක සටන වේදිකාව මත දිගහැරේ.







අනපේක්ෂිත තත්ත්වයෙන් දැඩි ලෙස සසල වන මනමේ කුමරිය

වේදිකාව සසල කරමින්, කළඹවමින් මනමේ කුමරුන් හා වැදි රජු ද්වන්ධ සටනක නිරතවන අයුරු







සටනට සැරසුන, බිහිසුණු උඩඟු වැදි රජ

පෙලින් පෙල, මනමේ රජු හා වැදි රජු අතර ත්‍රාස ජනක සටන



එම අවස්ථාව කෙතරම් සජීවී හා බියකරු වුවද, ප්‍රබල රැඟුම සමඟම උච්ච ගායනයද ඉතා සමබරව, මනා සංයමයෙන් යුතුව ඉදිරිපත් වේ. එම දර්ශනය විශ්මය ජනකය. මන්ද වේදිකාව සසල කරමින්, කළඹවමින් මනමේ කුමරුන් හා වැදි රජු ද්වන්ධ සටනක නිරතවන අතරම ඔවුන්ගේ රංගනයේ රිද්මය හා ගායන රිද්මය අඛණ්ඩව පවත්වා ගනී. සියල්ල එකට සුසංයෝග වී පරිපූර්ණ දර්ශනයක් වේදිකාව මත මැවේ.

ගොඩනැගිල්ලක ඇති අවකාශය යොදා ගෙන ඇති අයුරු, එහි වර්ණ භාවිතය, නිමාවන්, ගෘහ භාණ්ඩ, ගෘහ අභ්‍යන්තර අලංකාරය, විදුලි ආලෝකයන් ආදිය මනා ලෙස ගැලපුනු, සංයෝග වූ අවස්ථාවකි ගාල්ල ලයිට් හවුස් හෝටලයේ ජෙෆ්රි බාවා හා ලකී සේනානායක විසින් නිර්මාණය කරන ලද අත්වැට. මෙහි පෙල ගස්වා ඇති විවිධ අවස්ථා ආලෝකකරණය සංකලනය වී ඔබට ලබාදෙන්නේ අලංකාර වූත් අනන්‍ය වූත් නාටකීය අත්දැකීමකි.

මෙයට සමාන්තරව සරත්චන්ද්‍රයන් මනමෙහි වැදිරජු හා මනමේ කුමරු අතර ද්වන්ද සටන පෙළගස්වා ඇති අයුරු සැසඳීමෙන් මෙය මනාව පැහැදිලි වේ.








මෙම අත්වැට තුළ පෙළ ගස්වා ඇති විවිධ අවස්ථා හා ආලෝකකරණය සංකලනය වී ඇති අයුරු





මනමේ කුමරු විසින් වැදි රජු පරාජය කරන අයුරු...



ඉන්පසු එළඹෙන්නේ මෙම නාටකයේ ප්‍රබලම උච්චතම අවස්ථාවයි.

මනමේ කුමරු විසින් පරාජයට පත් කරන ලද වැදි රජු, මනමේ කුමරුගේ අත්අඩංගුවේ සිටින අතර, මනමේ කුමරු ඔහු මැරීම සඳහා මනමේ කුමරිය අත ඇති කඩුව ඉල්ලා සිටී.

නමුත් මෙහිදී මනමේ කුමරිය පවසන "මේ වැදි රජු ශ්‍රේෂ්ඨ ගුණයෙන් යුතු පුද්ගලයෙක් බව පෙනේ. ඔහුට අභය දානය දුන මැනවි" යන වදන් පෙලින් මනමේ කුමරුන් මුලුමනින්ම චිත්ත වික්ෂේපියට පත්වන අතර, එසැනින් වැදි රජ කඩුව උදුරා කුමරු මරා දමයි.

මෙය නාටකයේ පළවන ප්‍රධාන උච්ච ස්ථානයයි.

යම් කිසි අවකාශ පෙලක් අත්දකිමින් පැමිණ, සුවිශේෂම වූ අවකාශයකට පිවිසි විට, අයෙකුට දැනෙන හැඟීම මෙන්, මෙයයි සුවිශේෂම අවකාශය යන හැඟීම් හිත දරා, සෙසු අවකාශ හෝ අවස්ථා පසු කරමින් යාම නාටකයකට මෙන්ම වාස්තු නිර්මාණයකටත් පොදුය.

මෙතැන් සිට නාටක පෙල වෙනත් මගක් ගෙන ඇත. මනමේ කුමරිය හා වැදි රජු වනයේ ඉදිරියට ඇදෙන අතර, මනමේ කුමරිය වැදි රජුට චෝදනා කරන්නේ මෙලෙසිනි.

"මා පිය සැමියා මරු මුව වැටුනා ඒ ඔබ දෝසා ඒ ඔබ දෝසා"

මෙහිදී, වැදි රජු එය ප්‍රතික්ෂේප කොට, ඔහු රුදු මරු සිය කැමැත්තෙන් වැළඳ ගත් බවත්, මනමේ කුමරියට ඇති තම අතිමහත් ආදරයත් ප්‍රකාශ කරයි.

මෙයද වෙනස් අවකාශ වින්දනයක අත් දැකීමක් ගෙන හැර පෙන්වයි.



මනමේ කුමරිය වැදි රජුට චෝදනා කරයි.



වැදි රජ, මනමේ කුමරියට ඇති තම අතිමහත් ආදරයත් ප්‍රකාශ කරයි



මා ඔබගේ දිවි බේරාගතිමි වැදි රජානනි, ඔබට ආලනුවුයේ නම් කුමකට එසේ කලේ දැයි සිතා බලනු යෙහෙකි..."



"මනමේ රජු ඔබ ගෙල සිඳලන්ටා... කඩුව ඉල්ලූ සඳ එය වලකන්ටා... කල තැන දුටුවද ඔහු ගලවන්ටා... සිතුනෙ කඩුව ඔබ අතටම දෙන්ටා...




ශෝකී රසය සැඟවුණු ගුප්ත සුන්දරත්වය

ජෙෆ්රි බාවා නිර්මාණ, ගැලරි කැෆේ ආපනශාලවේ ඇති මෙම ස්ථාන ගුප්ත බව මුසු වූ සුන්දරත්වය එකට වෙලී ගැලපී පරිසරය හා ඒකාත්මික වී මවා ඇති පූර්ණත්වය තුළින් චමත්කාරජනක අවකාශයක් මවා ඇත.

එහි තැවරී ඇති ශෝක රසය ද එසේම අපට මේ විශ්වය සමඟ ඒකාත්මිකවීමට හැකි මෙවැනි සොබාදහම හා වෙලී බැඳී ඇති ස්ථානයක සුන්දරත්වය මනමේ හි වඩාත් කැපී පෙනේ.

මනමේ කුමරුගේ රුදුරු මරණයෙන් පසු මනමේ නාටකය තුල තැවරී ඇති ශෝකී මෙන්ම ගුප්ත සුන්දරත්වය අප ග්‍රහණය කොට ගෙන ඇති ජීවිතයේ අනියත භාවය නිසා ඇතිවන චිත්ත භාවයන් මෙම ස්ථානවලදී ඔබව ස්පර්ශ කරනු ඇත.



ගුප්ත පරිසරයෙහි තැවරී ඇති ශෝක රසය...



ඉතාම වර්ණවත් මනරම් චමත්කාරජනක අවකාශයක් වෙනුවට මෙහි මවා ඇත්තේ සුන්දර වූත් ගුප්ත වූත් පරිසරයකි





අපට මේ විශ්වය සමඟ ඒකාත්මිකවීමට හැකි සොභාදහම හා වෙලී බැඳී ඇති පූර්ණත්වයේ සුන්දරත්වය





වැදි රජු සමග වනයේ තනිවන මනමේ කුමරිය



මා ඔබගේ දිවි බේරාගතිමි වැදි රජාණනි, ඔබට ආලනුවූයේ නම් කුමකට එසේ කලේ දැයි සිතා බලනු යෙහෙකි"



වැදි රජුට ගෙන එන කම්පනය විදුලි සැර පහරක් මෙනි.



ඉන්පසු එළඹෙන්නේ අනපේක්ෂිත මොහොතකි. එය තවත් ඉතාම උච්ච අවස්ථාවකි.

මෙලෙස වැදි රජු සමග තනිවන මනමේ කුමරිය, රුදුරු වනයේ ඇති ආගන්තුක, භයංකාරත්වය හමුවේ එකම පිළිසරණ ඔහු බැවින්දෝ, ඔහුට තම ලැදියාව පෙන්වීමට මෙලෙස පවසයි.

"මනමේ රජු ඔබ ගෙල සිඳලන්ටා...
කඩුව ඉල්ලු සඳ එය වළකන්ටා...
කල තැත දුටුවද ඔහු ගලවන්ටා...
සිතුනෙ කඩුව ඔබ අතටම දෙන්ටා...

මා ඔබගේ දිවි බේරාගතිමි වැදි රජාණෙනි, ඔබට ආලනුවූයේ නම් කුමකට එසේ කලේ දැයි සිතා බලනු යෙහෙකි"

මෙය නාටකයේ තවත් එක් උච්ච ස්ථානයකි.

මනමේ කුමරුගේ වියෝව ගැන සෝක වෙමින්, වැදි රජුට චෝදනා කරමින් සිටි කුමරිය, මෙලෙස වැදි රජුගේ ආදර වදන් වලින් මොහොතකට පසු මෙසේ කීවේ කෙසේද? ඇයගේ මනස විකල් වීද?

මෙය අයෙක් එක් අවකාශයකට පිවිසි පසු එය අවකාශයන්ගෙන් පරිපූර්ණම අවකාශය යයි සිතා ගත් කල මදවේලාවකින් තවත් ඊට නොදෙවෙනි අවකාශයක අත්දැකීමක් ලැබුවාක් මෙනි.

මෙලෙස තම විශ්වාසවන්ත භාවයත්, ආදරයත්, ප්‍රකාශකල කුමරියගේ වදන්, වැදි රජුට ගෙන එන කම්පනය විදුලි සැර පහරක් මෙනි. එය ඔහුගේ සැබෑ රුදුරු ස්වරයත්, ඔහුගේ අධිකම්පනයත් මෙලෙස එළිදක්වයි.

"මා දිනුවේ මාගේ දක්ෂකමින් මිස ඔබගේ උපකාරය නිසා බව නොදනිමි. ඔබ මනමේ කුමරුට කඩුව දීමට සැරසුනා මා දුටුවෙමි"

බලාපොරොත්තු විරහිත මෙම වදනින් අන්දමන්ද වන කුමරිය තවදුරටත් පවසන වදනින්, තත්ත්වය තවත් බිහිසුණු වේ.

"මා ඔබට කඩුව දීමට වඩාත් කැමැත්තෙන් සිටියෙමි. මා එය ඔබට දීමට පෙර ඔබ එය උදුරා ගත්තෙහිය."

මෙය, මෙම නාටකයේ තවත් අති උච්චස්ථානයකි.

මෙයින් වියරු වැටෙන වැදි රජ, "අමනගති ඇති මෙවැනි අඟනන්, මවැනියන් හට කුමන සරණද" ආදි ලෙස දැඩිලෙස පවසමින්, බිහිසුණු වේගවත් රැඟුමක්ද සමඟින්, මනමේ කුමරියට චෝදානා කරයි.



අමනගති ඇති මෙවැනි අඟනන්, මවැනියන් හට කුමන සරණද?




*අසරණ වූ කුමරිය; වැදි රජු, කුමරිය හට සියලු අපවාද කොට, ඇය වනයේ තනි කොට, නික්මයයි.*

මෙහිදී අසරණ වූ කුමරිය බලාපොරොත්තු වන ආදරය, පිළිසරණ, ආරක්ෂාව වෙනුවට ඇයට හිමිවන්නේ අනපේක්ෂිත, දැඩි පිළිකුල කැටිවූ ප්‍රතිචාරයකි.

එයින් නොනවතින වැදි රජු, කුමරිය හට සියලු අපවාද කොට, ඇය වනයේ තනි කොට, නික්මයයි.

එය නාටකයේ, තවත් එක් උච්ච ස්ථානයකි.

මෙසේ එකකට එකක් නොදෙවෙනි, උච්චස්ථාන රැසක් පසුකර, මනමේ නාටකය අවසානයට එළඹෙයි.

විය යුතු ලෙසම, මෙසේ භයංකාර රුදුරු වනයේ තනිවන කුමරිය, සිදුවූ සහ ප්‍රකාශ කල, සියලු දෙයට, මහත්සේ පසුතැවිලි වී, දැඩි කම්පනයෙන් මියයයි.

කණ්ඩලමෙහි ඇති මෙම අවකාශ තුළදී ඔබට හැඟෙන්නේ කුමක් ද? ඔබට දැනෙන්නේ කුමක් ද? ඔබට දැනෙන ශෝකීභාවමය හැඟීම හා තැවරී ඇත්තේ සුන්දර ශෝකී රසයක් නොවේද?

ඔබගේ සිත උද්දාමයෙන් ප්‍රබෝධයෙන් ප්‍රකම්පනය කරනවා වෙනුවට ඔබව වඩාත් අධ්‍යාත්මය තුළට යොමුකරන, ගුප්ත භාවයක් ඔබට නොහැඟේද?

වර්ණාවලිය, විදුලි ආලෝක හැඩතල, පසුබිම සියල්ල එකට වේලී කැටිවී ඔබගේ අධ්‍යාත්මය අමතනවා ඔබට නොදැනේද?

එයද මනමේ නාටකයේ පසුපෙල ශෝක, භාවමය අත්දැකීමට සම නොවේද?

මෙසේ මහත් වූ ශෝක රසයක් දනවමින් නාටකය නිමා වේ. පොතේ ගුරු මෙම සියල්ල දෙස උපේක්ෂාවෙන් නරඹන සේ අපට ආරාධනා කරයි.

එසේම අප විවිධ භාව ප්‍රකම්පන රසයන් විඳිමින්, ගතකල දෙහෝරාවකට වැඩි කාලයට සමු දෙමින්, සුවිශේෂ අත්දැකිමක් කැටිකොට ගෙන, රඟහලින් එළියට ඇදෙන්නෙමු.

නමුත්, අප යන්නේ, රගහලට ඇතුල් වූ තැනැත්තාට වඩා, පුළුල්, සියුම් දෘෂ්ඨි කෝණයන්ගෙන් ලෝකය දෙස බැලිය හැකි, ආනන්දයෙන් ප්‍රඥාවට ඔසවා තැබූ, වඩා සංවේදී පුද්ගලයන් ලෙසිනි.

එය සම වන්නේ, සුවිශේෂී වාස්තු විද්‍යාත්මක නිමැවුමකට හිමි, විවිධ අවකාශයන් පරිශීලනය කොට, එයින්, තමා වැසී තිබූ රස සංවේදතාවන් අවදි වී, එහි නිම්වලලු පුළුල් වී, රසඥතාවයන් එසවී, භාවයන් ප්‍රකම්පනය වී ජීවිත කාලයටම බලපාන සුවිශේෂී අත්දැකීමක් ලැබූ අයකුටය. ■

සටහන - වරලත් වාස්තු විද්‍යාඥ චානා සමරසිංහ



*කණ්ඩලමෙහි ඇති මෙම අවකාශ තුළදී දැනෙන ශෝකීභාවමය හැඟීම හා තැවරී ඇති සුන්දර ශෝකී රසය*



*සිත උද්දාමයෙන් ප්‍රබෝධයෙන් ප්‍රකම්පනය කරනවා වෙනුවට වඩාත් අධ්‍යාත්මය තුළට යොමුකරන, ගුප්ත භාවය*

# වටදාගේ

## වාස්තු විද්‍යා නිර්මාණ, ලක්ෂණ සහ කල්පිතයන්...

### වටදාගෙය යනු කුමක්ද?

වටදාගේ, ථූපඝරය, චේතියඝරය යන නම්වලින් මහාවංශයේ පූජාවලියේ සහ ඇතැම් අනෙකුත් ඓතිහාසික ග්‍රන්ථවල සඳහන් වන ගොඩනැගිලි මූලිකව හැඳින්වෙන්නේ ස්තූපයක් ප්‍රධාන කොට ඉදිකර ඇති ගෘහයකටය. වටදාගෙය ප්‍රධාන පූජනීය වස්තුව ස්තූපය වන අතර වහලයකින් ආවරණය කිරීමට හැකිවන පරිදි ස්තූපයේ ප්‍රමාණය (විශේෂයෙන්ම එහි උස) සීමා සහිත වීම විශේෂයකි. ස්තූපයට අමතරව, බොහෝවිට එය වටා විශේෂයෙන්ම සතර දිශාවන්ට මුහුණලා බුදු පිළිම, ආසන වැනි අනෙකුත් පූජනීය වස්තූන්ද වටදාගෙවල් තුල දැකිය හැක. ස්තූපය හා ඒක කේන්ද්‍රීය කුළුණු වළලු කිහිපයක් තිබීමට අමතරව වටදාගෙයි අනෙකුත් විශේෂත්වය වනුයේ ඒක කේන්ද්‍රීයව ඉදිකර ඇති වෘත්තාකාර බිත්තියයි. මෙමගින් සැදැහැවතුන්ට ආගමික වතාවන් හා භාවනා කිරීම සඳහා බාහිර පරිසරයෙන් වෙන්ම අභ්‍යන්තර අවකාශයක් නිර්මාණය වේ. තවද කුළුණු වලලු හේතුවෙන් ස්තූපය වටා පැදකුණු කිරීම සඳහා ප්‍රදක්ෂිණා පථද නිර්මාණය වී තිබීමද වැදගත් වේ. ඒක කේන්ද්‍රීය කුළුණු වළලු හා බිත්තිය මත රඳා සිටින වහලයේ සැලැස්මද වෘත්තාකාර හැඩයක් ගනු ලබයි.

නමුත් ගුහා තුල ස්ථාපනය කර ඇති (උදාහරණ වශයෙන් දඹුල්ලේ දෙවන හා හතරවන ලෙන් විහාර වල) ස්තූප හෝ අභ්‍යන්තර අවකාශයක් රහිත කුළුණු වලින් ඔසවාගෙන සිටින වහලයක් ඇති ස්තූප (උදාහරණ වශයෙන් මහනුවර ගඩලාදෙණියේ විජයෝත්පාය, දඹදෙණිය ස්තූප) වටදාගෙවල් වශයෙන් හඳුන්වනු නොලබන බව පැරණි ලේඛන අනුව පෙනේ. වහලයක් ඉදිකර ඇති මෙවැනි ස්තූප ගෘහයක්, කූටාඝර ලෙස හඳුන්වනු ලබන බැව් සිල්වා (2004) සඳහන් කරයි. මෙවැනි ගොඩනැගිලි වල වහලයේ සැලැස්ම බොහෝ විට සමචතුරස්‍රාකාර හැඩයක් ගනු ලබන අතර අට්ට වහලයක (hip roof) ලක්ෂණ ගනී.

ශ්‍රී ලංකාවේ දැනට නෂ්ටාවශේෂව දක්නට ලැබෙන මිහින්තලයේ අම්බස්ථල, අනුරාධපුරයේ ථූපාරාම හා ලංකාරාම, රාජාංගන, තිරියාය, මැදිරිගිරිය හා පොළොන්නරුවේ දළදා චතුරස්‍රයේ පිහිටි ස්තූපය වටදාගෙවල් වලට කදිම උදාහරණ සපයයි. මීට අමතරව ඩෙල්ෆ්ට් දූපතේ, තන්තරෝදෙයි, දෙවිනුවර, කවුඩුල්ල, ලාහුගල වැනි ස්ථාන වලද මෙවැනි ස්මාරක වල අවශේෂ ඇතත් ඒවා පිළිබඳ වැඩිදුර පුරාවිද්‍යා පර්යේෂණයන් සිදු කර නොමැත. මීට අමතරව ඓතිහාසික යුගයේ ඉදිකරන ලද නමුත් මෑත යුගයේ ප්‍රතිසංස්කරණය කර තවමත් ජීවමානව පවත්වාගෙන යනු ලබන අත්තනගල්ලේ වටදාගෙයද සුවිශේෂී උදාහරණයකි.

### කුළුණු පිළිබඳ මුල් යුගවල අදහස්

නෂ්ටාවශේෂව පවතින වටදාගෙවල් බැලූ බැල්මට ස්තූපයක් වටකොටගත් කුළුණු වලින් සමන්විත වීම හේතුවෙන් පැරණි ස්මාරක පිළිබඳ ගවේශණය කරන ලද මුල්ම විචාරකයින්ට මෙම කුළුණු වල කාර්යභාරය කුමක් වීද යන්න පිළිබඳ ගැටළුවක් වී ඇත. ඉන්දියාවේ හෝ වෙනත් බෞද්ධ රටවල ගැටළුවට පිළිතුරු සෙවීම දුෂ්කර කාර්යයක් වී ඇති අතර මේ පිළිබද විවිධ මත පළකර ඇත. ෆර්ගසන් (1876), බෞද්ධ ජාතක කතා සහිත තිර මෙම කුළුණු මත රැඳවූ බාල්ක වලින් එල්ලා තිබූ බවටත් ස්මිදර් (1893), පොල්තෙල් පහන් තැබීම සඳහා මෙන්ම බෞද්ධ සංකේත එල්ලීම සඳහා මෙම කුළුණු භාවිතා කල බවත් අනුමාන කර තිබේ. නමුත් වහලයක් දැමීම සඳහා මෙම කුළුණු යොදාගත් බවට මුලින්ම අදහස් පලකරන ලද අය අතර බෙල් (1908), ද බෙයිලි (1907), පාකර් (1909) (නමුත් පසුව ඔහු එම අදහස බැහැර කර වහලයක් නොමැති බවට තර්ක ඉදිරිපත් කර ඇත.), හෝකාට් (1928) අයත් වේ. නමුත් විවිධ සාහිත්‍ය මූලාශ්‍ර එකී ස්මාරක වල ශේෂ වී ඇති පුරාවිද්‍යා සාක්ෂි මෙන්ම ඉන්දියාවේ මුල් බෞද්ධ යුගයට අයත් ගුහා ආශ්‍රිත චෛත්‍ය ශාලා හා පැරණි කැටයම් අනුසාරයෙන් මෙම ගොඩනැගිලි විශේෂ ස්තූපයක් ආවරණය කිරීම සඳහා ඉදිකල නිර්මිත බැව් පරණවිතාන (1946) විසින් ඉතාමත් විද්‍යාත්මක හා සැක හැර ඔප්පුකර ඇත. ඉන්දියාවේ කාර්ලි ගුහා ආශ්‍රිත චෛත්‍ය ශාලා, බාර්හුත් (Bharhut) හී කැටයම් යනාදිය අනුව, ශ්‍රී ලංකාවේ වටදාගෙයි නිර්මාණය මුල් වස්තු බීජය ඉන්දියාවෙන් ලැබී ඇති බවට, පරණවිතාන ඇතුළු බොහෝ විද්වතුන් මත පළකර ඇත.





ථූපාරාම වටදාගෙයි නෂ්ටාවශේෂ



තිරියාය වටදාගෙයි ප්‍රාකාර හා වහලයේ කුරුපාව සඳහා ප්‍රාකාරයෙන් ඉදිරියට ප්‍රක්ෂේපණය වන තළාඳ දඬු

**ශ්‍රී ලංකාවේ දැනට නෂ්ටාවශේෂව දක්නට ලැබෙන මිහින්තලයේ අම්බස්ථල, අනුරාධපුරයේ ථූපාරාම හා ලංකාරාම, රාජාංගන, තිරියාය, මැදිරිගිරිය හා පොළොන්නරුවේ දළදා චතුරස්‍රයේ පිහිටි ස්තූපය වටදාගෙවල් වලට කදිම උදාහරණ සපයයි.**

## දැනට ශේෂ වී ඇති නිර්මාණ අංග

දැනට ශේෂ වී දක්නට ඇති පරිදි මෙම ගොඩනැගිලි විශේෂයේ, ස්තූපය උස් මළුවක මධ්‍යයේ ඉදිකර ඇත. ස්තූපය වටා වූ ඒක කේන්ද්‍රීය කළුගල් කුළුණු වල උස, වලල්ලෙන් වලල්ලට වෙනස් වේ. ස්තූපය ආසන්නයේ ඇති වලල්ලේ කුළුණු වල උස වැඩිම වන අතර ඊට දුරින්ම ඇති වලල්ලේ කුළුණු වල උස අවම වන පරිදි එක් එක් වලල්ලේ කුළුණු වල උස ක්‍රමයෙන් අඩුවේ. දැනට නෂ්ටාවශේෂ වී ඇති වටදාගෙවල් අතුරින් නිර්මාණ ලක්ෂණ බොහොමයක්ම ආරක්ෂා වී ඇත්තේ පොළොන්නරුවේ වටදාගෙයයි. එහි දක්නට ලැබෙන පරිදි ස්තූපයට දුරින්ම පිහිටි කුළුණු වලල්ලට මදක් අභ්‍යන්තරයෙන් ඝණකම වෘත්තාකාර ගඩොල් බිත්තියක්ද ඒක කේන්ද්‍රීයව ඉදිකර ඇත. මෙම බිත්තියේ ප්‍රධාන දිශා සතරට මුහුණලා



මැදිරිගිරිය වටදාගෙයි නෂ්ටාවශේෂ

ස්ථාපනය කර ඇති ද්වාර සතරින් වටදාගෙයි අභ්‍යන්තරයට ප්‍රවිශ්ට විය හැක. බිත්තියේ උස හා ඝණකම අනුව එයද කුළුණු වලට අමතරව වහලයේ බර දරා ගැනීම සඳහා යොදාගත් බැව් පෙනේ. මීට අමතරව පොළොන්නරුවේ ඒක කේන්ද්‍රීය මළු දෙකක් ඇති අතර ඉහල මළුවේ ස්තූපය ඇතුළුව ඉහතින් සඳහන් කරන ලද වාස්තු විද්‍යා අංගයන් ස්ථාපනය කර ඇත. පහල මළුවේද දැව කුළුණු සිටුවීම සඳහා ඒක කේන්ද්‍රීය වලලු දෙකක සාධක ඇති අතර මෙම කුළුණු මගින් පහල මළුවේ යම් කොටසක්ද වහලයෙන් ආවරණ වී ඇති බැව් පෙනේ. පොළොන්නරුවේ මෙන් සම්පූර්ණ උසට ගඩොල් බිත්තිය ශීර්ෂ වී නොමැති වුවද, මැදිරිගිරිය වටදාගෙයි ද වෘත්තාකාර බිත්තියේ කොටස් යම් උසකට ආරක්ෂා වී ඇති අතර, මෙහිද සතර දිශාවන්ට මුහුණ ලා ද්වාර, මෙම වටදාගෙවල් දෙකෙහිම අවසාන වලල්ලේ කුළුණු යා කිරීම සඳහා ගලින් කැටයම් කරන ලද ගරාදි වැටවල් යොදා තිබීම විශේෂත්වයක් වන අතර, අනෙකුත් වටදාගෙවල් වල මෙම ලක්ෂණය දැකගත නොහැක.

තිරියාය වටදාගෙයක්, පොළොන්නරුව හා මැදිරි-ගිරය උදාහරණ ආකාරයටම වෘත්තාකාර බිත්තියක් නොමැති වුවද, එහි අවසාන කුළුණු වලල්ලට පිටත මළුවේ පිටත කෙළවරෙහි ඒක කේන්ද්‍රීයව ඉදිකරන ලද සාපේක්ෂ වශයෙන් උස් වූ ප්‍රාකාරයක් (Parapet Wall) ඇත. එය කුළුණු වලට සාපේක්ෂ වන පරිදි උස් නොවුවද සතර දිශාවලට මුහුණලා ස්ථාපනය කර ඇති ද්වාර අනුව, මෙම ප්‍රාකාරයද ගොඩනැගිල්ලේ අභ්‍යන්තර අවකාශය නිර්මාණය කිරීම සඳහා ඉදිකරන ලද්දක් බැව් පෙනේ. නමුත් මෙය සෘජුවම වහලයේ බර දරාගත් බවද නොපෙනේ. ප්‍රාකාරයෙන් පිටතට තිරස්ව ප්‍රක්ෂේපණය කරන ලද පාෂාණයෙන් නිම කරන ලද තළාඳ දණ්ඩේ (Cantilevered Beam) කෙළවරෙහි තව්වක් ඇති අතර එයට ගිල්වන ලද සිරස් දැව කූර මගින් වහලයේ අගුව දරා සිටි බවට අනුමාන කළ හැක.

දැනට බිත්තිවල ගඩොල් ශේෂ වී නොමැති වුවද අනුරාධපුරයේ ථූපාරාම හා ලංකාරාම වටදාගෙවල් වලද පිටතින් ඇති කුළුණු වලට මදක් ඇතුලතින් මෙම වෘත්තාකාර බිත්තිය හා දොරටු තිබූ බවට පුරාවිද්‍යා සාක්ෂි ඇත. එබැවින් මෙම වටදාගෙවල් දෙකෙහි ද මූලික වාස්තු විද්‍යා ලක්ෂණ පොළොන්නරුව හා මැදිරිගිරිය වටදාගෙවල් වල එවැනි ලක්ෂණ වලට ඉතාමත් සමීපය, නමුත් අනුරාධපුර උදාහරණවල බිත්තියට පිටතින් ඇති කුළුණු වලල්ල සඳහා ගරාදි වැටක් තිබු බවට සාක්ෂි නොමැත.

මිහින්තලය හා රාජාංගන වටදාගෙවල් වල බිත්තියක හෝ ප්‍රාකාරයක කිසිදු සාධකයක් හෝ ලකුණක් නොමැත. එබැවින් මෙම උදාහරණ දෙකෙහිම අභ්‍යන්තර අවකාශය කෙසේ නිර්මාණය වී තිබුනේද යන්න ගැටළු සහගත වන අතර එවැනි ආවරණයක් නොතිබී අභ්‍යන්තර අවකාශයක් නිර්මාණය වී නොතිබීම හේතුවෙන් ඒවා වටදාගෙවල් වශයෙන් වාස්තු විද්‍යාත්මකව හැඳින්විය හැකිදැයි අයෙකුට ප්‍රශ්ණ කළ හැක. නමුත් ඒවායේ කුළුණු වලලු ඒක කේන්ද්‍රීයව පිහිටා තිබීම හේතුවෙන් වහලය වෘත්තාකාර සැලැස්මක් ගනු ලබන බැවින්, ඒවාද වටදාගෙවල් ලෙස අර්ථකථනය කිරීමට ඇති ඉඩකඩ වැඩිවේ. සමහර විට මෙම උදාහරණ දෙකෙහි අභ්‍යන්තර බිත්ති ගඩොලින් නොව, දැව වැනි දිරාපත් වන ද්‍රව්‍යයකින් ඉදිකර තිබුනේද යන්න පිළිබඳ අවධානය යොමු කිරීම වටී.

ඉහතින් සඳහන් කරන ලද වටදාගෙවල් අතුරින් රාජාංගණය හැර අනෙකුත් සියළුම වටදාගෙවල් වල මළුව වෘත්තාකාර සැලැස්මක් ගනු ලබන අතර රාජාංගණයේ මළුව පමණක් සමචතුරස්‍රාකාර හැඩයක් ගනී.

**ඉහතින් සඳහන් කරන ලද වටදාගෙවල් අතුරින් රාජාංගණය හැර අනෙකුත් සියළුම වටදාගෙවල් වල මළුව වෘත්තාකාර සැලැස්මක් ගනු ලබන අතර රාජාංගණයේ මළුව පමණක් සමචතුරස්‍රාකාර හැඩයක් ගනී.**



**තිරියාය වටදාගෙයි නශ්ටාවශේෂ**



***අදටද ජීවමාන තත්වයේ පවතින ඓතිහාසික යුගයේ ඉදිකරන ලද නමුත් වර්තමානයේ ප්‍රතිසංස්කරණය කරන ලද අත්තනගල්ල වටදාගේ***

## වහලය පිළිබඳ අදහස්

වටදාගෙයි වහලයේ සැලැස්ම වෘත්තාකාර බැව් බොහෝ විද්වතුන් පිළිගත්තද එහි අනෙකුත් නිර්මාණ ලක්ෂණ පිළිබඳ විවිධ යුගවල විද්වතුන්ගේ අදහස් විවිධය. මේ සදහා කේතුකාකාර (මුදුනින් නවන ලද කිරි ගොටුවක් ආකාරයේ) වහලයක් තිබූ බැව් තාප්පර් අනුමාන කරන ලදි. (සිල්වා 2004) මියන්මාරයේ මෙන්ගන් (Mengen) වෘත්තාකාර ස්තූප (Pagoda) ආකාරයේ වහලයක් තිබූ බවට බෙල් (1908) අදහස් කරයි. ද බෙයිලි (1907) ද මීට සමාන මතයක් ඉදිරිපත් කර ඇත. අනුරාධපුර කැසිකිලි ගල්වල කොටා ඇති ආකාරයේ වක්‍රාකාර (Inverted cyma) හැඩැති වහලයක් තිබී ඇති බැව් හෝකාට් (1928) අනුමාන කරයි. පරණවිතාන (1946) විසින් ඉන්දියාවේ ගුහා ආශ්‍රිත චෛත්‍ය ශාලාවල කැටයම් මගින් පෙන්වා ඇති වහලවල් වල නිර්මාණ ලක්ෂණ මෙන්ම, දේශීය සාහිත්‍ය මූලාශ්‍ර විශේෂයෙන්ම පොළොන්නරු යුගයේ රචිත අමාවතුර කෘතියේ සඳහන් එක්තරා කරුණක් ද පදනම් කරගෙන ස්තූපයට ආසන්නයෙන් ඇති කුළුණු වලල්ල මත අර්ධ ගෝලාකාර වහලයක් ද ස්තූපයේ ඈතින් ඇති අවකාශය සඳහා ආනතිය සහිත නමුත්, අගුව වක්‍රාකාර හැඩයක් ගන්නා වහලයක්ද අනුමාන කර එහි කල්පිත නිර්මාණය සැලසුම් මගින් ඉදිරිපත් කර ඇත. වහලය සඳහා දැව රාමුවක්ද ඔහු යෝජනා කර ඇත. පරණවිතාන විසින් ඉදිරිපත් කරන ලද මෙම යෝජනාව හෝකාට් විසින් කරන ලද අනුමානයේ වර්ධනයක් ලෙස සැලකිය හැක. වටදාගෙය අභ්‍යන්තර අවකාශය වෙන් කරනු ලබන බිත්තියේ හෝ ප්‍රාකාරයේ ද්වාර වලින් හැර එළිය හා වාතාශ්‍රය ලබා ගැනීම සඳහා කවුළු නොමැති බැවින් අර්ධගෝලාකාර වහලය හා බෑවුම් සහිත වහලය අතර හිඩසක් මගින් එළිය හා වාතාශ්‍රය ලබාගැනීම කර ඇති බවට කරන ලද අනුමානය විශේෂිතය. නමුත් දේශීය වාස්තු විද්‍යා සම්ප්‍රදාය තුල ගඩොලින් හෝ පාෂාණයෙන් වූ නිර්මාණවල හැර දැව රාමුවකින් කරන ලද වහලවල් ගෝලාකාර හෝ වක්‍රාකාර හැඩ ඇති බවට සාක්ෂි නොමැත. ඓතිහාසික යුගයේ ඉදිකර පසුකාලයක ප්‍රතිසංස්කරණය කරන ලද අත්තනගල්ල වටදාගෙයි අදියර දෙකකින් යුත් කේතුකාකාර වහලය නිර්මාණ ලක්ෂණ ද පරණවිතාන සලකා බලා නොමැත. බොහෝ වටදාගෙවල් වල කරන ලද පුරාවිද්‍යා කැනීම්වලින් අනුරාධපුර යුගයේ බහුලව භාවිතා කර ඇති පැතලි උළු හැර වක්‍රාකාර උළු හමුවී නොමැති බැවින් වහලයේ වක්‍රාකාර කොටස කෙසේ සෙවිලි කරන ලද්දේ දැයි ප්‍රායෝගික ගැටළුවක් මතුවේ. තවද දැව මගින් ගෝලාකාර වහලවල් සුළඟට මෙන්ම එහිම බර දරාගැනීම සඳහා ශක්තිමත්ව ඉදිකිරීම පිළිබඳ ප්‍රායෝගිකව ශිල්පීය ගැටළුද ඇත.

නමුත් ශ්‍රී ලංකාවේ වෘත්තාකාර හෝ අටපට්ටම් බිම් සැලැස්මක් සහිත අනෙකුත් ගොඩනැගිලි සඳහා මෙන්ම දකුණු ඉන්දියාවේ විශේෂයෙන්ම කේරල ප්‍රාන්තයේ හා පෙරදිග ආසියාවේ ඒ හා සමාන සැලැසුම් සහිත ගොඩනැගිලි වල වහලවල් සදහා කේතුකාකාර හැඩයක් ඇති බැවින් පරණවිතානගේ උක්ත කල්පිත නිර්මාණය බණ්ඩාරනායක (1974,1976/1977) සිල්වා (1998 හා 2004) වැනි විද්වතුන් බැහැර කරයි.

මේ පිළිබද විධිමත් අධ්‍යයනයක යෙදෙන සිල්වා ශ්‍රී ලංකාවේ ජන වාස්තු විද්‍යා සම්ප්‍රදායේද වී බිස්ස වැනි වෘත්තාකාර ගොඩනැගිලි වල කේතුකාකාර වහලක් තිබෙන බවත්, ඉන්දියාවේ කේරල පමණක් නොව අනෙකුත් ප්‍රාන්තවලද වෘත්තාකාර ගොඩනැගිලි වල කේතුකාකාර වහලයක් තිබීම සම්ප්‍රදායක් බවත්, ඒ අනුව එවැනි වහලක ආකෘතිය වෘත්තාකාර වටදාගෙය සඳහාද භාවිතා කිරීම වඩාත් නිවැරදි බැව් තර්ක කරයි. මීට අමතරව අත්තනගළු වංශය,

පොළොන්නරු වටදාගෙයි පැති පෙනුම







පොළොන්නරුව වටදාගෙයි නෂ්ටාවශේෂ

ථූප වංශය, ධාතු වංශය, දම්පිය අටුවා ගැටපදය වැනි සාහිත්‍ය මූලාශ්‍ර වල මෙවන් ගොඩනැගිලි වලට අදාල නිර්මාණ ලක්ෂණ ද ගෙනහැර පාමින් සිල්වා විසින් පොලොන්නරු වටදාගේ වහලය සඳහා කල්පිත නිර්මාණයක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව වහලය හැඩ දෙකකින් සමන්විත (මහනුවර වහලය ලෙස ඇතමුන් හඳුන්වනු ලබන නමුත් අනුරාධපුර යුගයේ සිට පැවත එන සම්ප්‍රදායක් වන) දැව රාමුවක් සහිත කේතුකාර හැඩයක් ගෙන ඇත. ස්තූපයට ආසන්නයෙන්ම ඇති කුළුණු වලල්ලෙන් ස්තූපයට ඉහලින් තද බෑවුම් සහිත වහලයක් ද වෘත්තාකාර බිත්තිය දක්වාවූ ඉතිරි අවකාශය සඳහා අඩු බෑවුම සහිත වහලයක් ද යෝජනා කර ඇත. ස්තූපයට



*පරණවිතාන (1946) විසින් ථූපාරාම වටදාගෙය සඳහා යෝජනා කරන ලද වහලය.*



*සිල්වා (2004 විසින් පොළොන්නරුව වටදාගෙය සඳහා යෝජනා කරන ලද වහලය*



ඉහලින් වූ දැව කැණිමඩළ මගින් ඉහල වහලයේ පරාල කුරුපාවකින් තොරව එක්තැන් කර වටදාගෙයි කුළුණු හා වෘත්තාකාර බිත්තියේ උස අතර ඇති පරතරය හේතුවෙන් බිත්තියට ඉහල මට්ටමෙන් එළිය හා වාතාශ්‍රය ලබා ගැනීම සඳහා කවුළු වටේටම යෙදීම ද යෝජනා කර ඇත. පහල මළුවේ ඇති දැව කුළුණු වල පාදම් පදනම් කරගෙන පහල මට්ටමේ වහලයක්ද යෝජනා කර ඇත. මෙය පරණවිතාන විසින් යෝජනා කරන ලද කල්පිත නිර්මාණයට වඩා දේශීය සම්ප්‍රදායික වාස්තු විද්‍යා නිර්මාණ වලට ඉතාමත් සමීප බවක් දක්වයි. මෙම කල්පිතයේ ආකෘතියක් පොළොන්නරු කෞතුකාගාරයේ ප්‍රදර්ශණය සඳහාද ඉදිරිපත් කර ඇත.

***මේ හේතු නිසා මැදිරිගිරිය හා පොළොන්නරු වටදාගෙවල් වාස්තුවිද්‍යාත්මකව ඉතාමත් වර්ධිත අවස්ථාව නිරූපණය කරයි. මීට අමතරව පොළොන්නරුවේ පහළ මළුවේ කොටසක් ද ආවරණය වන පරිදි අමතර වහලයක් ද නිර්මාණය කර ඇති බැවින් පිටතින් නිරීක්ෂණය කරන විට මෙය වහලවල් කිහිපයකින් යුත් ප්‍රාසාදයක් ලෙසද දිස්වේ. එනයින් ගත් කල පොළොන්නරු උදාහරණය වටදාගෙවල් වල වාස්තු විද්‍යා නිර්මාණයේ උච්චතම අවස්ථාව සනිටුහන් කරන බැව් පෙනේ.***

## වාස්තු විද්‍යාත්මක නිර්මාණයන්ගේ වර්ධනය

මිහින්තලය හා රාජාංගණ උදාහරණ වල මළුව අනෙක් වටදාගෙවල් වලට සාපේක්ෂව එතරම් උස් නොමැති අතර ඒවාට සතර දෙසින් පිහිටා ඇති පියගැට පෙළවල ගල් කැටයම් ද අනෙක් ඒවා තරම් සුවිශේෂී නොවී තරමක් සරල බවක් පෙන්නුම් කරයි. ඒවායේ අභ්‍යන්තර අවකාශය වෙන් කිරීම සඳහා ස්ථිර බිත්ති නොමැති හේතුවෙන්ද මෙම උදාහරණ දෙක වටදාගෙවල් වල වාස්තු විද්‍යාත්මක වර්ධනයේ මුල් අවස්ථාවක් නිරූපණය කරනු ලබන බැව් පෙනේ. තිරියාය උදාහරණයේද මළුව ඉහත උදාහරණ දෙක මෙන් එතරම් උස් නොවුවද අභ්‍යන්තර අවකාශය වෙන් කිරීම සඳහා උස් බිත්ති නොමැති වුවද එය වටා වූ සාපේක්ෂව උස් වූ ප්‍රාකාරයෙන් මෙම කාර්යය ඉටු කර ඇත. වටදාගෙයට ඇතුළු වන පියගැට පෙළ වල හා අනෙකුත් ගල්කැටයම් අංගද මිහින්තලය හා රාජාංගණය උදාහරණ වල එම අංගයන්ට සාපේක්ෂව ඉහල වන අතර පළමු උදාහරණ දෙකට වඩා වාස්තු විද්‍යාත්මකව වර්ධිත අවස්ථාවක් පෙන්නුම් කරයි. අනුරාධපුරයේ ථූපාරාම හා ලංකාරාම වටදාගෙවල් වල මළු ඉහතින් නම් සඳහන් කරන ලද උදාහරණ තුනටම සාපේක්ෂව උසින් වැඩි අතර තිරියාය මෙන් ප්‍රාකාරයක් නොව බිත්තියකින් අභ්‍යන්තර අවකාශය වෙන් කර ඇත. ඒවායේ ගල්කැටයම් මීට ප්‍රථම සඳහන් කල උදාහරන වලට වඩා ඉහල තත්වයක් පෙන්නුම් කරයි. එබැවින් මෙම උදාහරන දෙක වාස්තු විද්‍යා නිර්මාණ විකාශනයේ තුන්වන අදියර නිරූපණය කරයි. මැදිරිගිරිය හා පොළොන්නරු වටදාගෙවල් වල මළු ඉතාමත් උස් මට්ටමක පිහිටන පරිදි නිර්මාණය කර ඇති අතර එමගින් සම්පූර්ණ ගොඩනැගිල්ලේම සිරස් පරිමාණය විශාල වී ඇත. එහි අභ්‍යන්තර අවකාශය වෙන් කිරීම සඳහා ගඩොල් බිත්තියට පිටතින් වූ කුළුණු වලලු යාකොට ඇති ගරාදි වැට මගින් වටදාගෙයි බාහිර පෙනුමට වාස්තු විද්‍යාත්මකව පොහොසත් කොට ඇත. තවද සතර දිශාවෙන් අභ්‍යන්තර අවකාශයට ඇතුළු වීමට ඇති මළුව ඉතා උස් බැවින් ඊට ගොඩවීම සඳහා අනෙක් උදාහරණ වල නොමැති අමතර පියගැට පෙළ ඉතාමත් ආකර්ශණීය වන පරිදි නිර්මාණය කර ඇති අතර පොළොන්නරුවේ මෙම පියගැට පෙළ මගින් එහි පහළ මළුවට ඇතුළු වන ස්ථානයේ ද්වාර මණ්ඩපයක් ඉදිකර ඇත. එබැවින් මෙම උදාහරණ දෙකෙහිම මෙම ඉදිරි පියගැට පෙළ විශේෂ අංගයක් ලෙස ඉස්මතු වී ඇති අතර අනෙකුත් අංගයන්ට අදාල ගල් කැටයම් ද ඉතා ඉහල මට්ටමක පවතී. මේ හේතු නිසා මැදිරිගිරිය හා පොළොන්නරු වටදාගෙවල් වාස්තුවිද්‍යාත්මකව ඉතාමත් වර්ධිත අවස්ථාව නිරූපණය කරයි. මීට අමතරව පොළොන්නරුවේ පහළ මළුවේ කොටසක් ද ආවරණය වන පරිදි අමතර වහලයක් ද නිර්මාණය කර ඇති බැවින් පිටතින් නිරීක්ෂණය කරන විට මෙය වහලවල් කිහිපයකින් යුත් ප්‍රාසාදයක් ලෙසද දිස්වේ. එනයින් ගත් කල පොළොන්නරු උදාහරණය වටදාගෙවල් වල වාස්තු විද්‍යා නිර්මාණයේ උච්චතම අවස්ථාව සනිටුහන් කරන බැව් පෙනේ.

නමුත් මෙම උදාහරණ බොහොමයක පාෂාණ කුළුණු ශීර්ෂවල කැටයම් සලකා බැලුවහොත් ඒවා අතර එතරම් අසමානතා පෙන්නුම් නොකරන අතර, එමගින් ඉහතින් සඳහන් කරන ලද වාස්තු විද්‍යා නිර්මාණ ලක්ෂණවල විකාශනය පිළිඹිබු නොවේ. මේ පිළිබඳ අදහස් දක්වන විද්වතුන්ගේ මතය වී ඇත්තේ මුලදී මෙම කුළුණු දැවයෙන් ඉදිකර තිබෙන්නට ඇති බවත් පසුව එකම කාලයකදී ක්‍රි.ව 07 හා 08 සියවස්වල) ඒවා වෙනුවට පාෂාණ කුළුණු ආදේශ කිරීම හේතුවෙන් මෙම වෙනස එතරම් කැපී නොපෙනෙන බවයි.

ශ්‍රී ලංකාවේ වටදාගෙයි නිර්මාණ ලක්ෂණ සඳහාද මූලික වස්තු බීජය ඉන්දියාවෙන් ලැබී තිබීම පිළිගත හැකි නමුත් ඉන්දියාවේ හෝ වෙනත් බෞද්ධ රටවල ස්තූපය කේන්ද්‍ර කොටගත් මෙවැනි නිර්මාණ ලක්ෂණ සහිත ගොඩනැගිලි බිහි වී නොමැත. එබැවින් වටදාගෙය ශ්‍රී ලංකාවේ මෙන්ම ආසියාතික වාස්තු විද්‍යා සාම්ප්‍රදායන් කරුනු කරමින් ශ්‍රී ලාංකික වාස්තු විද්‍යාඥයා විසින් වැඩි දියුණු කරන ලද අග්‍රගන්‍ය වාස්තු විද්‍යා නිර්මාණයක් බැව් පෙනේ. ■

*සටහන - වාස්තු විද්‍යාඥ ආචාර්ය නිලාන් කුරේ*


***Reference List for the article on Vatadage***

*Bandaranayake, S. (1974) Sinhalese Monastic Architecture. Leiden, E. J. Brill.*
*Bandaranayake, S. (1976) The Historical Architecture of Sri Lanka. In: Viskam. Colombo, Department of Cultural Affairs: pp. 16-34.*
*Bandaranayake, S. (1978) Sri Lanka and the Monsoon Asia: Patterns of Local and Regional Architectural Development and the Problem of the Traditional Sri Lankan Roof. In: Prematilleke, L., Indrapala, K. and van Lohuizen-De-Leeuw, J. E. (eds.) Senarat Paranavitana Commemoration Volume. Leiden, E. J. Brill: pp. 22-44.*
*Bell, H. C. P. (1908) Archaeological Survey of Ceylon, Annual Report 1903, Colombo*
*De Beylie (1907) L'architecture Hindoue en Extreme – Orient, Paris*
*Fergusson, J. (1876) History of Indian and Eastern Architecture. London*
*Hocart, A. M. (1928) Archaeological Summary, Ceylon Journal of Science, Section G, Vol.1, Colombo*
*Paranavitana, S. (1946) The Stupa in Ceylon, Memoirs of the Archaeological Survey of Ceylon, Vol. V. Colombo.*
*Parker, H. (1909) Ancient Ceylon: An Account of the Aborigines and of Part of the Early Civilization, London*
*Silva, R. (1988) Religious Architecture in Early and Medieval Sri Lanka. Colombo.*
*Silva, R. (2004) Thupa, Thupaghara and Thupa-Prasada. Memoires of the Archaeological Survey of Ceylon, Vol. X, Part II. Colombo, Department of Archaeology.*
*Smither, J. G. (1893) Architectural Remains, Anuradhapura, Ceylon. London*

# An invitation to advertise your products / services in the web based information system at ARCHPEDIAWeb portal of Sri Lanka Institute of Architects.

SLIA Library has now been converted to the SLIA Resources Centre (RC). The RC via its website of *http://www.archpedia.lk* will bring e-construction directory, e-Member practice profiles, e-library and Awareness programs to your desktop with ease. The services of the Resources Centre will be dedicated to Members, Students, Business Community which directly involved in Architecture, Engineering and Construction industry. The RC services will also be extended to the general public who are involved in the construction sector directly and indirectly. Archt. Ranjana Suraweera, FIA (SL), Chairman, Board of Architectural publications together with the Chairman of the Resources Center Archt. Plnr. Dr. Jagath Munasinghe, FIA (SL) expect your active participation to make this endeavor a success.

For publication of your company products promotional flyers or Architects' projects, you are kindly requested to contact Mr. Priyantha Wickramaratna, Head of the SLIA Resources Centre (*Tel: 0094 78 606 4900, 0094 72 716 4900 E.mail: headrc@architects.lk*), and get it allocated a web space required for your advertising.







- Advertise yourself in the ARCHPEDIA web portal of SLIA Resource Centre
- Reach allied Professionals, contractors, manufacturers and client via google search engine.
- Remove your old projects and update your web space with new projects and upcoming projects
- All that and many more......

**Register with ARCHPEDIA and receive your web space for just Rs. 8000/=**

Construction Directory | Architects' Projects | SLIA Library On-line | Archpedia Forums

*More Details can be obtained*

**http://www.archpedia.lk**

**Tel: 078 60 64 900**

**E.Mail: headrc@architects.lk**

*@ SLIA Resource Centre of Board of Architectural Publications*

# වාස්තු ශාස්ත්‍රය සහ
# නවීන වාස්තු විද්‍යාවේ ගැලපීම



ප්‍රසුගිය "වාස්තු කලාපයන් 5ක් මුළුල්ලේ ඉහත මාතෘකාව යටතේ වාස්තු ශාස්ත්‍රයේ විවිධ පැතිකඩයන් විමසීමට බඳුන් කල බව පාඨක ඔබ දන්නා කරුණකි. මෙම පැතිකඩයන් අතර වාස්තු ශාස්ත්‍රයේ ඉතිහාසය එය බිහිවීමට පාදක වූ සාමාජීය පසුබිම ඉඩම්වල හැඩයන් හා පිහිටීම, ඉඩමක නිවසක ඉදිකිරීමට ප්‍රථම එහි වටපිටාව නිරීක්ෂණයේ දී සැලකිය යුතු කරුණු හෙවත් වේද දෝෂයන්, ඉඩමක පාදයන්වලට අනුකූලව නිවස ස්ථාපනය කළ යුතු අයුරු හා වාස්තු පුරුෂ මණ්ඩල සංකල්පය ඇසුරෙන් නිවසක එක් එක් අවකාෂයන් ස්ථානගත කරන පිලිවෙළ, වාස්තු ශාස්ත්‍රය අනුව සැලසුමක පාද බෙදීම මෙන්ම ළිං, වැසිකිළි සහ වෙනත් අදාල ස්ථානයන් පිහිටීමේදී සුභ අසුභ දිශාවන් රූප සටහන් හා උදාහරණ සහිතව සාකච්ඡා කරන ලදී. මෙම කලාපයෙන් වාස්තු ශාස්ත්‍රය සම්බන්ධව තවත් කරුණු මෙන්ම පාඨකයන් විසින් යොමු කර තිබූ විමසීම් හා ගැටලු සම්බන්ධයෙන් පොදු පිළිතුරක් ලබා දීමට බලාපොරොත්තු වේ.

වාස්තු ශාස්ත්‍රය හා වාස්තු විද්‍යාව අතර වෙනස මෙන්ම වාස්තු ශාස්ත්‍රඥයා හා වාස්තු විද්‍යාඥයා අතර වෙනස ඔබට මෙම ලිපි පෙළ කියවීමෙන් වැටහී ඇති බව පෙනී යන කරුණකි. නමුත් අද සමාජයේ බොහෝ ව්‍යාපාර මට්ටමින් වාස්තු ශාස්ත්‍රය සම්බන්ධයෙන් උපදෙස් දෙන පුද්ගලයන් තමුන් වාස්තු විද්‍යාඥයන් ලෙස හඳුන්වාගනු ලබයි. 1976 අංක 01 දරණ පාර්ලිමේන්තු පනත ප්‍රකාර "වාස්තු විද්‍යාඥයා" යන නාමය භාවිතා කිරීම හෝ ඊට සමාන වචන වලින් සුදුසුකම් නොලත් පුද්ගලයන් පෙනී සිටීම නීති විරෝධීය. (ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයින් නිල වෙබ් අඩවිය වන www.slia.lk වෙත පිවිස සුදුසුකම් ලත් වාස්තු විද්‍යාඥයන් කවුරුන්ද යන්න විමසා බැලීම සඳහා පොදු ජනතාවට පහසුකම් සපයා ඇත.

පිළිගත් වෘත්තීයවේදීන් මහජනයාට මෙන්ම තම සේවාදායකයන් හට නිවැරදි තොරතුරු ලබා දීමට ආචාරධර්ම පද්ධතියකින් බැඳී ඇති අතර එසේ නොමැති පුද්ගලයින් හට තම සේවාදායකයින් රවටා හෝ බිය වද්දා, මුදල් හම්බකිරීම අද සමාජයේ දක්නට ලැබෙන සුලභ ලක්ෂණයකි. ඔවුනට ප්‍රචාරනයේදී හෝ බාධක නොමැත.

පාඨකයන් යොමු කර ඇති ප්‍රශ්න අතර යම් යම් තර්කයන්ද ඉදිරිපත් වී තිබූ හෙයින් ඒ සඳහාද පොදු පිළිතුරක් ලබා දීම වඩා උචිත යැයි සිතේ. වාස්තු ශාස්ත්‍රයේ ඉතාම සුභ යැයි සැලකෙන වෘත්තාකාර භූමිය කොපමණ ප්‍රායෝගික දැයි ඔබ වටහා ගත යුතුය. එමෙන්ම හරි හතරැස් භූමීන්ද හරි සෘජුකෝණාස්‍රාකාර භූමින්ද අප හට හමුවන්නේ ඉතාම විරල වශයෙන් බව පැහැදිලිය. එසේ නම් වාස්තු ශාස්ත්‍රයට අනුව නිවැරදි භූමියක් තෝරා ගැනීම කොපමණ අපහසුද යන්න ඔබට වැටහෙනු ඇත. භූමීන් අතර ඉතාම සුලභ, විෂම රූපී භූමීන් බව ඔබට වැටහෙනවා ඇත. එම භූමීන් වලට කුමක් හෝ දෝෂ සහගත තත්වයක් වාස්තු ශාස්ත්‍රයට අනුව ඇති බව පිළි ගැනේ.

එමෙන්ම පාද බෙදිමේදී ප්‍රමාණවත් අයුරින් ශුභම පාදය ලෙස සැලකෙන බ්‍රහ්ම පාදයට හසුවන භූමියක් අවම පමණක් පර්චස් 140ක් පමණවත් විය යුතුය. එමෙන්ම එම භූමිය සමචතුරස්‍ර විය යුතුය. එවිට




රූපය - වාස්තු ශාස්ත්‍රයට අනුව බ්‍රහ්ම පාදයේ නිවස සෑදීමට අවම වශයෙන් පර්චස් 140ක් තිබිය යුතුය

වර්ගඅඩි 2500 ක පමණ ප්‍රදේශයක් බ්‍රහ්ම පාදයට හසුකරගහ හැකිය. වර්තමානයේ දැක්නට ලැබෙන පර්චස් 06, 10 හෝ 20 වැනි විශමරූපී ඉඩම් වලට මෙම සිද්ධාන්ත අනුගමනය කිරීම පලක් නොවන බව තවදුරටත් කරුණු අධ්‍යනය කිරීමෙන් පැහැදිලි වනු ඇත. මේවාට කෙම් ක්‍රම සහ විවිධ දෝෂ නිරාකරණය කිරීමට ඊනියා විසඳුමක් ඉදිරිපත් කරනු ලබන වාස්තු ශාස්ත්‍රඥයින් ඕනෑ තරම් සිටින බව පුවත් පත් හා රූපවාහිනී වැඩසටහන් නැරඹීමෙන් පෙනී යයි. මිත්‍යාව සමාජගත කිරීමට හා විචාර බුද්ධියෙන් තොර ජනතාවක් රට තුළ බිහි කිරීමට මාධ්‍ය ද පෙරමුණ ගන්නේ නම් එය ද කණගාටුවට කරුණකි.

එසේම වාස්තු පුරුෂ සංකල්පය දිශානති සමග සැලසුම්වල යෙදීමේදී එක් එක් අවකාශ පිහිටීම එකම ස්වරූපයක් ගත යුතු බව පෙනේ. එසේ නොවන්නේ නම් එය වාස්තු ශාස්ත්‍රයේ සඳහන්වන වාස්තු පුරුෂ සංකල්පයට පටහැනිය. අප රටේ පවතින දේශගුණික තත්ත්වයන්, භූ විෂමතාවයන් හා ඉඩම්වල පිහිටීම එහි ප්‍රවේශ මාර්ග පිහිටීම, සූර්යපතනය වන දිශාවන්, සුළඟ හමන දිශාවන් මෙන්ම පසේ ස්වභාවය, නිවැසියන්ගේ රුචිකත්වය මත යෙදෙන අවකාශයන්ගේ පිහිටීම බැහැර කොට වාස්තු පුරුෂ සංකල්පය මගින් මුලුමනින්ම වාස්තු ශාස්ත්‍රඥයාට රුචි අයුරින් බලහත්කාරයෙන් සැලසුමක් වෙත යොමු කරවීම හා අනතුරුව එහි සියලු යස ඉසුරු ඇති බව මනසට කා වැද්දීම පිළිගන්නා තරමටම සාමාන්‍ය ජන මනස අවුල්වී ඇති බව පෙනේ. තවත් පිරිස් වාස්තු පරීක්ෂා කිරීම සඳහා ප්‍රවීණයන් ලෙස පෙනී සිටිති. මොවුන්ගේ ආකර්ශනීය කතා විලාසය, ඇඳුම් විලාසිතා සහ මොවුන් පවසන ඔවුන්ම සොයාගත් සිද්ධාන්තයන් සමඟ කැඩුම් බිඳුම් වලින් තොර නිවාස පරීක්ෂාවට ලක් කිරීම සහ ඒවා සුභ නිවාස ලෙස පරිවර්ථනය කිරීම සඳහා ඔවුන්ගේම ව්‍යාපෘති මෙහෙයවනු ලබයි.

ඔවුන් එසේ කරනුයේ තමන් දුක් මහන්සිවී ගොඩනගාගත් නිවස කඩා බිඳ දැමීමට ජනතාවගේ මැලිකම සුපැහැදිලිව තේරුම්ගෙන ඇති බැවිනි.

තවද වට පිටාවේ පෙනෙන අශුභ ලෙස සැලකෙන දෑ හෙවත් වේද දෝෂයන්ගේ ග්‍රහණයට හසුනොවූ බිම්කඩක් අද කිසිම නාගරික ප්‍රදේශයක සොයාගැනීම ඉතා විරලය. එය එසේ වන්නේ ඉඩම් හිමියකුගේ ඉඩමකට පිටින් සිදුවන දෑ පාලනය කිරීමට ඔවුනට තිබෙන සීමිත අවකාශය නිසාය.

එමෙන්ම ඉතා සුපරික්ෂාකාරී ලෙස වාස්තු ශාස්ත්‍රයට අදාලව සැලසුම්කරන ලද නිවසක පිහිටි යාබද ඉඩමක් ඉඩම් හිමියා විසින් මිලදී ගතහොත් එහි බ්‍රහ්ම පාදය වෙනස්වන බැවින් එම නිවසට කලින් බලපෑ විශ්ව ශක්තිය වෙනස් විධියකට බලපාන බවට තර්කයක් ඉදිරිපත් කල හැක. එමෙන්ම වාස්තු ශාස්ත්‍රයට අනුකූලව සෑදූ නිවසක් සහිත ඉඩමක් යම් හෙයකින් කොටසක් විකුණා දැමූ විට නැවතත් එම තත්ත්වයම උදාවිය හැකි බව ඔබට තාර්කිකව පෙනෙනු ඇත.

තවද වාස්තු ශාස්ත්‍රය පදනම්ව ඇත්තේ ද්විමානයේ මිස ත්‍රිමාණයේ නොවේ. මිනිස් ජීවිත වල පැවැත්ම සඳහා ත්‍රිමාණ අවකාෂයක් කොමපණ වැදගත් වනවාද යන්න ඔබට වැටහෙනු ඇත. එමෙන්ම වාස්තු ශාස්ත්‍රයේ




එන ජනෙල් හා දොරවල් ඔත්තේ සංඛ්‍යාවක් විය යුතු බව විද්‍යාත්මකව පැහැදිලි කර ගැනීම උගහටය. නමුත් කිසියම් ගොඩනැගිල්ලක එක හා සමාන කණු පිහිටීම හෝ ජනෙල් පිහිටීම සමතුලිතතාවය සහ සමබරතාවයේ සිද්ධාන්තය මගින් ඔත්තේ සංඛ්‍යාවක් වීම වාසිය විද්‍යාත්මකව පැහැදිලි කර ගත හැක.

තවද නූතන වාස්තු ශාස්ත්‍රකරුවන් වැසිකිලි උපාංග පැවතිය යුතු ආකාරය සහ පැන්ට්‍රියෙහි උපකරණ තැබියයුතු ආකාරය මෙන්ම රූපවාහිනී යන්ත්‍රය ස්ථානගත කල යුතු ආකාරය ද රූපවාහිනී වැඩසටහන් තුලින් මොවුනගේ පැහැදිලි කර දීම් හාස්‍ය ජනකය. ඒ මන්ද අවුරුදු 7000 කට පමණ පෙර බිහිවූවා යැයි සැලකෙන මෙකී වාස්තු ශාස්ත්‍රයේ මෙවැනි නවීන උපකරණ එකළ භාවිතා නොවූ බැවිනි. වාස්තු ශාස්ත්‍රය නිසියාකාරව පිළිපදින්නේ නම් වැසිකිලිය කිසිදු විටෙක ගෙය තුළ පිහිට විය යුතු නැත. එසේම මහල් නිවාසවල ජීවත්වීම අතිශය අවදානම් බව කිව යුතුය. අප දන්නා පරිදි වර්තමානයේ බොහෝදෙනා සුපිරි මහල් නිවාසවල ජීවත් වීම ඉතා සුලභ දසුනකි. එමෙන්ම බොහෝ උගත් සහ සුඛෝපභෝගී ජීවිත ගතකරන මිනිසුන් බොහෝමයක් ජීවත් වන්නේ නාගරික සහ තදාසන්න ප්‍රදේශවල බව පෙනීයන කරුණකි. මෙවැනි බොහෝ නිවාස 100% ක්ම වාස්තු දෝෂ වලින් බැහැර බව කිව නොහැකිය. එමෙන්ම වාස්තු පිළිපදින රටවල් සහ ජන කොටස් ඉතා දරිද්‍රතාවයෙන් පෙළෙන සහ නොසතුටින් ජීවත්වන ජන කොටස් බව අපට පෙනී යන කරුණකි. ලෝකයේ දියුණු යැයි සැලකෙන සහ සතුටින් ජීවත්වන මිනිසුන් සිටින රටවල් මෙවැනි සංකල්ප සහ ශාස්ත්‍රයන් අනුමත නොකරනවා පමණක් නොව මේවා හාස්‍යයට ලක්කරන අවස්ථා ද විරල නොවේ. එබැවින් වාස්තු ශාස්ත්‍ර සංකල්පයන් හි ඇති යම් විද්‍යාත්මක කොටස් පමණක් තේරුම් ගෙන මෙවැනි මිත්‍යා වලින් මහජනතාව රවටා සූරා කන්නන්ගෙන් ඔබ ප්‍රවේශම් විය යුතු බව දැන ගත යුතුය. ■

සටහන - වරලත් වාස්තු විද්‍යාඥ රෝහණ බණ්ඩාර හේරත්



නවීන හැඩතල එකතු වූ ස්වභාවික විද්‍යා කෞතුකාගාරය නෙලුම් පොකුණ මාවතට දිස්වන අයුරු

# ස්වාභාවික ඉතිහාස කෞතුකාගාරය

## ඉතිහාසය

කොළඹ සර් මාකස් ප්‍රනාන්දු මාවතේ සුවිසල් ගෙවත්තක මැද පිහිට ඉතා ගාම්භීර ලෙස දිස්වන පැරණි සුදෝ සුදු මහා මන්දිරය කොළඹ ජාතික කෞතුකාගාරය වේ. එය 1877 වසරේ ආරම්භ කරන ලද අතර එය එකල බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරයා වූ සර් විලියම් හෙන්රි ග්‍රෙගරි ආණ්ඩුකාරවරයාගේ අදහසක් ද වෙයි. එය ඉතාලි ගෘහ නිර්මාණ ශිල්පය අනුව එකල මහජන වැඩ දෙපාර්තමේන්තුවේ ජේ. පී. ස්මිදර් වාස්තු විද්‍යාඥවරයා විසින් නිර්මාණය කරන ලදී. මෙසේ ආරම්භ කළ කෞතුකාගාරය තුල අපගේ ශ්‍රේෂ්ඨ සංස්කෘතිය විදහා දක්වන කෞතුක භාණ්ඩ මෙන්ම ස්වාභාවික පරිණාමය විදහා දක්වන කෞතුක භාණ්ඩද එකම වහලක් යට එකම ස්ථානයක ආරම්භයේ සිට ප්‍රදර්ශනය විය.

නමුත් වසර 1970 වන විට මෙම ස්වාභාවික පරිණාමය විදහා දක්වන කෞතුක භාණ්ඩ ප්‍රදර්ශනය සඳහාම වෙනත් ගොඩනැගිල්ලක අවශ්‍යතාවය මතුවිය.

එහි ප්‍රතිඵලයක් ලෙස ස්වාභාවික විද්‍යා කෞතුකා-ගාර අංශය බිහිවිය. එම නව ගොඩනැගිල්ල නෙලුම් පොකුණ මාවත හා එයට ඔබ්බෙන් පිහිටි විහාර මහා දේවී උයනට මුහුණලා ජාතික කෞතුකාගාර බිමෙහි පිහිටා ඇත. එම ගොඩනැගිල්ල, මුල් ප්‍රධාන ගොඩනැගිල්ලේ වාස්තු විද්‍යාත්මක ලක්ෂණයන්ට සහමුලින්ම වෙනස් මුහුණුවරකින් ඉදිකොට ඇත. එය හතරැස් හැඩතල සහිත සරල ගොඩනැගිල්ලක් වන අතර මෑතකදී එක් කරන ලද, රවුම් වහල සහිත, යකඩ රාමු වලින් වට වූ අංගයන්ගෙන්ද සමන්විත වේ.

මෙය ස්වාභාවික කෞතුකාගාර ගොඩනැගිල්ල තුල ස්වාභාවික කෞතුක වස්තූන් ප්‍රදර්ශනය කරන අංශ කීපයක් ඇත. මෙම අංශ සියල්ලම පාහේ 1970 ආරම්භක අවදියේ සිටම වැඩිදියුණු කිරීමකට බඳුන් වී නොමැත.

## ස්වාභාවික ඉතිහාස විද්‍යා කෞතුකාගාර අංශය

මෙම මැදිරියේ ප්‍රදර්ශණයට තබා ඇති භාණ්ඩ අතර ශ්‍රී ලංකාවට ආවේනික විරළ වඳවීමේ තර්ජනයට ලක්වූ සත්ව සහ ශාක නිදර්ශක ඇති අතර ආරම්භයේ සිට මෙම භාණ්ඩ ප්‍රමාණය 5000 සිට ලක්ෂ 4 දක්වා වැඩි වී ඇත.

මෙම ප්‍රදර්ශක නිදර්ශක අතර කබරගොයින්, පක්ෂීන්, සර්පයින්, කෘමීන්, මාළුන් සහ උභයජීවින්, ශාක කොටස් සහ භූවිද්‍යාත්මක වටිනාකමකින් යුත් පාෂාණ ඇත.

## ජෛව විද්‍යා මැදිරි සංකීර්ණය

මෙය මුලින්ම ස්වාභාවික ඉතිහාස විද්‍යා කෞතුකාගාර ගොඩනැගිල්ල තුල ස්ථාපනය කරන ලද්දේ 1986 වසරේදීය.

නමුත් පසුගිය වසර කිහිපය තුල, කෞතුකාගාර අධ්‍යක්ෂකතුමිය, නියෝජ්‍ය අධ්‍යක්ෂකවරු ඇතුළු කාර්ය මණ්ඩලයට මෙම මැදිරි අභ්‍යන්තරයන් වැඩි දියුණු කොට නවීන යුගයට ගැලපෙන ලෙස අළුත් වැඩියා කිරීමේ අවශ්‍යතාවය තදින්ම දැනී ඇත.

මේ සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම, අදියර ලෙස සිදුකරන අතර මෙහි ප්‍රතිඵලයක් ලෙස 2016 වසරේදී භූ විද්‍යා මැදිරිය (Geological Gallery) නවීකරණය කිරීමට තෝරා ගන්නා ලදී.

## භූ විද්‍යා මැදිරිය නවීකරණය කිරීමට පෙර මැදිරි අභ්‍යන්තර තත්ත්වය.

මෙම මැදිරියේ අභ්‍යන්තරය ගත් කල වහලය තලාඳ, කණු, බිත්ති වැනි ප්‍රධාන අංග සියල්ල සුදු පැහැයෙන් නිමවා ඇත. මෙම ප්‍රධාන කොටස් ද, විවිධ ප්‍රමාණයන්ගෙන් යුතු අංශ වලට තව දුරටත් බෙදී ඇති අතර, මෙය මැදිරිය තුල කලබලකාරී තත්වයක් ඇති කරයි. එසේම, විදුලි රැහැන් ආවරණ වැනි කොටස් එම ප්‍රධාන අංග මතුපිටින් සවි කොට ඇති අතර, එය මැදිරිය තුල ඇති කලබලකාරී තත්වය තවත් උත්සන්න කරයි.

රතු, දුඹුරු සිමෙන්ති යෙදූ බිම නිසා, මැදිරි අභ්‍යන්තරයට අඳුරු මලානික පැහැයක් එක් වී ඇත.

## ජෛව විද්‍යා මැදිරිය නවීකරණය කිරීමට පෙර මැදිරි අභ්‍යන්තර තත්වය

කෞතුක වස්තූන් ප්‍රදර්ශනය සඳහා බිත්තියට අල්ලා සැකසූ වීදුරු වලින් ආවරණය වූ සිමෙන්ති කුටි යොදා ඇත. එම කුටි වල පාදම ලෙස අඩියක් පමණ උසට දුඹුරු රතු සිමෙන්ති යෙදු ගැට්ටක් දමා ඇති අතර කුටි පිහිටා ඇත්තේ එය මතය. කුටීර වලට ඉහලින් රතු පැහැ අඩියක් පමණ උස පටියක් තිරස් ලෙස දිවයයි. අඩි 4 පමණ උස, අඩි 4ක් පමණ දිග හා අඩි 2ක් පමණ පළලට සකසා ඇති මෙම කුටීර අභ්‍යන්තර තැඹිලි පැහැයෙන් වර්ණ ගන්වා ඇත. එම කුටීර තුල ඒකාකාරී ලෙස මෙම කෞතුක භාණ්ඩ ප්‍රදර්ශනය කොට ඇති අතර, එම භාණ්ඩ තිව්ර වර්ණයක් යොදා ඇති පසුබිමින් මතු වී නොපෙනේ. එයින් එම භාණ්ඩ, පසුබිම මත බොඳවී යයි. එම තත්වය තවදුරටත් උග්‍ර වන්නේ භාවිතා කොට ඇති දුර්වල ආලෝකකරණය මතය.

තද තැඹිලි පසුබිමේ ඇති කැපී නොපෙනෙන ප්‍රදර්ශන භාණ්ඩ



අඳුරු පොළොව දුර්වර්ණ රූප සටහන් සහිත කලබලකාරී මැදිරි අභ්‍යන්තරය









*දුර්වර්ණ වූ අකුරු හා රූප සටහන් සහිත පුවරු*

## නවීකරණය කිරීමට පෙර ප්‍රදර්ශන කුටි

### 1. නවීකරණයට පෙර පැවති තැඹිලි පැහැ පසුබිම සහිත ප්‍රදර්ශන කුටි (A වර්ගය)

මෙම ප්‍රදර්ශන කුටි පියැසි මත සවි කොට ඇති විදුලි බල්බ මගින් මුළුමනින්ම ආලෝකමත් කොට ඇත. එබැවින් මෙම කෞතුක භාණ්ඩ එහි පරිසරයෙන් මතු වී පෙනීම වෙනුවට එම භාණ්ඩ තවදුරටත් කුටි අභ්‍යන්තර පරිසරය තුල දියවී සැඟවී යයි. මෙම කුටි ඉදිරිපස වීදුරු ආවරණ වටා පිහිටි අඟල් 6ක් පමණ පළලැති දුඹුරු පැහැයෙන් ඔප දමන ලද ලී රාමුද එම මැදිරිය තුල පිහිටි වර්ණ සමග ගැටී අඳුරු, ඒකාකාරී පෙනුම තවදුරටත් වැඩි කරයි.

### 2. නවීකරණයට පෙර පැවති කොළ පැහැ පසුබිම සහිත ප්‍රදර්ශන කුටි (B වර්ගය)

මෙම කුටි ඉහත සඳහන් කුටි ලෙසම සකසා ඇති අතර අභ්‍යන්තරය කොළ පැහැයෙන් වර්ණ ගන්වා ඇත. එම කුටි ඉහලින් පිහිටි අඩියක් පමණ පළල් තිරස් පටි සුදු පැහැයෙන් වර්ණ ගන්වා ඇති අතර ඉහත සියලු අඩුපාඩු මෙම කුටි තුලද දැකිය හැක. මෙම ප්‍රදර්ශන කුටි පොළවේ සිට අඩි 3ක් පමණ උඩින් පිහිටි තිරස් වීදුරු වලින් හා අඟල් 6ක් පමණ පළල ඔප දැමූ දැව වලින් නිර්මිත අඟල් 8 පමණ ගැඹුරු කුටි වේ. මෙම කුටි තුලද ඉහත අඩුලුහුඩුකම් සියල්ල හඳුනාගත හැකි වන අතර විශාල ප්‍රදර්ශන භාණ්ඩ රැසක් එකට පෙලගස්වා ඇත. මෙය නරඹන්නාට කරුණු ග්‍රහනය කර ගැනීම අපහසු කරයි.

### 3. ප්‍රදර්ශන භාණ්ඩ සංකීර්ණ ලෙස පෙළ ගස්වා ඇති පැතලි ප්‍රදර්ශන කුටි (C වර්ගය)

## නවීකරණයට පෙර පැවති තත්ත්වය

### ප්‍රදර්ශන පුවරු

ඩිජිටල් තාක්ෂණය නොතිබූ යුගයේ නිමවා ඇති කඩදාසි පුවරු වල අකුරු විවිධ වර්ණයෙන්, අතින් නිමවා ඇත. එසේම කුඩා අකුරින් කරුණු රැසක් එකම පුවරුව මත ප්‍රදර්ශනය කොට ඇත. පුවරු, අකුරු සහ රූපසටහන් සඳහාද විවිධ වර්ණ රැසක් භාවිත කොට ඇත.

එසේම රූප සටහන් රැසක්ද එකම පුවරුව මත ප්‍රදර්ශණය කොට ඇත. මෙහිදී නරඹන්නා හට කරුණු ග්‍රහණය අපහසු වන අතර කරුණු ග්‍රහණය නීරස භාවයක්ද ඇති කරයි. එසේම කාලයත් සමග මෙම පුවරු දුර්වර්ණ වී ඇත.

*පැතලි ප්‍රදර්ශන කුටි*



*අඳුරු පොළොව සහිත දුර්වර්ණ කලබලකාරී මැදිරි අභ්‍යන්තරය*





මැදිරියට පිවිසුම

## ගැලරි අභ්‍යන්තරය

මෙම ඉහත සියළු කරුණු සැලකිල්ලට ගත්කල මෙම ගැලරිය තුල කලබලකාරී අඳුරු, මනා පෙළ-ගැස්මකින් තොර, ඒකාකාරී පරිසරයක් නිර්මාණය වී ඇත.

එබැවින් මෙම මැදිරිය මෙම යුගයට ගැලපෙන ලෙස ඉහත අඩුපාඩු මග හරවා නවීන තාක්ෂණය උපයෝගී කොට ගනිමින් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වන ලෙස නවීකරණය කිරීමට අවශ්‍ය විය. ඉන්පසු නිරන්තරයෙන් අදාල කෞතුකාගාර බලධාරීන් සමග සාකච්ඡා කරමින් මැදිරි අභ්‍යන්තර පිළිසකර හා අලංකාර කටයුතු අරඹන ලදී. මේ සඳහා මෙම මැදිරිවල තිබූ සියලු කොටස් ගලවා ඉවත් කරන ලදී. එවිට බලාපොරොත්තු වූ ලෙස මනා ඉඩකඩ සහිත පසුබිමක් මතුවිය. එම පරිසරය තුල මනා සංයමයෙන් යුතු, අලංකාර සිත් ඇදගන්නා සුලු නවීන මැදිරියක් නිර්මාණය කිරීම අරඹන ලදී.

## නවීන මැදිරියක් නිර්මාණය කිරීම.

### බිත්ති

සියලු බිත්ති මනා සුමට මතුපිටක් සැකසෙන සේ නැවත පිළිසකර කරන ලද්දේ කැඩුණු බිඳුණු ස්ථාන වලටද නිසි පිළියම් යොදමිනි. තලාඳ (Beams) හා කණු (Columns) ද එසේ සුමට ලෙස නිමවන ලදි.

පැවති ස්ලැබ් කොන්ක්‍රීට් වහලය මතුපිට (Slab Sofit) පිළිවෙලකට සකස් කල නොහැකි ලෙස පිහිටි විවිධ විදුලි රැහැන්, අනාවරණය නොවූ බට වැනි කොටස් ඉවත් කල නොහැකි බැවින් ඒවා සඟවා ආවරණය කල යුතු විය. එසේ අනවශ්‍ය හා ඉවත් කල නොහැකි කොටස් ආවරණය කිරීමටද මැදිරි අභ්‍යන්තර පෙනුම නවීකරණය කොට ඉහල නැංවීම සඳහාද නවීන අංගයක් ලෙස සිදුරු සහිත 2'x2' ප්‍රමාණ වර්ණ ගැන්වූ ඇලුමිනියම් (Powder coated aluminium) සිවිලිම් තහඩු මගින් ආවරණය කරන ලදී. එහිදී අඩි 2 පමණ උස තිරස් තලාඳ (Beams) වලින් අඩි 1 පමණ කොටස් අනාවරණය වීමට සලසන ලදී. මෙය අලංකාර අංගයක් ලෙසත්, ආලෝකකරණ, විදුලි බුබුලු සවිකිරීම සඳහාත් යොදා ගන්නා ලදී.

පොළව අඩි 2x2 නොලිස්සන සුලු (Semi Glazed) කල් පවතින නිමාවෙන් යුතු (Homogeneous) බිම් ගඩොල්, (Floor Tiles) මගින් ආවරණය කිරීමෙන්.

ඉඩකඩ සහිත, මනා පෙලගැස්මෙන් යුතු, සෞම්‍ය, කලබලකාරීත්වයෙන් තොර, නවීන මැදිරියක් නිර්මාණය කිරීමට හැකි විය. එසේම සියලුම භාණ්ඩ සහිත කුටි බිත්තිය අසල පෙළ ගස්වා වඩා ඉඩකඩ සහිත අභ්‍යන්තරයක් සකසාදීම ද මෙහි තවත් අරමුණක් විය.

### වර්ණාවලිය

මේ සඳහා මැදිරි අභ්‍යන්තර එකිනෙකට ගැලපෙන සෞම්‍ය, වර්ණ වලින් වර්ණ ගන්වන ලදී. මෙහිදී වර්ණ ගන්වන ප්‍රධාන අංග වන බිත්ති, කණු, තලාඳ, සඳහා එකම වර්ණ පරාසය තුල පිහිටි එකිනෙකට වෙනස් නමුත් එකිනෙක අභිබවා නොයන වර්ණ භාවිතා කරන ලදී. මෙහිදී භාවිතා කරන ලද්දේ ස්වභාවික පරිසරයට උචිත (Earth Colurs) හෙවත් කහ දුඹුරු පැහැයේ ප්‍රභේදයන්ය. එසේම පොලොවේ බිම් ගඩොල් වර්ණයද සිවිලිමේ වර්ණයද එම වර්ණාවලියට ගැලපෙන පරිදි තෝරාගන්නා ලදී. සියලුම විදුලි පංකා, විදුලි බල්බද මෙම කාර්යාවලියට අනුකූල වන ලෙස භාවිතා කරන ලදි. මෙයින් වඩා ඉඩකඩ සහිත අලංකාර, සෞම්‍ය පරිසරයක් නිර්මාණය කරගත හැකි විය.

සුවිශේෂ ප්‍රදර්ශන භාණ්ඩයකින් අලංකාර වූ පිවිසුම් ලොබි





එකිනෙකට ගැලපෙන වර්ණ යෙදූ මැදිරි අභ්‍යන්තරය



සුදු වර්ණයේ සිට ලා දුඹුරු වර්ණය දක්වා විහිදෙන ප්‍රදර්ශන භාණ්ඩ

## ප්‍රදර්ශන භාණ්ඩ කුටි

ප්‍රදර්ශන භාණ්ඩනයට අවශ්‍ය සුවිශේෂත්වය ලැබෙන පරිදි ප්‍රදර්ශන භාණ්ඩ තබන පසුබිම සකසන ලදී.

ප්‍රදර්ශන භාණ්ඩ සියල්ලම පාහේ සෞම්‍ය සුදු ලා කහ වර්ණයේ සිට දුඹුරු පැහැ වර්ණ පරාසයට අයත් වේ. එම සෞම්‍ය ලා දුඹුරු කහ වර්ණයෙන් කැපී පෙනෙන ලෙස ප්‍රදර්ශණ භාණ්ඩ තබන කුටි අභ්‍යන්තර පසුබිම සකසන ලදී. එම වස්තූන් තබන මතුපිට සඳහා කැපී පෙන්වන වඩා තද පැහැති කලු-තද දුඹුරු වර්ණය භාවිතා කරන ලදී.






ලා පැහැ ප්‍රදර්ශන භාණ්ඩ කැපී පෙනෙන සේ පසුබිමට තද වර්ණ යොදා ඇති අයුරු



කැපී පෙනෙන පරිදි ප්‍රදර්ශනය කොට ඇති භාණ්ඩ





A වර්ගයේ දිගටි කුටි





විශේෂිත ප්‍රදර්ශන කුටි



විශේෂිත කුටි

## විවිධ ප්‍රදර්ශන කුටි වර්ග

### (A) දිග කුටි

එම කුටි බොහොමයක් අඩි 2ක් පමණ උස, අඩි 4', 6', 12' දිග අඩි 2 පමණ පළල දිගටි හැඩයෙන් යුතු අතර පහල කොටස සඳහා තද දුඹුරු කළු පැහැති වර්ණ භාවිතා කොට ඇත. උඩ පිහිටි කෞතුක වස්තු ප්‍රදර්ශනය කරනු ලබන කොටස අඩි 1 පමණ උස ලී හෝ යකඩ සැකිලි රහිත තනි වීදුරු (Tempered glass) කවරයකින් ආවරණය කර ඇත. මෙහිදී සියලුම කෞතුක වස්තු කැපී මතුවී පෙනෙන පරිදි තද කලු දුඹුරු වර්ණ මතු පිටක් යොදා ගන්නා ලදී.

### (B) වර්ගයේ ප්‍රදර්ශන කුටි

අඩි 6ක්, අඩි 2'x2', 2'x8' වැනි ප්‍රදර්ශන භාණ්ඩ කුටි අඩි 2 පමණ උසට තද කලු - දුඹුරු වර්ණයෙන් යුක්තව සැකසු හතරැස් කොටසකින්ද, (Base) අඩි 4 පමණ උස තුන් පසෙකින් වටවූ වීදුරු ආවරණයකින්ද යුක්ත වේ.

එහි 4" උස ඉහල කොටස පහල වර්ණයම යොදා ගැලපෙන ලෙස සකසා ඇත. මෙහිදී එම භාණ්ඩ තල කිහිපයක පිහිටි තද කලු හතරැස් හැඩතල සහිත පසුබිම් මත ප්‍රදර්ශනය කොට ඇත.

### විශාල පාෂාණ ප්‍රදර්ශන භාණ්ඩ

විශාල පාෂාණ ප්‍රදර්ශන භාණ්ඩ වීදුරු ආවරණ වලින් තොරව අඩි 2 පමණ උස දිග හතරැස් හැඩැති ප්‍රදර්ශන පසුබිම් මත තබා ඇත.



විශාල පාෂාණ ප්‍රදර්ශන භාණ්ඩ



සිත් ඇදගන්නා ලෙස නිමවූ ප්‍රදර්ශන නාම පුවරු



විශේෂ ලෙස ආලෝකය සැපයූ පුවරු




## රූපවාහිනී තිරය

රූපවාහිනී තිරය මත මෙම මැදිරිය සම්බන්ධ වාර්තා වැඩසටහන් නිරන්තරයෙන් ප්‍රචාරය වෙයි. එයද අනිකුත් වර්ණයන්ට හා හැඩතලයන්ට ගැලපෙන පරිදි සකසා ඇත.

## නාම පුවරු

නාම පුවරු සීලිම මත සවි කොට ඇති විශේෂිත ස්ථානය කේන්ද්‍ර කොට ගත් විදුලි බල්බ (Adjustable spot lights) මගින් ආලෝක කොට ඇත.



මැදිරි අභ්‍යන්තරයේ පිහිටි භ්‍රමණය වන ලෝක ගෝලය

## මැදිරි මධ්‍යස්ථයේ පිහිටි ලෝක ගෝලය

මෙහිදී අලංකාර දම් නිල් පැහැයෙන් යුතු ලෙඩ් විදුලි පටයක් ලෝක ගෝලය සහිත පීඨිකාව හා පොළව මතුපිට සවි කොට ඇති අතර එය භාවිත කොට ඇත්තේ එම ලෝක ගෝලය සඳහා අවශ්‍ය උපරිම සුවිශේෂත්වය ලබා දෙන පරිදිය.

එසේම මෙම ආලෝකකරණ පද්ධති නවීන තාක්ෂණය උපයෝගී කොට ගෙන සකසා ඇති බැවින් එම අදාල ස්ථානය හා අදාල භාණ්ඩ ආලෝකකරණය වන්නේ යම් පුද්ගලයෙකු එම ස්ථාන අසලට ගිය විට පමණි. මෙමගින් නරඹන්නා හට සුවිශේෂ අත්දැකීමක් ලබා දෙන අතර විදුලි ඉතිරියද සිදුකරයි.

## වාතාශ්‍රය

සිවිලිම මට්ටමෙන් සවිකොට ඇති කුඩා ඇලුමිනියම් ලූවර් පට සහිත වා කවුලු මගින් බාහිර වාතය මැදිරිය තුලට පැමිණීමට සලස්වා ඇත. මැදිරි තුල කණු මත ඉහල මට්ටමේ සවිකොට ඇති විදුලි පංකා මගින් ලුවර හරහා පැමිණි වාතය මැදිරි තුළ සංසරණය කරවයි.

අනාගතයේ මෙම මැදිරිය වායු සමීකරණය කරනු ලබන අතර එහිදී මෙම වර්තමාන වාතාශ්‍රය සපයන ක්‍රමවේදය ඉවත් කරනු ඇත.

## අවසන් ප්‍රතිඵලය

මෙලෙස සියලු කරුණු අධ්‍යයනය කොට, අදාල කෞතුකාගාරය මැදිරි විශේෂඥවරියන්ගේද සහයෙන් මෙම මැදිරි නවීකරණය ඉතා සාර්ථක ලෙස නිමා කරගත හැකිවිය.

එබැවින් ජාත්‍යන්තර ප්‍රමිතියට ගැලපෙන ලෙස නවීන ලෙස නිමකරන ලද ඉහත මැදිරිය සියලුම නරඹන්නන් හට සුවිශේෂි අත්දැකීමක් වනු ඇත.



අන්තර්ජාතික මට්ටමට නිමවූ ඔබට සුවිශේෂ අත්දැකීමක් පිරිනමන අලංකාර මැදිරි අභ්‍යන්තරය

සටහන: වරලත් වාස්තු විද්‍යාඥ චානා සමරසිංහ




වාස්තු විද්‍යා ග්‍රන්ථ ප්‍රකාශන මණ්ඩලය

## ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ ආයතනයේ සමාජිකයින්ට කෙරෙන ආරාධනයයි.

පාඨකයන්ගේ වාස්තු විද්‍යා දැනුමත් ඒ හා අත්වැල් බැඳ යන ගොඩනැගිලි කර්මාන්තය පිළිබඳවත්, වාස්තු විද්‍යාව හා සමගාමී ක්ෂේත්‍ර පිළිබඳවත් මනා දැනුමක් ලබාදෙන වාස්තු සඟරාව ඔබගෙන් ලැබෙන ප්‍රතිචාර ඉතා අගය කොට සළකයි. මෙය උසස් මට්ටමකින් පවත්වාගෙන යාමෙහිලා වාස්තු විද්‍යා සාමාජිකයින්ගේ කැප කිරීම ඉතා අගය කොට සළකන සංස්කාරක මණ්ඩලය ඔබගේ නිර්මාණ පාඨකයන් අතරට ගෙන යාමට අප සමඟ එක්වන ලෙස කරන ආරාධනයයි මේ.

සංස්කාරක

T: 071-880-0000 - rannjana@gmail.com



# පසු නූතනත්වයේ රිදී එළිය
# රොන්චැම්ප් දේව මැදුර









වාස්තු විද්‍යාව හෝ ගොඩනැගිලි නිර්මාණය යනු අනෙක් කලා මාධ්‍යයන් මෙන්, නිර්මාණකරුවාට රිසි සේ, කපා කොටා, අඹරා යළි ගොඩනැගිය හැකි සාමාන්‍ය කලා මාධ්‍යයක් නොවේ. වාස්තු විද්‍යාව යනු ප්‍රායෝගික කලා මාධ්‍යයකි. එහි කලාත්මක, විද්‍යාත්මක සහ දේශපාලනික කරුණු සියල්ලම ගොඩනැගිල්ලක් භාවිතයට ගැනීම යන සාධකය අසලදි ප්‍රායෝගිකත්වයට ඉඩ දි නිහඬ විය යුතුය. ඇතැම් විට එය කලා මාධ්‍යයක් නොව ප්‍රායෝගික විද්‍යාවක්ම  පමණක් යන අවස්ථාව දක්වා දිවෙයි. ගොඩනැගිල්ලක ප්‍රායෝගිකත්වය අභිබවා, ප්‍රකාශනාත්මක සහ කලාත්මක ලක්ෂණ වලට මුල්තැනක්  ගොඩනැගිල්ලක් නිර්මාණය කරන්නට වාසනාව ලැබෙන්නේ එහෙමත් වාස්තු විද්‍යාඥයෙකුහට පමණි.



වාස්තු විද්‍යා විෂය මාලාව තුළ අනිවාර්යයෙන්ම හදාරන ප්‍රංශයේ, රොන්චෑම්ප් හි පිහිටි නොත්රදාම් රොන්චෑම්ප් චැපල් හෙවත් "රොන්චෑම්ප් පල්ලිය" මෑත කාලීන ඉතිහාසය තුළ වඩාත්ම කතාබහට සහ ජනප්‍රියත්වයට පත් වූ වාස්තු විද්‍යාත්මක නිර්මාණය විය යුතුය. වසරකට ලොව විවිධ රටවල් වලින් පැමිණෙන සංචාරකයින් 80,000 ක් පමණ දැක බලාගන්නා මෙම ගොඩනැගිල්ල අයිෆල් කුළුණට පසුව ප්‍රංශයේ වැදගත්ම ස්මාරකය විය යුතුය.

දෙවන ලෝක යුධ සමයේ දි එල්ල වූ බෝම්බ ප්‍රහාර වලින් විනාශයට පත් වුණ නොත්රදාම් කතෝලික පල්ලිය නනැවත ඉදිකළයුතු බවට එහි කතෝලික සභාව තීරණය කිරීමෙන් පසු, එම නව ගොඩනැගිල්ල නිර්මාණය කිරීමට එවකට සිටි පිළිගත් වාස්තු විද්‍යාඥයෙකු වූ "ලේ කොබුසියර්" (Le Corbusier) ව එකඟ කර ගැනීමට ඔහුගේ මිතුරෙකු හට ඔහුට කිහිප වරක්ම ඇවිටිලි කරන්නට සිදු වූ බව කියවෙයි. 1950 වසරේ දි පැරණි නොරදාම් පල්ලිය පිහිටි භූමියට පැමිණි ප්‍රංශ සහ ස්විස් පසුබිමක් තිබූ "ලේ කබුසියර්" තමා එතෙක් මෙතෙක් නිර්මාණය කරන්නට යන සුවිශේෂිතම ගොඩනැගිල්ල නිර්මාණය කිරීමට එකඟ විය.

සාමාන්‍යයෙන් වාස්තු විද්‍යාඥයෙකුහට නොලැබෙන නිදහසක් එම කතෝලික සභාවෙන් කොබුසියර්ට





*"මට අවශ්‍ය වුණේ, නිශ්ශබ්දතාවය, සාමය සහ අභ්‍යන්තර සුවදායී බව දනවන සුළු තැනක් නිර්මාණය කරන්නයි" කොබුසියර් රොන්චැම්ප් පල්ලිය විවෘත කිරීම් උත්සවයේදි එසේ පැවසීය.*

හිමි වුණු අතර කිසිම සීමාකිරීමකින් තොරව තමාගේ සිතට නැගෙන ඕනෑම ආකාරයක නිර්මාණයක් කිරීමේ වරප්‍රසාදය කොබුසියර් වෙතට පැවිරිනි. "මට අවශ්‍ය වුණේ, නිශ්ශබ්දතාවය, සාමය සහ අභ්‍යන්තර සුවදායී බව දනවන සුළු තැනක් නිර්මාණය කරන්නයි" කොබුසියර් රොන්චැම්ප් පල්ලිය විවෘත කිරීම් උත්සවයේදි එසේ පැවසීය.

කඳුගැටයක් වෙතින් පැතිරෙන බෑවුමක් සහිත බිමක ඉදිව ඇති මෙම අපූර්වාකාරයේ ගොඩනැගිල්ල එවකට පැවති සියළු සම්ප්‍රදායන් අභිබවා යන්නක් විය. විශාල කුළුණු අලංකාර මෝස්තර රටාවන් සහ උස් වහලවල් වලින් සැදී සාම්ප්‍රදායික කතෝලික පල්ලි වල වාස්තු විද්‍යාත්මක ලක්ෂණ කිසිවකට ගැති නොවී කතෝලික ආගම තුළ සැඟව තිබුණු ආධ්‍යාත්මික ගුණය මතු කිරීමට කොබුසියර් තම නිර්මාණය තුළින් උත්සාහ ගත්තේය. කඳු බෑවුම මත පිහිටුවන ලද, කොන්ක්‍රීට් වලින් සැදි මූර්තිමය වස්තුවක් ලෙස දුරට පෙනෙන මෙම ගොඩනැගිල්ල පදනම් වී ඇත්තේ කවාකාරව පිහිටුවන ලද බිත්ති දෙකක් සහ අල්තාරයට ඉහළින් එසවෙන විසල් කුළුණකිනි. ඒවා යා කරමින් දෙව්ලොව දෙසට විහිදෙන කවාකාර කොන්ක්‍රීට් වහලය මෙම ගොඩනැගිල්ලෙහි අපූර්වත්වය වර්ධනය කරයි.

ගොඩනැගිල්ලෙහි මූලික හැඩය නිර්මාණය කිරීමේ දි කොබුසියර් "Golden proportion" හෙවත්





“සංරචනයෙහි දිව්‍යමය රීතිය” මත දැඩිව පිහිටා ඇති බවක් පෙනෙන්නේ දුටුවනින්ම එම ගොඩනැගිල්ල මිනිස් ඇසට ප්‍රිය උපදවන ගතියෙන් යුක්ත වීම නිසාවෙනි. කොන්ක්‍රීට් සහ ගඩොල්, සිමෙන්ති මුසු වුණු බිත්ති වලින් සාමාන්‍යයෙන් ප්‍රකාශ වන දැඩි රළු බව සුමට කරනු වස් යොදාගෙන ඇති ක්‍රමවේදය නම් සෘජු තියුණු හැඩතල වෙනුවට කවාකාර හැඩතල ගොඩනැගිල්ලෙහි ආකෘතියට එකතු කිරීමයි. පූජනීයත්වයේ සහ ආධ්‍යාත්මිකත්වයේ සංකේතීය වර්ණය වන සුදු පැහැයෙන් තම බාහිර පෙනුම දවටා ගෙන ඇති රොන්චෑම්ප් පල්ලිය වර්ණ ගැන්වීමට කබුසියර් භාවිතා කර ඇත්තේ වහලය වර්ණ ගන්වා ඇති අළුපැහැය පමණකි. එහි ඇති සරල වර්ණ සංකලනය පල්ලියෙහි බාහිර පෙනුම ඔසවා තබන තවත් විශේෂ ලක්ෂණයකි.

ආලෝකය සූක්ෂමව හසුරුවමින් දේවත්වය පිළිබඳව අත්දැකීමක් ලබා දීම කතෝලික පල්ලි වාස්තු විද්‍යාව තුළ කවදත් පැවතෙන ලක්ෂණයකි.





***අභ්‍යන්තර අවකාශ තුල පිරිසිදු නිදහස් ගතියක් ඇති කිරීම විනා අවකාශයන් සංකීර්ණ කිරීමට තමන්ට අවශ්‍ය නොවූ බවත් භාවනානුයෝගී බවක් ඇති කර ගොඩනැගිල්ලට පැමිණෙන්නන්ගේ සිත නිවා සැනසීම තමගේ අරමුණ වූ බව කොබුසියර් රෝන්චැම්ප් පල්ලිය ගැන විස්තර කරමින් පවසා ඇත.***

එම ලක්ෂණය සාම්ප්‍රදායික කතෝලික පල්ලිවල භාවිතා කර තිබුණු ක්‍රමවේදය තවත් දුරකට ගෙනයමින් කොබුසියර් රොන්චැම්ප් පල්ලිය නිර්මාණය කිරීමේදි එහි අපූර්වත්වය ඇති කරන්නේම  නිර්මාණශිලී ලෙස ආලෝකය හැසිරවීම මගිනි. වහලය සහ බිත්ති අතර අගල් කිහිපයක පටියක් විවෘතව තබමින් සිහින් රිදී පැහැ රේඛාවක් ලෙස ස්වභාවික ආලෝක ගොඩනැගිල්ල තුළට ගලා ඒමට සලස්වා එම ආලෝකය සුදු පැහැ බිත්ති අතරේ සෞම්‍ය ලෙස පැතිරයාමට සළස්වා ඇත. පල්ලියෙහි අනෙක් පස බිත්තිය මත කුඩා ප්‍රමාණයේ කොටු හැඩැති ජනෙල් පිහිටුවා ඒ මත රඳවා ඇති වර්ණ වීදුරු මඟින් පාරම්පරික මෝස්තර වීදුරු රටා නිර්මාණය කර ඇති අතර, සංකීර්ණ මෝස්තර රටා වෙනුවට ජ්‍යාමිතික හැඩතල මගින් සම්ප්‍රදායට ගතු නොවීමට කොබුසියර් වගබලාගෙන ඇත.

අභ්‍යන්තර අවකාශ තුල පිරිසිදු නිදහස් ගතියක් ඇති කිරීම විනා අවකාශයන් සංකීර්ණ කිරීමට තමන්ට අවශ්‍ය නොවූ බවත් භාවනානුයෝගී බවක් ඇති කර ගොඩනැගිල්ලට පැමිණෙන්නන්ගේ සිත නිවා සැනසීම තමගේ අරමුණ වූ බව කොබුසියර් රෝන්චැම්ප් පල්ලිය ගැන විස්තර කරමින් පවසා ඇත.

පසුකාලීනව ලොව පුරා විවිධ කලා සහ සංස්කෘතික අංශ තුල රැල්ලක් මෙන් පැතිරගිය

"පශ්චාත් නූතනවාදි" සංකල්පයට උරදුන් මුල්ම නිර්මාණයක් බවට සැළකෙණ රෝන්චැම්ප් පල්ලිය ලෝක වාස්තු විද්‍යා ක්ෂේත්‍රය වෙනස් කිරිමට බලපෑ ප්‍රධානතම සංධිස්ථානය ලෙස අදටත් පිළිගැනේ. වාස්තු විද්‍යාව යනු හුදෙක් ප්‍රායෝගික භාවිතය සඳහා බිහිවන මූලික මිනිස් අවශ්‍යතාවයක් යන අදහස අභිබවා "Expressionist Architecture", හෙවත් ප්‍රකාශනවාදි වාස්තු විද්‍යාව ලොවට හඳුන්වා දුන් අවස්ථාව ලෙසද විද්වතුන් විසින් මෙම ගොඩනැගිල්ල හඳුන්වා දෙයි.

පසුකාලීනව ලොව පුරා කතෝලික පල්ලි සම්ප්‍රදාය තුළ සුවිශේෂී ගොඩනැගිලි රාශියක් නිර්මාණය වීම සඳහා උදාහරන වූයේ රොන්චැම්ප් පල්ලියයි. වාස්තු විද්‍යාත්මක ලක්ෂණ මෙන්ම පාරම්පරික කතෝලික

***ජපන් වාස්තු විද්‍යාඥ ටඩාඔ අන්ඩෝ (Tadao Andopo) විසින් නිර්මාණය කර ලෝක වාස්තු විද්‍යා නිර්මාණ අතර ඉහලින්ම අගය කෙරෙන "ආලෝකයේ දෙව්මැදුර" හෙවත් "Church of Light" යනු කොබුසියර් විසින් හඳුන්වා දුන් ලක්ෂණයන්ගේ අග්‍රමූලය ලෙස හඳුන්වා දිය හැක.***

ආගමික සංකල්ප පවා වෙනස් අර්ථයකින් ගෙන හැර පෑමට එම ගොඩනැගිලි සම්ප්‍රදාය බලපා ඇති බව පෙනේ.

හුදෙක් දේවත්වය සහ දෙවියන් වහන්සේ යන භෞතිකමය සංකල්පය මතුකරන දේවරූප, කුරුසය සහ අනෙකුත් සංඛ්‍යාර්ථ වෙනුවට, දෙව් ලොව සහ දෙවියන්වහන්සේ යනු මිනිස් භවයෙන් පසු මිනිසා පරිවර්තනය වන වෙනත් ඉහළ තත්වයක් බව රොන්චෑම්ප් පල්ලිය සහ එයින් පසුව එම සම්ප්‍රදායේම නිර්මාණය වූ කතෝලික ගොඩනැගිලි තුළින් අර්ථ ගැන්වෙන්නට විය.

ජපන් වාස්තු විද්‍යාඥ ටඩාඔ අන්ඩෝ (Tadao Andopo) විසින් නිර්මාණය කර ලෝක වාස්තු විද්‍යා නිර්මාණ අතර ඉහලින්ම අගය කෙරෙන "ආලෝකයේ දෙව්මැදුර" හෙවත් "Church of Light" යනු කොබුසියර් විසින් හඳුන්වා දුන් ලක්ෂණයන්ගේ අග්‍රමූලය ලෙස හඳුන්වා දිය හැක. එමෙන්ම ලංකාව තුළ ජෙෆ්රි බාවා සහ උල්රික් ප්ලෙස්නර් (Geoffry Bawa and Ulrik Plesner) අතින් නිර්මාණය වූ බණ්ඩාරවෙල කන්‍යාරාම පල්ලිය සහ වාස්තු විද්‍යාඥ වැලන්ටයින් ගුණසේකර විසින් නිර්මාණය කෙරුණු රාගම තේවත්ත බැසිලිකා දෙව්මැදුර, හොරණ කතෝලික දෙව්මැදුර සහ දෙහිවල ජෙසුයිට් කතෝලික දෙව් මැදුර වැනි නිර්මාණ සියල්ලේම රොන්චෑම්ප් පල්ලියෙන් ලද ආභාෂය දක්නට ලැබෙන බව නොරහසකි.■

***සටහන - වරලත් වාස්තු විද්‍යාඥ සුමුදු අතුකෝරල***



# හදන ගෙදර

ගත්ත ලොකු වෙඩිම
ලීසිං වාහනය
හිරවුණු කුලී ඇනෙක්සිය
වෙඩිම.....වාහනය.... ඇනෙක්සිය
ණය වෙලා තව ගත්ත
පර්චස් හය
ටවුමේ කොණක
වෙඩිම ... වාහනය ... ඇනෙක්සිය .... ඉඩම...
ණය .... පොලී.... වාරිකය......

හදන්නට සිහිනය
අපේම ගෙදර
ඕනෑමයි කාමර හතර ... පහ
අරයලාටත් තියෙනවා හතරක්
නැතිවම බෑ අපිටත්...
ලොකු කාමර විසිත්ත
ඇල්ලූ දිලිසෙන මාබල....

ඔය කිව්වාට
යන් නෑ ඔච්චරම
හදා ගත හැකි අඩුවට ....
ගෙවන්නේ මොකද මෙච්චර
ආකිටෙක්ලාට මේ ඉරි ටිකට.....

හදනවා... හදනවා...
නෑ ඉවර...
පොඩි පුතා ලියයි
දැන් සා.පෙළ
අතේ ඇති ගානට
බැරිද හදන්නට
ගෙදර...?
ඉවරයක් නෑ මේක... ෟ

කාමර හතර පහ....
ලොකු කාමර විසිත්ත...
ඇල්ලූ දිලිසෙන මාබල ...
ඔය කිව්වාට
මොකද මෙච්චර
මේ ඉරි ටිකට....??

*වරලත් වාස්තු විද්‍යාඥ අනුක වෙත්තසිංහ*



# ආත්මීය නිවහන





වරලත් වාස්තු විද්‍යාඥ දමිත් ප්‍රේමතිලක

මනුෂ්‍යයන් වන අප සැමවිටම "අතීත කාමයන්හි" ඇලෙන සුළුය. එය තමා තුළ ඇතිවන ප්‍රීතිය හෝ දුක මත අඩු වැඩි වශයෙන් සිදුවන්නක් වේ. වාස්තු විද්‍යාව/වාස්තු විද්‍යාඥයා හා මෙම අතීත කාමය නැමැති අව්‍යාජ හැඟීම් යටපත් කරගෙන සිටින්නා වූ හැඟීම් අතර සුවිශේෂ සම්බන්ධතාවයක් පවතී. වාස්තු විද්‍යාඥයෙකු වශයෙන්, නිර්මාණයන්ට දායක වන සේවා දායකයාගේ අවශ්‍යතාවය මනාව වටහා ගැනීමටත් "අතිතකාමය" නැමැති සංකල්පය, සේවා දායකයා තුළින් ඉස්මතු කර ගැනීමටත් වාස්තු විද්‍යාඥයා අති දක්ෂ විය යුතුය. මක් නිසාද යත් සේවාදායකයා තුළ පැවති සමාජ තත්ත්වය ඔහු ලබා ගත් අත්දැකීම් කුඩා කල ජීවත් වූ පරිසරය, ඔහු ඇසුරු කළ ස්ථානයන්, ඔහුට හෝ ඇයට බැඳී පවතින වර්ණ පරාසයන් සම්බන්ධව අධ්‍යනයක් වාස්තු විද්‍යාඥයා විසින් සිදුකල යුතු බැවිනි.

සේවාදායකයෙකු වරලත් වාස්තු විද්‍යාඥයෙකු වෙත පැමිණෙන්නේ ඉතා විශාල එකිනෙකට පරස්පර වූ නිර්මාණයන් කිහිපයක් හෝ සිතුවිලි සමුදායක එකතුවක් සමගය. එය නිරාකරණය කොට නිවැරදි මගකට අවතීර්ණ කිරීම වාස්තු විද්‍යාඥයාගේ වගකීම වේ. වරලත් වාස්තු විද්‍යාඥ දමිත් ප්‍රේමතිලක නිර්මාණය සඳහා දායක වන මෙම නිවසෙහි, සේවා දායකයා තුළ ජනිත, ප්‍රායෝගික හා සෞන්දර්යාත්මක අර්ථ කථනයන් ක්‍රමිකව නිර්මාණය කිරීමට උත්සාහ ගෙන ඇත. පවතින ඉඩකඩ අර්ථාන්විතව යොදා ගනිමින් ඔහු සකස් කරන ලද අවකාශයන් ඉතා නිර්මාණශීලිය.

මෙහිදි පැහැදිලිව දකින්නට ලැබෙන්නේ පොදු හා පෞද්ගලික අවකාශයන්හි බෙදීමයි. තවද සේවා දායකයාගේ ප්‍රායෝගික දිවිය තුළ ඇති වන ගැටලු නිරාකරණය වන අතර පොදු අවකාශ සඳහා උපකාරක පද්ධතීන් ඒ අසලම පිහිටුවා තිබීම දක්නට ලැබේ. නිවෙස ප්‍රධාන වශයෙන් H හැඩයක් ගන්නා අතර මධ්‍යයෙහි පවතින පිහිනුම් තටාකය (Swimming Pool) මගින් ප්‍රායෝගික අවකාශය තවදුරටත් බෙදීමක් සිදුකර තිබේ. තවද ඒ මගින් මධ්‍යයෙහි පවතින විසිත්ත කාමරය (Living Room) හා පොදු කෑම







**හැකි සෑම විටම වාස්තු විද්‍යාඥයෙකු වශයෙන් පවතින පරිසර පද්ධතීන්ට අභ්‍යන්තර අවකාශයන් විවෘත කරවීම සිදුකල යුතුය.**

කාමරය තුළ මවා ඇති සෞන්දර්යාත්මක පරිසරය මනබඳින සුළුය. තවද එම අවකාශය වටා පවතින නිදන කාමර සහ අනෙකුත් පෞද්ගලික අවකාශ සඳහා ද පිහිනුම් තටාකයෙහි සෞන්දර්යය මනාව එක් කොට තිබේ. සෑම අවකාශයක් සඳහාම විවෘත වන කවුළු තුලින්, ගේතුළ ඇතිවන සිසිලස සහ මනා ආලෝකය මෙහි විවිධත්වය හා සෞන්දර්යය තව තවත් තීව්‍ර කරවයි. හැකි සෑම විටම වාස්තු විද්‍යාඥයෙකු වශයෙන් පවතින පරිසර පද්ධතීන්ට අභ්‍යන්තර අවකාශයන් විවෘත කරවීම සිදුකල යුතුය. විශේෂයෙන්ම ස්වභාවික සුළඟ සංසරනය කරවීම, හිරු එළිය පාලනයකින් යුතුව ගේතුළ පැතිරවීම ඉතා වැදගත් අවශ්‍යතාවයක් ලෙස දැක්විය යුතුය. දමිත් ඔහුගේ සේවාදායකයාගේ අත්දැකීම් නිසියාකාරව ස්ථානගත කිරීමෙනුත් උද්දීපනය කිරීම තුළිනුත් ප්‍රියාදායක නිවසක් ඔවුනට උරුම කර දී ඇත. මෙහිදී ප්‍රධානතම කරුණ නම් වරලත් වාස්තු විද්‍යාඥයෙකු උත්සාහ කරනුගේ තමාගේ පෞද්ගලික මතයන් සේවාදායකයාට උරුමකරදීම නොවන අතර සේවාදායකයා තුලින් මතුවන හැඟීම්, අත්දැකීම් හා ඔහුගේ ප්‍රායෝගික අවශ්‍යතාවයන් වාස්තු විද්‍යාඥයා තුලට ආරෝපණය කරගෙන වඩා සංවේදි නිර්මාණයක් තම සේවාදායකයට උරුමකර දීමයි.

මෙම නිවසෙහි වර්ණ භාවිතයන් හා අමුද්‍රව්‍ය භාවිතයන් සම්බන්ධව විශේෂ යමක් සටහන් කළ යුතුව ඇත. වර්ණයන් යනු ජීවිතය තුල සුවිශේෂීව බලපැවැත්වෙන සංකල්පයකි. එහි ප්‍රායෝගික මෙන්ම මානසික වශයෙන් ද බලපානු ලබන කරුණු රාශියක් ඇත. මෙම නිවසෙහි දක්නට ලැබෙන වර්ණයන්, අමුවර්ණ නොවන අතර (Saturation Down) ඉතා ප්‍රියමනාප ලෙස මෙම අවකාශයන් හා මුසු කර ඇත. ත්‍රිමාන ලක්ෂණ පෙන්වීම සඳහාත් ස්වාභාවිකව පිටත අවකාශයන්ගෙන් ඇතුලට පතිත වන සෙවණැලි (Shadows) හා එමගින් ඇති වන චලනයන් තීව්‍ර (Sharpe) කිරීමටත් මෙම වර්ණයන් යොදා ගෙන තිබේ. තවද මෙහි දක්නට ලැබෙන ගෘහ භාණ්ඩ සඳහා කැපී



**මෙහිදී ප්‍රධානතම කරුණ නම් වරලත් වාස්තු විද්‍යාඥයෙකු උත්සාහ කරනුගේ තමාගේ නිර්මිතයන් සේවාදායකයාට උරුමකරක්‍ෂම නොවන අතර සේවාදායකයා තුලින් මතුවන හැඟීම්, අත්දැකීම් හා ඔහුගේ ප්‍රායෝගික අවශ්‍යතාවයන් වාස්තු විද්‍යාඥයා තුලට ආරෝපණය කරගෙන වඩා සංවේදි නිර්මාණයක් තම සේවාදායකයට උරුම කර දීමයි.**

පෙනීමක් ඇති කිරීමටද මෙම වර්ණ සංයෝජනය මනා මෙහෙයක් ඉටු කරනු ලබයි. මීට අමතරව වඩාත් අගය කළ යුතු වාස්තු විද්‍යාත්මක සහ අභ්‍යන්තර අලංකරණයේ විශේෂත්වය නම් ස්වභාකවික අමුද්‍රව්‍ය මගින් ලැබෙන වර්ණ කෘතීම වර්ණ හා මනාව සංයෝජනය කර තිබීමයි. කළුගල් බිත්ති මත ඇති වන පැහැය කාලයට නිරාවරනය වීමෙන් වෙනස් වන අවකාශයන් තුල මා පෞද්ගලිකවම නිරාමිස සුවයක් ලබමි.

මනෝ මූලික අවකාශයන් කෘතීම ආලෝක ප්‍රභව හැසිරවීම තුළින් නිර්මාණය කිරීම නවීන ලෝකය තුල ඉතා ප්‍රචලිතය. (Virtual Spaces with Artificial Lighting) මනෝ මූලික සීමාවන් ආලෝකය හා අඳුර අතර පවතින කළමණාකරණයක් තුළින් එම පරිසරය අත්විඳින්නන් තුළ නව්‍යමය හැඟීමක් ඇති කර දීමට උදව් වේ. දමිත්, මෙම කෘතිම ආලෝක ප්‍රභව යොදා ගනිමින් ආලෝකය හා අඳුර අතර පවතින මනෝ මූලික සම්බන්ධීකරණය ඉතා නිර්මානශීලීව සිදුකර ඇත.

මෙහි අගය කළ යුතු තවත් කරුණක් වන්නේ, නිවස ඇතුල මෙන්ම පිටත ද ඇතිවන නිදහස් හා සංතුලිත අවකාශයන් යා කිරීමට උපයෝගී කරගත් නිර්මාණශීලි උත්සාහයයි. එය නිවස අවට පවතින තුරු වැල් මත ද පතිත කරමින් එහි චලනයන් හා සෙවණැලි තිව්‍ර කරවීමට ඉඩ ලබාදීමට ගත් වෙහෙසද අගය කළ යුතුව ඇත.

ඕනෑම නිවසක් තුළ නිවැසියා තම ස්වභාවික චර්යාවෙන් ජීවත්විය යුතුය. එම නිවස තමා තුල මෙන්ම තමාගේ ආත්මය තුලටද කා වැදි ඇත්නම් එය සැබැවින්ම නිවැසියා වෙනුවෙන්ම නිර්මාණය වුවක් වේ. මෙය මේ ආකාරයෙන් සිදු වීමට නම් තම සිතැඟියාවන් නොසඟවා වාස්තු විද්‍යාඥයා වෙත ඒ ආකාරයෙන්ම ලබා දීම තුළින් තම ආත්මීය නවාතැන උරුම කර ගත හැකිය. ■

*සටහන - වරලත් වාස්තු විද්‍යාඥ සමීර ධර්මසේන*



වාස්තු විද්‍යාවේ
ප්‍රජා නියෝජනය

# ඔබේ වාස්තු විද්‍යාඥයා සහ ඔබ

වාස්තු විද්‍යා වෘත්තීය අනෙකුත් සේවා සපයන වෘත්තීන් මෙන්ම පුද්ගලික මට්ටමින් හෝ පොදු වශයෙන් මිනිසා හෝ සමාජය සඳහා සේවය සපයන වෘත්තියකි. නමුත් කෙනෙක් වාස්තු විද්‍යාඥයෙකුගේ සේවය බලාපොරොත්තු වන්නේ තමන්ට සිදුවන කරදරයකදී හෝ අසාධාරණ අවස්ථාවන්හි දී නොවේ. ඔබ වෛද්‍යවරයකුගේ සේවය බලාපොරොත්තු වන්නේ සෞඛ්‍ය ගැටළුවකදී වන අතර ඔබ නීතිඥවරයකුගේ පිහිට පතන්නේ ඔබට මුහුණපාන්නට වන අසාධාරණයකදී හෝ සිදුවන වැරදීම් නිසාය. එවන් අවස්ථාවලදී වෛද්‍යවරයා හෝ නීතීඥවරයා ලබාදෙන උපදෙස් යටහත් පහත්ව ඔබට පිළිගැනීමට සිදුවනු ඇත. ඒ ඒ විෂය ක්ෂේත්‍ර තුළ තියුණු දැනුමක් සහ අත්දැකීම් සමුදායක් ඇති එම වෘත්තිකයින්ගේ උපදෙස් සහ අදහස් අභිබවා ඔබ තර්ක විතර්ක කරනු ඇත්තේ ඉතාම කළාතුරකිනි. නමුත් වාස්තු විද්‍යාව එතරම් සංකීර්ණ විෂය ක්ෂේත්‍රයක් ලෙස පොදුවේ සැළකෙන්නේ නැති තරම්ය. එයට හේතුව බොහෝ විට සමාජය තුළ පිළිගෙන තිබෙන්නේ වාස්තු විද්‍යාත්මක ලෙස ගොඩනැගිල්ලක් නිර්මාණය කර ගැනීමට වඩා "ප්ලෑන් එකක් ඇඳග න්නවා" හෝ "බිල්ඩින් ප්ලෑන්" වැනි සරල කාරණයක් ලෙස මෙම වෘත්තිය හඳුනා ගැනීමයි. වාස්තු විද්‍යාව යනු හුදෙක් ප්ලෑන් එකක් ඇඳීම යන්න ඉක්මවා ගිය බොහෝ විද්‍යාත්මක, තාක්ෂණික සහ කලාත්මක විෂය පථයකින් සැදී සංකීර්ණ වෘත්තියකි. වරලත් වාස්තු විද්‍යාඥයකු බිහි වීමට ගත වන අධ්‍යාපනික කාල පරාසය අවුරුදු හතක් පමණ දිගු වන්නේ වාස්තු විද්‍යා ශිෂ්‍යයෙකු විවිධ විෂය ක්ෂේත්‍රයන්, ගැඹුරින් හදාරා තාක්ෂණික අත්දැකීම් ද ලබාගත යුතු බැවිනි. හුදෙක් ප්ලෑන් එකක් ඇඳීම වෙනුවට ඉඩමක් තෝරාග ැනීමේ සිට ගොඩනැගිල්ලක සැළැස්ම නිර්මාණය කර එම ගොඩනැගිල්ල ඉදිකර අවසන් වන තෙක්ම සහ ගොඩනැගිල්ල භාවිතා කිරීමේදි පවා ඔබේ වාස්තු විද්‍යාඥයා ඔබට සේවය සහ උපදෙස් ලබා දෙනු ඇත. එය ඉමහත් භාරදූර කර්තව්‍යයකි. බොහෝ අවස්ථාවන්වල ගොඩනැගිල්ලක් නිර්මාණයකර ඉදිකිරීම අවසන් වන විට සේවාදායකයා සහ වාස්තු විද්‍යාඥයා ඉතා හොඳ මිතුරන් බවට පත්වීම සාමාන්‍ය තත්වයකි.

එමෙන්ම ගොඩනැගිල්ලක් ඉදිකිරීම යනු තනි පුද්ගලයකුගේ හෝ දෙදෙනෙකුගේ කාර්යභාරයක් නොවේ. ඒ සඳහා විවිධ වෘත්තීමය සහ තාක්ෂණික ශ්‍රමය අවශ්‍යය වේ. සේවාදායකයා සිවිල් ඉංජිනේරුවන් සහ ප්‍රමාණ සමීක්ෂකයා ඇතුළු අනෙකුත් වෘත්තිකයන් සමග එක්ව කටයුතු කිරීම සහ එම කණ්ඩායමේ ප්‍රධානියා ලෙස වාස්තු විද්‍යාඥයා හට බාරදූර වගකීමක් පැවරෙයි. ඊට අමතරව ඉදිකිරීම් වැඩ බිමේදී ප්‍රධාන කොන්ත්‍රාත්කරු, වඩු කාර්මික ශිල්පීන්, ජලනල කාර්මික ශිල්පීන්, විදුලි කාර්මික ශිල්පීන් ඇතුළු විවිධ ශිල්පීන්ගේ ක්‍රියාකාරකම් අධීක්ෂණය කරමින් ඔවුන්ට නිවැරදි උපදෙස් ලබා දෙමින් තමන්, තම සේවාදායකයාගේ අවශ්‍යයතාවයට සරිලන ලෙස, නිර්මාණය තුළ ගොඩනැගිල්ල ඒ අයුරින්ම ඉදිකිරීම සඳහා වාස්තු විද්‍යාඥයා වෙත පැවරෙන වගකීම සුළුපටු සරල කාරණයක් නොවේ.

මෙම සම්පූර්ණ නිර්මාණය සහ ඉදි කිරීම් කර්තව්‍යය තුළ වාස්තු විද්‍යාඥයාගේ සහ සේවාදායකයාගේ සමීප අවබෝධයෙන් යුතු සම්බන්ධතාවය ඉතාම වැදගත් වේ. එම සම්බන්ධතාවය නිර්මාණ කාර්ය ආරම්භයේදි තහවුරු වී ඉදිකිරීම් අවසන් වනතුරුත් සහ ඉන්පසුවත් නොබිඳී පැවතීම ඉතා වැදගත් වේ.

එම සම්බන්ධතාවය තහවුරු වීම සඳහා සේවාදායකයා සහ වාස්තු විද්‍යාඥයා අතර මුලදීම ඇති කරගත යුතු අවබෝධය මුළු මහත් නිර්මාණ සහ ඉදිකිරීම් කටයුතු වල පදනම වේ. එම අවබෝධය ඇති කර ගැනීම සඳහා පහත දැක්වෙන කරුණු මුලදීම සාකච්ඡා කර එකඟතාවයකට පත්වීම වැදගත් වනු ඇත. මෙම කතාබහ විවෘතව සහ මිත්‍රශීලිව සිදුවන විට දෙදෙනා අතර සහයෝගය සහ අවබෝධය ඉතාම ප්‍රියජනක අත්දැකීමක් වනු ඇත.

### 1). පළමු හමුවීම

ඕනෑම මිතුරුකමක හෝ මානුෂික සම්බන්ධතාවයක පළමු හමුවීම ඉතාම වැදගත් වන බව අමුතුවෙන් කිව යුතු නැත. ඔබ ඔබගේ නිවස හෝ ගොඩනැගිල්ල





නිර්මාණය කිරීම සඳහා වාස්තු විද්‍යාඥයකු තෝරාගැනීමෙන් පසුව බොහෝ විට දුරකථන ඇමතුමක් මගින් පළමු හමුවීම සඳහා දිනයක්, වේලාවක් සහ තැනක් කතා බහ කරගත හැක. බොහෝ විට ඒ වාස්තු විදයාඥයාගේ කාර්යාලය හෝ ගොඩනැගිල්ල ඉදි කිරීමට බලාපොරොත්තු වන ඉඩම විය හැක. ඒ කෙසේ වෙතත්, පළමු හමුවීමේදීම අන්‍යයෝනය අවබෝධය තහවුරු කරගැනීම වැදගත් වේ. ඔබට ඉදිකර ගැනීමට අවශ්‍ය නිවසක් ද නැත්නම් වෙනත් ගොඩනැගිල්ලක්ද ඉඩම පිහිටි ස්ථානය, වැනි කරුණු ඔබට පළමු හමුවේදී වාස්තු විද්‍යාඥයා සමග කතාබහ කළ හැක. එමෙන්ම ඒ සම්බන්ධව ඔබ තුළ ඇති ගැටළු හෝ අපැහැදිලිතාවයන් ඔබට වාස්තු විද්‍යාඥයා වෙත ඉදිරිපත් කර ඒවාට විසඳුම් ලබාගත හැක. මෙහිදී ඔබ ඔබට අවශ්‍ය ගොඩනැගිල්ලේ ස්වාභාවය පිළිබඳව ඔබගේ වාස්තු විද්‍යාඥයාට විස්තර කිරීම වරදක් නොවේ. ඔබේ කැමති අකැමැතිකම්, සිතුම් පැතුම් මෙන්ම ඔබ සහ ඔබගේ පවුලේ සාමාජිකයන්ගේ ජීවන විලාසය වාස්තු විද්‍යාඥයා හට අවබෝධ වීමට ඉඩ හැරීම ඉතාම වැදගත් දෙයකි. තමන් කැමති ගොඩනැගිලි වල පින්තූර සඟරා හෝ පුවත්පත් වලින් කපාගෙන ඒවා තම වාස්තු විද්‍යාඥයාට ඉදිරිපත් කිරීම නුවණැති දෙයක් නොවේ. ඔබ සහ පවුලේ සාමාජිකයන් හෝ ගොඩනැගිල්ලේ ස්වාභාවය ගැන ඔබගේ අවංක අදහස් ඉදිරිපත් කිරීම මගින් ඔබගේ වාස්තු විද්‍යාඥයා එම ගොඩනැගිල්ල කුමන ආකරයක ගොඩනැගිල්ලක් විය යුතුද යන්න ගැන දළ අදහසක් ලබාගනු ඇත. නමුත් ඔබ පත්තරවලින් එකතු කරගත් සැළසුම් හෝ ඉදිරිපස පෙනුම යනාදිය ඉදිරිපත් කර ඔබගේ වාස්තු විද්‍යාඥයා එක් රාමුවකට කොටු කිරීම ඔබ ඔබටම සිදුකරගන්නා පාඩුවකි. ඔබ ඔබගේ අවශ්‍යතාවය ඔබගේ ජීවන විලාසය සහ ඔබ ඔබගේ නිවස හෝ ගොඩනැගිල්ල තුළ අත්දැකීමට කැමති ස්වභාවය ඔබගේ වාස්තු විද්‍යාඥයාට තේරුම් කර දීම පමණි ඔබ කළ යුත්තේ. දක්ෂ වාස්තු විද්‍යාඥයෙකු එම සියළුම කරුණු මැනවින් අවබෝධ කරගෙන ඔබට ඉතාමත් ගැලපෙන ඔබගේ ජීවිතය තවත් පියවර කිහිපයක් ඉදිරියට ඔසවා තබන සහ අලංකාර මෙන්ම ප්‍රායෝගික ගොඩනැගිල්ලක් නිර්මාණය කර දෙනු ඇත.

ඔබගේ අවශ්‍යයතාවය සළකා බලා වාස්තු විදයාඥයා විසින් ඔබ වෙත ඉදිරිපත් කරන නිර්මාණය ගැන මනා අගැයීමකින් පසුව ඔබට ඔබගේ වාස්තු විද්‍යාඥයා සමග එම නිර්මාණයේ ඔබ කැමති සහ අකමැති අංග දීර්ඝ ලෙස සාකච්ඡා කළ හැක. එය ඔබගේ අයිතියකි. නමුත් එම නිර්මාණය කිරීමට හෝ ඔබ ඔබේ වාස්තු විද්‍යාඥයාගේ නිර්මාණ සක්‍යතාවය රාමුගත කිරීම ඔබ ඔබට සිදුකරගන්නා විශාලතම පාඩුවයි.

### 2). ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ඔබ හට වෙන්කල හැකි ප්‍රාග්ධනය

ඔබගේ වාස්තු විද්‍යාඥයා සහ ඔබ අතර සියට සියයක්ම අවංක අවබෝධයක් ගොඩනැගිල්ල ඉදිකිරීමේ සියළු අංශයක් කෙරෙහිම තිබිය යුතුය. මෙහිදී බොහෝ දෙනෙක් විසින් කෙරෙන වරදක් වන්නේ තමන්ට අවශ්‍ය ගොඩනැගිල්ල ඉදිකිරීමට තමන්ට වෙන් කළ හැකි මූල්‍යමය ප්‍රාග්ධනය ගැන විවෘතව සහ අවංකව තම වාස්තු විද්‍යාඥයාට දැනුම් නොදීමයි. ඔබ ඒ සඳහා කොපමණ මුදලක් ඉතිරි කරගෙන තිබේද? බැංකු ණයක් සඳහා අයදුම් කරන්නේ නම් ඒ කොපමණ මුදලක්ද, අමු ද්‍රව්‍ය සම්බන්ධයෙන් ඔබගේ පුද්ගලික සම්බන්ධකම් මඟින් නොමිලේ හෝ අඩු මුදලකට ඔබට ලබාගත හැකිද යන සියළුම මූල්‍යමය කාරණා අවංකව ඔබගේ වාස්තු විද්‍යාඥයා සමග සාකච්ඡා කිරීමෙන් ඒ සම්බන්ධව ඇතිවිය හැකි ගැටළු මුලදීම වළකාගත හැකි වනු ඇත. ඔබට කාමර පහක් සහිත වර්ග අඩි පන්දාහක් පමණ විශාල නිවසක් ඉදිකරගත යුතු වුවත් ඔබට දැරිය හැකි ප්‍රාග්ධනය එම අවශ්‍යතාවය සමග නොගැලපේ නම් ඔබගේ වාස්තු විද්‍යාඥයා මුලදීම ඔබට ඒ සම්බන්ධව උපදෙස් ලබා දෙනු ඇත. එවැනි අවස්ථාවක එම නිවසෙහි කාමර ගණන, නාන කාමර ගණන, වර්ග ප්‍රමාණය වැනි අංග බැහැර කළ යුතු බව ඔබගේ වාස්තු විද්‍යාඥයා ඔබට මනාව පැහැදිලි කර දෙනු ඇත. එසේ නොමැති නම් තමන්ට අවශ්‍ය



කරන සියළුම අංග සහිතව නිවස ඉදි කිරීමට ඔබගේ ප්‍රාග්ධනය සඳහා බැංකු ණයකින් හෝ වෙනත් ආකාරයකින් මූල්‍යමය අංශය වර්ධනය කරගැනීමට ඔබට සිදුවනු ඇත. එසේත් නොමැති නම් ඔබගේ අතෙහි ඇති මුදලට සරිලන ලෙස නිවසෙන් කුඩා ප්‍රමාණයක් පමණක් පළමුව ඉදිකර පසුකාලීනව අනෙකුත් අංග එකතු කළ හැකි ද යන්න ගැන ඔබට ඔබගේ වාස්තු විද්‍යාඥයා සමග විවෘතව සාකච්ඡා කල හැක.

ඕනෑම කෙනෙක් තමන්ට අවශ්‍ය නිවස හෝ ගොඩනැගිල්ල ගැන සිහින දකිද්දී එය බොහෝ විශාල මෙන්ම අවශ්‍ය සහ සැබැවින්ම අවශ්‍ය නොවන අංග වලින් පිරී පැවතීම සාමාන්‍ය තත්වයකි. නමුත් මේ සියල්ල තීරණය වන්නේ ඔබට ඒ සඳහා දැරිය හැකි වියදම මතය. එබැවින් ඔබට දැරිය හැකි වියදම සමග ඔබට අවශ්‍ය ගොඩනැගිල්ල සමපාත කර සෑම අයුරකින්ම ඔබට ගැලපෙන , ඔබට දැරිය හැකි වියදමට ගැලපෙන ගොඩනැගිල්ල පිළිබඳව වාස්තු විද්‍යාඥයා සමග පැහැදිලි අවබෝධයකට පැමිණීම ඉතාම වැදගත් වේ.

**3). වාස්තු විද්‍යාඥයාගේ සේවය සහ අය කිරීම්.**

වරලත් වාස්තු විද්‍යාඥයන්ගේ සේවය සඳහා අය කිරීම හෝ ගාස්තු අධික බව බොහෝ දෙනෙක් තුළ පවතින කිසි පදනමක් නැති මතයකි. එයට හේතුව වාස්තු විද්‍යාඥ සේවය හුදෙක් "ප්ලෑනක් ඇඳීම" යන සම්පූර්ණයෙන්ම වෙනස් කාරණා දෙකක් පටලවා ගැනීමයි. නිසි අධ්‍යාපනය හෝ පිළිගත් සුදුසුමක් නැති "ප්ලෑන් අඳින්නන්" ඔබට සුලබව දකින්නට ලැබෙනු ඇත. විවිධ කඩ කාමරවල පුවරු සවි කරගෙන මෙන්ම දැන් දැන් අන්තර්ජාලය ඔස්සේ පවා සුදුසුකම් හෝ නිවැරදි අධ්‍යාපනික පසුබිමක් නැති ව්‍යාජ ආර්කිටෙක්ට්ලා වාස්තු උපදේශකයන් සහ ප්ලෑන් අඳින අය පිළිබඳව නිවැරදි සොයා බැලීමක් කිරීමට කාලය පැමිණ ඇත. එවැනි අයෙක් ඔබගේ ප්ලෑන් එක ඇඳීමට වර්ග අඩියකට ඉතා සුළු මුදලක් අය කරනු ඇත. නමුත් එම සැළැස්ම නිර්මාණය කිරීම සඳහා ඔහු හෝ ඇය ගතකරන කාලය සහ ශ්‍රමය ප්‍රශ්න කිරීමට ඔබට වගකීමක් ඇත. අන්තර්ජාලය ඔස්සේ ලබාගත් ප්ලෑන් 500 තමන් සතුව ඇතැයි සඳහන් වෙළඳ පුවරු පවා ඔබට දකින්නට ලැබෙනු ඇත. ඔබට අවශ්‍ය ගොඩනැගිල්ල අන්තර්ජාලයෙන් ලබා ගැනීමට ඔබ වියදමක් දැරිය යුතුද? ඔබ ජීවිත කාලයටම ඉදිකරන එකම නිවස හෝ ගොඩනැගිල්ල එතරම් පහත් තැනකට දැමීමට ඔබ සූදානම් ද?

සෑම වරලත් වාස්තු විද්‍යාඥයකුම ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයන්ගේ ආයතනයෙහි සාමාජිකයන් වන අතර, ඔවුන් එම ආයතනය විසින් ප්‍රකාශිත ප්‍රතිපත්ති වලට බැඳී සිටී. එයට අනුව වාස්තු විද්‍යා සේවය සැපයීම සඳහා නිර්දේශ කරන ලද සේවා ගාස්තු ක්‍රමවේදයකට අනුව සෑම වාස්තු විද්‍යාඥයකුම තම සේවය ලබාදිය යුතුය. එමෙන්ම වාස්තු විද්‍යාඥයකුගේ සේවය හුදෙක් සැළැස්මක් නිර්මාණය කිරීම වෙනුවට මුළු ගොඩනැගිලි නිර්මාණ සහ ඉදිකිරීම් ක්‍රියාවලිය දක්වාම දිවෙයි. එම සේවා අංග සරලව විස්තර කළහොත් මුලින්ම ඔබගේ ඉඩම පරීක්ෂා කර හෝ ඉඩමක් සොයා ගැනීම සඳහා පවා ඔබට සහය දක්වනු ඇත. ඉන්පසුව ඔබගේ අවශ්‍යතාවය සහ ප්‍රාග්ධනයට ගැළපෙන ලෙස මූලික සැළැස්ම නිර්මාණය කරනු ඇත. පසුව එම සැළසුම සමග ඔබ සමග දීර්ඝව සාකච්ඡා කර එයට අවශ්‍ය ඉවත් කිරීම් හෝ එකතු කිරීම් සිදුකරනු ඇත. එම සැළැස්ම රාජ්‍ය ආයතන වල අනුමැතිය සඳහා යොමු කිරීමට අවශ්‍ය සැළසුම් නීත්‍යානුකූල ලෙස සකසා දෙන අතර ගොඩනැගිල්ලට අවශ්‍ය ව්‍යුහමය සැළසුම් සහ ප්‍රමාණ සමීක්ෂණය සඳහා අවශ්‍ය වෘත්තිකයින් හඳුන්වා දී ඔවුන් සමග කණ්ඩායමක් ලෙස කටයුතු කරනු ලැබේ. ඉන්පසු ඉදිකිරීම් සඳහා කොන්ත්‍රාත්කරුවකු තෝරා ගැනීමට අවශ්‍ය කරන ක්‍රියාපටිපාටිය සඳහා මූලික වී කටයුතු කරනු ඇත. ඒ සමගම ඉදිකිරීම් වැඩබිමට අවශ්‍ය සියළුම සැළසුම් සහ උපදෙස් ඔබ වෙත ලබාදෙනු ඇත. අවසාන වශයෙන් ඉදිකිරීම් කටයුතු කරගෙන යන අතර නිරන්තරව වැඩ බිම පරීක්ෂාකර අවශ්‍ය උපදෙස් සහ අතිරේක සැළසුම් විස්තර ලබා දෙනු ඇත.

ගොඩනැගිල්ල ඉදිකර අවසන් වී ඔබ එම ගොඩනැගිල්ල භාවිතයට ගන්නා අවස්ථාව දක්වාත්



ඇතැම් විට ඊට පසුවත් ඔබට අවශ්‍ය වාස්තු විද්‍යාත්මක උපදෙස් ලබා දීමට ඔබගේ වාස්තු විද්‍යාඥයා සැදී පැහැදී සිටී.

විශේෂත්වය වන්නේ වාස්තු විද්‍යාඥයකු තම ගාස්තු අයකරන්නේ මේ දැවැන්ත කාර්යභාර්ය වෙනුවෙන් වන අතර මේ එක් එක් පියවර සඳහා මුලින් එකඟ වන සේවා ගාස්තු කොටස් වශයෙන් අයකරනු ලැබේ. ඔබ බුද්ධිමත්ව කල්පනා කර බැලුවහොත් ඉදිකිරීම් කටයුත්තක මුලසිට අග දක්වාම ඔබ වාස්තු විද්‍යාඥයකු සමග කටයුතු කරන විට ඔබ ඒ වෙනුවෙන් වැය කරන ගාස්තුවට වඩා කිහිප ගුණයක වාසියක් ලබනු අත. එයට හේතුව වන්නේ ඉදිකිරීම් ක්‍රියාවලිය පුරාම ඔබට නිවැරද උපදෙස් දෙන වාස්තු විද්‍යා ක්ෂේත්‍රය පිළිබඳ නිවැරදි දැනුම සහ අත්දැකීම් ඇති වෘත්තිකයකු ඔබ සමග සිටින නිසාවෙනි. එමගින් ඉදිකිරීම් ක්‍රියාවලිය තුල අක්‍රමිකතා සහ අනුකූලතාවයකින් තොරව අමුද්‍රව්‍ය භාවිතය හෝ වෙනත් කිසිම දෙයක් සිදුවන්නට අවකාශයක් නොමැත. එමඟින් ඔබ ඉදිකිරීම සඳහා වියදම් කරන ධනය උපරීම පලදායිතාවයක් සිදුවන බවට ඔබට වැටහෙනු ඇත.

### 4). ඉදිකිරීමට බලපොරොතතු වන ඉඩම නිරීක්ෂණය කිරීම.

ඔබට අවශ්‍ය ගොඩනැගිල්ල ඉදිකිරීමට නියමිත ඉඩම ඔබ තෝරාගෙන නැති නම් ඔබට ඒ සදහාද වාස්තු විද්‍යාඥයකුගේ සහය ලබා ගත හැක. ඔබ ඔබට කැමති වරලත් වාස්තු විද්‍යාඥයකු තෝරාගෙන මුල සිටම ඔහුගේ උපදෙස් පරිදි කටයුතු කිරීමෙන් බොහෝ කරුණු පිළිබඳව ඔබට පැහැදිලි විශ්වාසයකින් කටයුතු කළ හැක.

ඔබ දැනටමත් එම අදාළ ඉඩම පිළිබඳව තීරණය කර ඇති නම් වරලත් වාස්තු විද්‍යාඥයෙකු තෝරාගත් පසුව ඔහු හෝ ඇය විසින් එම ඉඩම පරීක්ෂා කළ යුතු බව අනිවාර්යයෙන්ම පවසනු ඇත. එම ඉඩමට අදාළ භූගෝලීය ලක්ෂණ අවට ප්‍රදේශය වෘක්ෂලතා වල පිහිටීම පසෙහි ස්වාභාවය රාජ්‍ය ආයතනවල නීති රීති වලට අනුකූලව ඔබට ඉදිකිරීම කළ හැකි ආකාරය වැනි විවිධ කරුණු වාස්තු විද්‍යාඥයකු හට නිරීක්ෂණය කළ හැක්කේ එම ඉඩම සියැසින් දැක බලා ගැනීමෙන් පසුය. ඔබ සිතා සිටින ගොඩනැගිල්ල ඒ අයුරින්ම එම ඉඩම තුළ ඉදිකළ හැකිද? නැතිනම් කුමන ආකාරයේ වෙනස් කම් ඔබේ මූලික අදහසට කළ යුතුද යන්න ගැන ඔහු හෝ ඇය ඔබට නිවැරදි උපදෙස් ලබා දෙනු ඇත.

සෑම වාස්තු විද්‍යාඥයකුම එම අදාළ ඉඩමෙහි ස්වභාවික ලක්ෂණ මනාව හඳුනාගෙන, ස්වාභාවක පරිසරයට අවම හානියක් සිදුවන ලෙස ගොඩනැගිල්ලක් නිර්මාණය කිරීමට මනා පුහුණුවක් ලැබූ අයයි. ඉඩමෙහි පවතිනා ගහ කොළ හැකි තරම් ඒ අයුරින්ම තබාගෙන ගොඩනැගිල්ල එම ලක්ෂණ වලට ගැළපෙන ලෙස ඉඩම තුළ ස්ථන ගත කිරීමට දක්ෂ වාස්තු විද්‍යාඥයකු බුද්ධිමත්ව සහ නිර්මාණාත්මකව කටයුතු කරනු ඇත. එම ඉඩම සම්බන්ධයෙන් ඔබ දරන අදහස් ඔබ බලාපොරොත්තු වන ස්වභාවය ගැන ඔබේ වාස්තු විද්‍යාඥයාට දන්වා සිටීම ඔබේ වගකීමක් වෙයි.

එමෙන්ම ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා සැළසුම් කිරීමේදී එම ඉඩමට අදාළ නගර සභාව ප්‍රාදේශීය සභාව සහ නාගරික සංවර්ධන අධිකාරිය මගින් කෙටුම්පත් කර ඇති රෙගුලාසි පිළිබඳව ඔබේ වාස්තු විද්‍යාඥයා විසින් ඔබව දැනුවත් කරනු ඇත. වීදි රේඛා, පසු පස ඉඩකඩ මනා ආලෝකය සහ වාතාශ්‍රය සඳහා විවෘතව තැබිය යුතු ඉඩකඩ ප්‍රමාණය ඉඩමෙහි ප්‍රමාණය අනුව ඔබට ගොඩනැගිල්ල ඉදිකළ හැකි උපරිම උස ප්‍රමාණය වැනි විවිධ තාක්ෂණික රෙගුලාසි වලට අනුකූලව අප ගොඩනැගිල්ල සැළසුම් කළ යුතුය. ඔබ ඉදිකරන ගොඩනැගිල්ල එම සියළුම රෙගුලාසි වලට යටත්ව, ඔබට උපරිම සාධාරණයක් ඉටුවන පරිදි නිර්මාණය කිරීමට ඔබේ වාස්තු විද්‍යාඥයා කටයුතු කරනු ඇත. ■

***සටහන - වරලත් වාස්තු විද්‍යාඥ සුමුදු අතුකෝරල***

*(සැළසුම් සහ ඉදිකිරීම් ක්‍රියාවලිය තුළ වාස්තු විද්‍යාඥයා සහ සේවාදායකයා අතර ඇතිවිය යුතු අවබෝධය ඉදිකිරීම් ක්‍රියාවලියේ ඊළඟ පියවරවල් සඳහ කොතරම් වැදගත් වේද යන්න මීළඟ වාස්තු කලාපයන් තුල බලාපොරොත්තු වන්න)*









# විස්මෘතියේ හා විදූරණයේ වාස්තු විද්‍යාත්මක ප්‍රකාශනය.

# THE BELLY OF AN ARCHITECT (පළමු කොටස)

එටියිනේ - ලුවී බුලේ (Etienne - Loois Boollée) යන්න නූතන බටහිර වාස්තු විද්‍යා සන්දර්භය තුල රැව් පිළිරැව් දුන් නාමයක් නම් නොවේ. වාස්තු විද්‍යා ඉතිහාසය පුරාවම සීමා මායිම් බිඳ නව මානයන් සොයා ගිය වාස්තු විද්‍යාඥයින් අතර පවා, බුලේ යන නාමය යම් විස්මෘතියක හා අප්‍රකටත්වයක තිබූ නමකි. මෙවන් ප්‍රශංසාභංගත්වයකට භාජනය වූ පුද්ගල චරිතයක් වස්තුබීජ කොටගෙන නිර්මාණය වූ එවැනිම විස්මෘතියකින් සටහන් කළ හැකි සිනමා පටයකි The Belly of An Architect. 1987 වසරේ එක්සත් රාජධානියේ හා ඉතාලියේ සම සිනමා නිර්මාණයක් ලෙස එළිදුටු මෙම චිත්‍රපටය, පීටර් ග්‍රීන්වේ (Peter Greenway) අතින් රචනා වී, ඔහුගේම අධ්‍යක්ෂණයට භාජනය වීම කැපී පෙනේ.

බ්‍රයන් ඩෙනෙහි (Brian Dennehy) නම් සුප්‍රකට ඇමරිකානු නළුවා මෙහි ප්‍රධාන චරිතයට පන පොවද්දී, අන් චරිත ඇමරිකානු හා ඉතාලියානු නළු නිළි කැලක් අතින් සිදු විය.

1987 වසරේ (Cannes) ජාත්‍යන්තර සිනමා උළෙලෙදී Golden Palm සම්මානය උදෙසා නිර්දේශ වීමට පරිබාහිරව, මෙම චිත්‍රපටයේ අන්තර්ගතය වාස්තු විද්‍යා හෝ සිනමා කවයන් තුළදී කතිකාවතකට භාජනය වී නොතිබීම කැපී පෙනේ. පොදු මහත් ප්‍රේක්ෂක සමුදායක් කේන්ද්‍ර කොටගෙන චිත්‍රපටයන් නිෂ්පාදනය වූ දශකයක, මෙවන් සංකේතාත්මක හරයෙන් හා අන්තර්ගත තේමාවන්ගෙන් හෙබි අසම්මත නිර්මාණයක් මතකයෙන් කාලක්‍රමිකව බැහැර වී යාම විස්මයක් නොවේ.

පිටිසරබද ඉතාලියානු දුම්රිය මඟක තොරතෝංචියක් නොමැතිව ඉදිරියට දිවෙන දුම්රියක් විවිධ දෘෂ්ඨි කෝණයන් තුළින් විටෙක ලංව හා විටෙක දුරස්ව පිළිඹිබු වේ. මෙම දුම්රියේ චාලකත්වය නොපිරිහෙලා ප්‍රකාශනය කිරීමට එම උද්වේගකර රූප රාමුන් අතරින් පතර පාළු පල්ලියක භූමියෙහි සහ සොහොන් ස්මාරකයන්හි මන්දගාමී දර්ශනයන් සමඟ මුසු කර ඇත්තේ උසස් පරිචයකිනි. දුම්රියේ චාලකත්වයට සමගාමීව අඳුරු දුම්රිය මැදිරියක් තුළ උණුසුම් අඹු - සැමි සම්බන්ධතාවයක සේයා දර්ශනය වන්නේ පුළුල් වීදුරු ජනේලයෙන් පිටත වේගයෙන් ආපස්සට දිවෙන පිටිසරබද පසුබිමක් දර්ශන කොටගෙනය. මෙම ලිංගික ජවනිකාවක කූඨප්‍රාප්තියකින් කෙළවරවන්නේ ආස්වාදයෙන් පිරිගිය කාන්තාව "Oh, What a way to Enter Italy" *“අහෝ ඉතාලියට ඇතුල් වීමට මීට වඩා කදිම මඟක් තිබේද?”* යන අර්ථය ගෙනදෙන ප්‍රකාශයකිනි.

ස්ටෝර්ලි ක්‍රැක්ලයිට් (Stoorley Kracklite) නම් මැදිවියේ වාස්තු විද්‍යාඥයා සහ ඔහුගේ තරුණ සලෙලු බිරිය අතර සිදුවන මෙම එක්වීම, චිත්‍රපටියේ සමාරම්භය මෙන්ම සංඛේතාත්මක වශයෙන් අභිනව ජීවයක් බිහිකිරීමේ සමාරම්භය ද පිළිඹිබු කරයි.

කාලයේ වැලිතලාවෙන් වියැකී ගිය බුලේ වාස්තු විද්‍යාඥයා, නූතන බටහිර පුනරුද වාස්තු විද්‍යාවේ තෝතැන්න බදු වූ රෝම වාස්තු විද්‍යා පසුබිමක වාස්තු විද්‍යා ප්‍රදර්ශනයක් සංවිධානය කිරීම උදෙසා ඉහත සඳහන් ඇමරිකානු ජාතික වාස්තු විද්‍යාඥයා ඉතාලියට පැමිණේ.

ප්‍රදර්ශනයේ සම සංවිධාත්මක ඉතාලියානු සගයින්, ක්‍රැක්ලයිට් කෙරෙහි යම් වපරැසකින් බැලීමට බුලේ නම් වූ අප්‍රකට චරිතය බටහිර නම් දැරූ අති පූජනීයත්වයෙන් සැළකෙන වාස්තු විදු මඩුල්ල අතරතුර පිදුමට හැකිද යන ප්‍රශ්නාර්ථය උක්ත වේ. බුලේ විසින් බිහිසුණු ඇඩොල්ෆ් හිට්ලර්ගේ සුප්‍රකට හා අසම්මත වාස්තු විද්‍යාඥයා වූ ඇල්බර්ට් ස්පියර්ගේ (Albert Speer) වීරයා යන විරුදාවලියට පාත්‍ර වීම මෙන්ම, ක්‍රැක්ලයිට් යන “නව ලොව” හෙවත් පෙරටුගාමී ඇමරිකානු ප්‍රතිමූර්තිය හා පැරණි ලොවේ කේන්ද්‍රස්ථානය බදු වූ රෝමයේ පාරම්පරික සමාජ-සංස්කෘතිකමය රාමුව සමග වන නිරන්තර ඝට්ටනයද මෙමගින් සංඛේතවත් වේ.

18 වන ශතවර්ෂයෙහි පැරිසියේ උපත ලද බුලේ, මුලින් සම්භාව්‍ය ප්‍රංශ වාස්තු විද්‍යාව (Main Stream French Classical Archtecture) හදාරා ඉන් පසුව නව සම්භාව්‍යවාදී





(Neoclassicism) ශෛලියද උගත් වෘත්තික වාස්තු විද්‍යාඥයෙකු විය. පර්සියාවේ දෙවන ෆෙඩ්රික් (Frederick-II) රජුගේ නිල වාස්තු විද්‍යාඥයා නම් සංකේතාත්මක ගෞරවයෙන් පවා පසුකලෙක පුද ලැබූ හෙතෙම, වැඩි කතාබහට ලක්වූයේ පැරිසියේ පිහිටි සුප්‍රකට Ecolé Nationale des Ponts et chassées නම් වාස්තු විද්‍යා සිප්සල ආශ්‍රිතව ගුරුවරයෙක් මෙන්ම න්‍යායවාදියෙක් ලෙස සිදුකරන ලද මහඟු සේවය නිසාවෙනි.

බුලේ විසින් සම්භාව්‍ය වාස්තු විද්‍යාව අනුසාරයෙන් බිහිකරන ලද ජ්‍යාමිතික ශෛලිය, එහි වූ අනවශ්‍ය සැරසිලි අඩු කර සංක්ෂිප්ත මුහුණුවරක් ලබාදීම හා විශේෂයෙන්ම ජ්‍යාමිතික හැඩතලයන් උළුප්පා දැක්වීම, විශාල පරිමාණයන් කරා යෑම, කුළුණු වැනි මූලික සංඝටකයන්ගේ දැඩි ප්‍රතිභාවිතය ආදී ක්‍රියාවන් තුලින් ගොඩනැගිලි වලට යම් කැපී පෙනෙන ස්මාරක වැනි ලක්ෂණයන් ලබාදීම හරහා ප්‍රසිද්ධියට පත් වී තිබුණි. නිත්‍යතාව (Regularity) සමමිතිකතාව (Symmetry) සහ විවිධත්වය (Variety) වන සාධකයන් බුලේගේ වාස්තු විද්‍යා ක්‍රමවේදයේ මූලික ලක්ෂණ ත්‍රිත්වය වේ.

වාස්තු විද්‍යාත්මක ශෛලීය භාවිතය තුලින් යම් ගොඩනැගිල්ලක සැබෑ භාවිතය නිරූපනය වීම අවැසි යැයි ඔහු දැරූ මතය පසුකලෙක "Talking Architecture" හෙවත් "කතාබහේ යෙදෙන වාස්තු විද්‍යාව" ලෙස අර්ථකථනය විය. 19 වන සියවසේදී පරිපූර්ණත්වයට පත්කොට 20 වන සියවස කරා ගලා ගිය Beaux - Arts වාස්තු විද්‍යාත්මක පුහුණු මාදිලිය පවා ඉහත කී බුලේ සංරචයන්ගෙන් පෝෂිත වීම කැපී පෙනේ. විසිවන සියවසේ බිහිවූ නූතන වාස්තු විද්‍යා ක්‍රමවේදයන් කිහිපයක්ම මෙලෙස බුලේගේ පෙර අවධානයට යොමුව තිබීම විශේෂ ලක්ෂණයකි.

තම මරණයෙන් අඩ සියවසකට පසුව ආලෝකනය (Enlightenment) සංකල්පයෙන් ප්‍රකට වූ බ්‍රිතාන්‍ය ජාතික විද්‍යාඥ සර් අයිසෙක් නිව්ටන් (Sir Isaac Newton) උදෙසා නිර්මාණය කරන්නට යෙදුනු අනුස්මාරකය (Cenotaph) හරහා බුලේ අතින් බිහිවූ නව න්‍යායාත්මක ශෛලීය භෞතිකවමය වශයෙන් ජීවය ලැබුවා යැයි කීම සාධාරණය.

මීටර් පන්සීයයක් උස්වූ ගෝලීය හැඩය ගොඩනැගිල්ල ඊජිප්තු පිරමීඩ වලටද වඩා විශාලත්වයෙන් අධික වූ අතර, එය වටා නිර්මිත බාධකමය වෘත්තාකාර තලයන් ද්විත්වයක් මගින් එහි ස්ථායීතාවය ළඟා කරගෙන ඇත.

කිසිදා ගොඩනැගීමට භාජනය නොවූවද, තම කටු සටහන් හා විවිධාකාර නිරූපණ මාදිලින් හරහා වෘත්තීය ජීවිතය පුරාවට මෙම නිර්මාණය පතුරුවා හැරීමට බුලේ විසින් යුහුසුළු විය. ගෝලීය ගොඩනැගිල්ලේ දක්ෂිණ ධ්‍රැවය තුල කුඩා ස්මාරකයක් ස්ථානගත වන අතර, දිවා කල ගෝලාර්ධ ගැබේ සිදුරු තුලින් පැමිණෙන ආලෝකයෙන් රාත්‍රී තරු වැකුණු අහස් කුසක් නිරූපණය කරයි.

දහවල් ප්‍රතිමූර්තිය ගෝලය මධ්‍යයේ එල්ලෙන කටුගෝලයකින් විහිදුන ආලෝකධාරාවකින් සනිටුහන් වේ.

මෙලෙසින් ආලෝකයේ ක්‍රමික භාවිතය තුලින් ගොඩනැගිලි අභ්‍යන්තරයෙහි ස්වභාවය වෙනස්කොට පෙන්වීමට ඇති හැකියාව බුලේ විසින් පෙන්වා දෙන ලදී. Salon for the Hótel de Toorolles හා Hótel Alexandrea වැනි බුලේගේ නිර්මාණයන් තම දායකත්වයේ සංකල්පීය මට්ටමෙන් ඔබ්බට යම් දුරකට හෝ රැගෙන යාමට ඔහුට පිළිසරණක් විය. මෙම පෙරටුගාමී වාස්තු විද්‍යාඥයාගේ අතින් එළිදුටු සංකල්පීය සටහන් බහුතරයක්ම 1950 දශකය වනතුරුම අප්‍රකටව වාස්තු විද්‍යා අධ්‍යාපනඥ හා විචාරක ඇස නොගැටී පැවතීම ඛේදයකි. 1953 වසරේ (Eassay on the Art of Architecture) යන නමින් භාවාත්මක කෝණයකින් හා හැඟුම්බර අන්දමින් නව සම්භාව්‍ය වාස්තු විද්‍යාවක් ප්‍රචාරනය උදෙසා ගන්නා ලද ප්‍රයත්නය තෙක්ම බුලේගේ නාමය විස්මෘතියක්ම විය. තාර්කිකත්වය අභිබවා ගිය අසාමාන්‍ය පරිමාණයන්ගෙන් යුත් බුලේගේ පොදු ගොඩනැගිලි ඔහුගේ පටු සමාජ පිළිගැනීම පිටිපස වූ සාධකය ලෙස ගෙනහැර දැක්වීම සාධාරණය. අල්ඩෝ රෝසි (Aldo Rossi) වැනි 20 වන සියවසේ වාස්තු විද්‍යාඥයින් හරහා බුලේ නැවතත් වරින්වර සමාජ කතිකාවකට භාජනය වීම කෙමෙන් ඇරඹින.

මෙම සිනමා පටයේ එන ක්‍රැක්ලයිට් චරිතය ද මෙලෙසින්ම බුලේ නමින් අප්‍රකට විස්මෘතියට පෙම් බැඳි අතළොස්සක් වූ හුදකලා චරිතයන් නිරූපණය කරයි. චිත්‍රපටයේ මූලික සන්දර්භයේදී පවා බුලේගේ තෝරාගැනීම මුළුමනින්ම සාධාරනීයකරනය නොවීම කැපී පෙනේ.

ඉහත කී ප්‍රදර්ශනය නිල ලෙස ආරම්භවීම සනිටුහන් කිරීම උදෙසා පැවැත්වෙන රාත්‍රී ප්‍රියසම්භාෂණයේදී බුලේගේ වාස්තු විද්‍යා විධි ක්‍රමයන් ඇගයීමට භාජනය වන අතර ක්‍රැක්ලයිට් හට තම මුදල් මත පදනම් වූ වෘත්තීය වාස්තු විද්‍යා ප්‍රවේශය හා එය සැසඳීමට අවස්ථාවක්ද ලැබේ. තම වාස්තු විද්‍යා නිර්මාණයන් තමා විසින්ම යම් සම්ච්චලයකට ලක්කරවන හෙතෙම එමගින් අන්‍යයන් හට යම් ආස්වාදයක් ලබාදීමට තරම් නිහතමානී වේ. මාංශභාරී (Carnivorous) වාස්තු විද්‍යා විධික්‍රමයක් ලෙස විරුදාවලිය ලත් ග්‍රීක - රෝම ආධිපත්‍යය සණයේ "පැන්තියනය" (Pentheon) නම් සුප්‍රකට ගොඩනැගිල්ල අසබඩ පැවැත්වෙන යතෝක්ත සම්භාෂණයේදී බුලේගේ එම සනයේම පුනරුදාත්මක වාස්තු විද්‍යා ප්‍රවේශය කිහිපවිටකදීම මෙනෙහි කිරීමට භාජනය වේ. බුලේගේ සුප්‍රකටම නිව්ටන් ස්මාරකයේ අනුරුවක් ලෙස නිර්මාණය වූ කේක් ආකෘතියේ දැල්වූ ඉටිපන්දම් නිවා දමන ක්‍රැක්ලයිට්, ප්‍රදර්ශනයේ ඇරඹුමට සමගාමීව තම උපන් දිනයද සමරයි. මෙම මොහොතේ ආරාධිතයන් අමතන ඔහු සම්භාව්‍ය වාස්තු විද්‍යාත්මක ශෛලියෙන් නිමවූ පැන්තියනය පසුබිම් කොට ගෙන මැවෙන නව සම්භාව්‍ය ශෛල්‍යයේ වාස්තු විද්‍යාත්මක







නිර්මාණයක ආකෘතිය හා නිව්ටන් යන චරිතයේ සහ සම්බන්ධය ගැන තම අවධානය යොමු කරවයි.

භාවිතයෙන් ක්‍රමයෙන් ගිලිහී යන බ්‍රිතාන්‍ය පවුමේ බැංකු නෝට්ටුවකින් සර් අයිසැක් නිව්ටන් බුලේගේ නිර්මාණය හා සමානවම සැමරෙන බව පැවසෙන මෙම ජවනිකාවේදී ක්‍රැක්ලයිට් විසින් ගුරුත්වාකර්ෂණය ඇපල් මලින් සංකේතවත්ව වන අයුරු අර්ථකථනය කරයි.

මේ අතර තම ස්ථූල ගොඩනැගිලිද තමා මෙන්ම මනාව ස්ථානගත වූ ගුරුත්ව කේන්ද්‍රයන්ගෙන් සපිරීම ගැන පාරිභාෂක අර්ථකථනයක් ලබා දෙන ක්‍රැක්ලයිට්ගේ ප්‍රකාශය ඔහුගේ බිරිඳ ද අනුමත කොට සිටී. කැස්පේසියන්ගේ කලා ශිල්පී සහෝදරිය ෆ්ලාවියා සමග ප්‍රලාපයේ යෙදෙන ලූවිසාගෙන් තමා කොතරම් කාලයක් තම ස්වාමි පුරුෂයා හා යුග දිවියේ ගත කරන ලද්දැයි නගන පැනයට සත් වසරැකැයි යන පිළිතුර ලැබෙයි. එයට ෆ්ලාවියාගෙන් ලැබෙන විස්මය දනවන අභිනය හමුවේ යම් අපහසුතාවයකට පත්වන ලූවිසා එය ඕනෑවටත් වඩා වැඩි කාලයක් නොවේදැයි හාස්‍යාත්මකව අසයි. මින් ඇය හට ගම්‍ය වන්නේ තම ඉතාලි මිතුරු කැළ පෙරළිකාරාත්මක සමාජ අසම්මතවල පිහිටා සිට එම අසම්මතතාවය සමාජ සම්මතයට ගරු කරන තමා වැන්න වුන් හට ආරෝපණය කරන වගයි.

තවදුරටත් සංවාදයේ යෙදෙන ලූවිසා සමච්චලයෙන් යුතුව පවසා සිටින්නේ තම ධනවත් ව්‍යාපාරික පියාගෙන් ඔවුන් ලද මංගල තෑග්ග ගැනයි. නව යුවල උදෙසා නිවසක් නිර්මාණය කිරීමේ කර්තව්‍යය ක්‍රැක්ලයිට් හට භාරවූ විටෙක එයද බුලේ අනුස්මරණාත්මකව නිමැවූ අයුරු ඇය පවසා සිටින්නේ යම් කරුණක් යටි අරමුණු කොටගෙනයි.

කීර්තිමත් වාස්තු විද්‍යාඥයෙකුගේ සෙවනැල්ලට යටව ජීවත් වීමේ ඛේදය හා කළකිරීම මෙලෙසින් ඇය ප්‍රකාශනය කර සිටියි.

මේ අතරතුර තම සගයා වන ස්පෙක්ලර් සමග සාමිච්ඡයේ යෙදෙන කැස්පේසියන් ඔහු ක්‍රැක්ලයිට්ගේ බිරිඳ ගැන දරණ අදහස විමසා සිටී. “ඇය ඔහු හට ලාබාල වැඩිය” යන පිළිතුරට කැස්පේසියන් තම පෞද්ගලික අදහස හාස්‍ය ජනක ආකාරයෙන් ප්‍රකාශ කර සිටී. එනම් ඇය යම් ලෙසකින් ශෘංගාරාත්මක අත්දැකීමක් බලාපොරොත්තු වන බව ඇය කේක් අනුභව කරන ආකාරයෙන් තමා හට වැටහෙන බව පවසයි.

ප්‍රිය සම්භාෂණයේ උත්සාවාකාරී නිමාවකින් සනිටුහන් වන්නේ දිනයේ නිමාව හා තව දිනයක ඇරඹුම සනිටුහන් කරමිනි. මෙහිදී විශේෂ ආරාධිතයින් සියලු දෙනා පැන්තියනය අබියස නැගී සිටිමින් බුලේ සිහිවීම උදෙසා අත්පොළසන් නාදයක් ලබා දෙයි. මෙම ජවනිකා තුලදී තමා අවට සිටින්නන්ගේ කුහක හා සැකමුසු මුහුණු පෙළ අතර බුලේ කෙරෙහි භක්තියෙන් මත්ව විදුරිත බවකින් මත්වූ ක්‍රැක්ලයිට්ගේ වත සමීප රූපයක් ලෙස දර්ශනය වේ.

ප්‍රියසම්භාෂණය අවසානයේ තමා අගනා මුදල් නෝට්ටුව අතපසුවීමකින් අහිමි කරගන්නා හෙතෙම ඉන් යම් කනස්සල්ලකට පත්වේ. චිත්‍රපටයේ මෙම සන්ධිස්ථානයෙන් සනිටුහන්වනවා විය හැක්කේ ක්‍රැක්ලයිට් හට තම ලෞකිකත්වය කෙරෙහි ඇති ගුරුත්වාකර්ෂණ ගුණය එම මොහොතේම අහිමි වීම විය හැක.

සේවකයින් ප්‍රධාන කෑම මේසය ඉවත් කරන අතරතුර කේක් ආකෘතිය මත ඉටිපන්දම් දැල්ලෙන් දැවෙන මුදල් නෝට්ටුව ක්‍රැක්ලයිට්ගේ සාමාන්‍ය දිවි පෙවෙතේ අවසානය මෙසේ සනිටුහන් කරයි.

ඇතැම් විට මෙමගින් අර්ථකතනය වන්නේ  අනෙකුත් වස්තූන්සේම ක්‍රැක්ලයිට් යන පුද්ගලයාද සියළු නියමයන් හා බලයන් හට යටත් වූ අනිත්‍යතාවය හෙවත් මරණයෙන් නිදහස් නොවූ තවකෙකු බවයි.

තම බිරිය සමග රෝමානු මාදිලියේ නවාතැනක් වූ හෝටලයට පිවිසෙන කථානායක තැන තම මැදිවියට නොසරිලන අයුරැනි ඉතා කෙළිලොල් ලෙසින් ලිංගිකත්ය කෙරෙහි යොමුවෙයි.

What's this?  "Twice in one day!" (මේ කිමෙක්ද? එක් දිනයක් තුල දෙවරක්) යන තම බිරිඳගේ විශ්මය දනවන ප්‍රකාශය මඟින්ම ඔහුගේ ලෞකික දිවියේ කූටප්‍රාප්තිය සනිටුහන් කරවයි.

මෙම ජවනිකාව කෙළවර වන්නේ ඔහු තම යටි බඩ දෑතින් අල්ලා ගෙන යම් ශාරීරික අපහසුතාවයක් පෙන්නුම් කිරීම තුළිනි. කූටප්‍රාප්තිය (Climax), ක්ෂණයකින් අවප්‍රාප්තියක් (Anti Climax) බවට පරිවර්තනය වීම මෙලෙසින් සංඛේතාත්මක වනවා විය හැක. බඩරිදුමට හේතුව අධික ලෙස ආහාර ගැනීම බව පෙන්වා දෙන බිරිය තමා හට අවසාන කල නොහැකි කර්තව්‍යයක් නොඅරඹන ලෙස උපහාසාත්මකව පවසා සිටී.

ක්‍රැක්ලයිට්ගේ ඉතාලියානු හා ඇමරිකානු සම්භවයකින් එන තරුණ බිරිඳ ලූවිසා ඉතාමත් සරාගී පෙනුමින් හා කාමුක පෙනුමකින් යුක්ත වේ. ඉතා කල්පනාකාරී චරිතයකින් හෙබි ක්‍රැක්ලයිට්ගේ සැබෑම ප්‍රතිවාදයක් ලෙස ඇය චිත්‍රපටියේ පුරාවටම නිරූපණය වේ. ඉහත ප්‍රියසම්භාෂණයේදී ඈ හා කුලුපග වන තරුණ ඉතාලියානු වාස්තු විද්‍යාඥයෙක් වන කැස්පේසියන් (Cespasien) සමග තම බිරිඳගේ ඇඟෑළුම්කම ක්‍රැක්ලයිට් හට ගැටලුවක් නොවන සේය. ඔහුගේ මුලුමහත් චිත්ත සන්තානයම බුලේ හා වාස්තු විද්‍යාව වෙනුවෙන් කැපවී ඇතිවාක්සේය. ඉන්පසු ජවනිකාවෙන් පිළිඹිබු වන්නේ ප්‍රහාසාත්මකව දැහැනකට සමවැදුනු ලෙසකින් තම යහන මත සිට බුලේගේ වාස්තු විද්‍යාත්මක සටහන් පෙළක් නිරීක්ෂණය කරන ක්‍රැක්ලයිට්ය.

ඉන් පසු රූප රාමු පෙලින් තම ඉතාලියානු සගයා ඔහු හට තමා හාත්පස පිහිටි වැදගත් රෝමානු ගොඩනැගිලි කීපයක් හා ඒවායේ සමාජයීය පිළිගැනීම ගැන පැහැදිලි කරන අතරතුර කැස්පේසියන් ක්‍රැක්ලයිට්ගේ බිරිඳ සමග පසුබිමේ ආලාප සල්ලාපයේ යෙදෙන අයුරු පෙන්නුම් කරයි. කැපී පෙනෙන ධවල වර්ණයෙන් සැරසී අඳුරු පැහැ වතින් සැරසී ඉතාලියානු සගයන් මධ්‍යයේ සිට වාස්තු විද්‍යා තේමාව








ගැන සිත් යොමුකර සිටින ක්‍රැක්ලයිට් හට එය කිසිසේත් නොපෙනේ. ලුවිසාගේ මනරම් රෝස පැහැ සාය මදපවනේ ලෙලදී ඉහලට එසවීමත් මේ අතර පෙන්නුම් කිරීම තුලින් ඇයගේ සරාගී සිතුවිලි හා ලිංගිකත්වයට ඇති නැඹුරුවත් ඒ කෙරෙහි සිය සැමියාගේ උදාසීනත්වයත් ප්‍රකාශනය වේ.

ඔගස්ටර් සීසර්ගේ ස්මාරකයේ ස්ථානීය පිහිටීම ඔහු හට වඩා වැදගත් මාතෘකාවක් වන සේය. මේ අතර ලුවිසා හා සංවාදයේ යෙදෙන කැස්පේසියන් ඈ හට හඟවා සිටින්නේ බුලේ වැනි අප්‍රසිද්ධ චරිතයන් උදෙසා සංවිධානය වන ඇමරිකානු ඩොලර් මිලියනයක වටිනාකමින් යුත් ප්‍රදර්ශනය යම්තාක්දුරට ධන හානියක් බවය. ඉහල මාලයක සමමිතිකව නිර්මිත සඳලු තලයක් මධ්‍යයේ සිට ක්‍රැක්ලයිට් ප්‍රදර්ශනයේ ප්‍රධාන දායකයා සමග සංවාදයේ යෙදෙන අයුරු පහත මාලයේ සිටින ඔවුන් දෙදෙනාගේ දර්ශනයට යොමුවේ.

ඉතා ලාබාල කාලයක සිට තමා බුලේ කෙරෙහි දැක්වූ උනන්දුව සහ බුලේගේ ගොඩනැගිලි හා ස්වර්ගය අතර ඇති සම්බන්ධතාවය ගැන ඔහු ප්‍රකාශ කොට සිටියි. ලුවිසා සමග සංවාදය ඉදිරියට ගෙනයන කැස්පේසියන් තරුණයෙකු වූ තමා ප්‍රදර්ශනයේ මූල්‍යමය වගකීම දැරීම ගැන ඇයගේ උපහාසය, මැදිවියේ සැමියෙකු ඇයගේ ස්වාමියා වීම යන සංසිද්ධිය හා සංදෘශයක් දකිමින් නිම කරයි. මෙහිදී ඔහුගේ යටි අරමුණ ක්‍රමයෙන් ලුවිසා නම්මා ගැනීම බව පසක්වේ. ඉහල මාලයේ වන සංවාදය පෙරට ගෙන යන අතර ක්‍රැක්ලයිට් හට දැනගැනීමට ලැබෙන්නේ ඔවුන් රැඳී සිටින ගොඩනැගිල්ල නිර්මාණය කල වාස්තු විද්‍යාඥයා දැව නිමාවට විකල්පයක් ලෙස කිරිගරුඬ භාවිතා කළ බවයි. ඊට යටි අරමුණ වන්නට ඇත්තේ වසර දාහතරක් වූ කන්‍යා මරියා තුමිය හා වසර හතළිහක් වූ ජෝසප් ආශ්‍රයෙන් කන්‍යා උපතක් සිදුවීම ගැන ඔහුගේ වූ අවිශ්වාසය හේතුවන්නට ඇති බව ඔවුන් ප්‍රකාශ කොට සිටිමයි. සියලු කතෝලිකයින් කන්‍යා උපත පිළිගන්නේ දැයි ක්‍රැක්ලයිට් නගන පැනයට ඔවුන්ගේ පිළිතුර වන්නේ විවාහ සංස්ථාව තුළදී නම් එසේ යන වගයි. පසුකාලීනව ක්‍රැක්ලයිට් හා ලුවිසාද දරු උපතකට මුහුණදීම හා විවාහක ඔහු හා ඇය අතර යතෝක්ත ආකාරයේම වයස් පරතරයක් තිබීම තුලින් සනාථ වන්නේ එවන් යථාරූපී නොවූ සංසිද්ධියක් පවා යම් සමාජ සම්මතයන් තුලදී ලෝකයා පිළිගන්නා බවයි. කන්‍යා උපත පිළිබඳව ක්‍රැක්ලයිට්ගේ මතය විමසු විට  ඔහු උපහාසාත්මකව කියා සිටින්නේ මෙවන් මොහොතකදී තමා ඕනෑම මාදිලියක උපතක් පිළිගැනීමට සැරසී සිටින බවයි. මේ අතර ස්වභාවික ගබ්සාවීම් කීපයකට තමා මුහුණදුන් අයුරු කැස්පේසියන් හට සැලකර සිටින ලුවිස් හා තමා ගැබ්ගත් කල හා තම ස්වාමි පුරුෂයා නව නිර්මාණයක ලද විට ඔවුන් දෙදෙනාගේම බලාපොරොත්තු ඉහල නංවාගන්නා අයුරු පවසා සිටී. එමෙන්ම අවසානයේදී තමා දරු ප්‍රසුතියේදී හා ඒ ආකාරයෙන්ම නිර්මාණයක් අවසාන කිරීමේදී තම සැමියා, එම කර්තව්‍යයන් ගැන දක්වන කළකිරීම අතර සහසම්බන්ධයක් ඇය දකී. මෙම සංවාදය ඔස්සේ ක්‍රැක්ලයිට්ගේ යතෝක්ත පිළිතුර ද හරවත් වෙයි. මේ අතර බීමත් වයෝවෘද්ධ නිලධරයෙකුගේ නොමනා හැසිරීමෙන් ලුවිසා යම් කැළඹීමකට ලක්වෙයි. පුරාවිද්‍යාත්මක වටිනාකමින් යුත් ගොඩනැගිලි උදෙසා වූ සංගමයේ ලේකම් මෙලෙසින් හඳුනාගන්නා ක්‍රැක්ලයිට් හට පසුව හඳුනා ගැනීමට ලැබෙන්නේ පුරාණ ව්‍යාධීන් ගැන විශේෂඥ වූ පුද්ගලයෙකි. මෙම ක්ෂණික හඳුනාගැනීම ක්‍රැක්ලයිට්ගේ සන්තානයේ වූ යම් සැඟවුනු භීතිකාවක් යළි අවධි කිරීමේ නිමේෂය සනිටුහන් කරයි.

ඉන්පසු ජවනිකාවක ඉතාලියානුවන් සමග උද්‍යෑසන ආහාරය ගන්නා අතරතුර තමා නූතන වාස්තු විද්‍යාඥයෙකුදැයි යමෙක් නගන පැනයට ක්‍රැක්ලයිට්ගේ උපාහාසාත්මක පිළිතුර වන්නේ උවමනා පමණට පමණක් එසේය යන්නයි. ඉනික්බිතව ගොඩනැගෙන සමූහ සංවාදය ඔස්සේ බුලේගේ නිර්මාණය අනුරූ ලොව මොස්කව්, බීජිං හා නැගෙනහිර බර්ලීනය ආදි ප්‍රබල ඒකාධිපති දේශපාලනික සංදර්භයන්හිදී ඇගයෙන බව ප්‍රකාශනය වන අතර, ක්‍රැක්ලයිට් උපහාසාත්මකව රෝමයද එම ගොඩටම ඈඳාගනී. මේ අතර මුසොලිනි, සිය නිල වාස්තු විද්‍යාඥ ස්පියර් හරහා හිට්ලර් ද බූලේ ඇගයූ අයුරු ආවර්ජනය වන අතරම සීසර් පවා බූලේ ඇගයීමට තිබෙන ඉඩකඩ ගැන අනුමානයක් ද පහල වෙයි. මෙම කථිකාව පුරාවටම යම් සමාජවාදයට විරුද්ධ වූ අදහසක් පාදකව ඇති බව පෙනේ.  ඒ අතරම සීසර් ස්මාරකය ක්‍රැක්ලයිට් දැකිය යුත්තක්ම බවට අදහසක් පලවන අතර සීසර්ගේ මරණයට හේතුපාදක වූ සිද්ධියද සාකච්ඡාවට භාජනය වේ. සීසර්ගේ භාර්යාව ඔහු හට විෂ පෙවූ ආහාර වැළදීමට සැලැස්වීමේ සිද්ධියද, එම සංසිද්ධියේ ව්‍යාධි ලක්ෂණයන්ද කන වැකෙන ක්‍රැක්ලයිට් යම් මානසික අපහසුතාවයකට පත්වේ. එම ස්ථානයෙන් ආචාර සම්පන්න නොවන ලෙස නැගීසිට ඉවත්ව යන හෙතෙම ඊළඟ මොහොතේ පොදු වැසිකිළියක් තුල වමනය කරන ආකාරය පිළිඹිබු වේ. ඉනික්බිතව තම බිරියගෙන් සමු ගන්නා හෙතෙම ප්‍රදර්ශනයට අදාල ලේඛන හා පත්‍රිකා කීපයක් අතතැතිව තම කුටිය කරා නික්ම යයි. ලුවිසා මෙහිදී "Anything for Boollee" (බූලේ වෙනුවෙන් ඕනෑම දෙයක්) යන ප්‍රකාශය හරහා තම ස්වාමියා ගැන ඇය තුළ ක්‍රමයෙන් පැනනගින අප්‍රසාදය ප්‍රකාශ කර සිටියි. ■

*සටහන - වරලත් වාස්තු විද්‍යාඥ ආචාර්ය නිශාන් රසාංග විජේතුංග*

නිමැවුමේ කුමන පල නැතිදා රසය විඳිනට
ලතැවුමේ ඇරැඹූමද නිමැවුම සොරා ගත්විට
සැනසුමේ ඉම කොහිද මිතුරන් සතුරුවූවිට
වැනසුමේ දිනය අප නැත මහ දුරක අදසිට

හදවත පුපුරාද කැප කල වෙහෙස සිතුවිට
මිහිකත උසුලාද අයිතිය කොල්ලකෑවිට
ගොළුවත රකීවිද යුක්තිය පසිඳලනවිට
හැඬිවත කුමකටද මේවන් මහත් සොරුනට

නිමැවුමට වූ වෙහෙස දැනෙයිදෝ සොරා ගත්වුනට
වාදයට හොරු ඒද විලිබිය දමා පසෙකට
මිතුරනට වැටහේද ඉන්නා සබේ රවුමට
සොරරැලට හැකිවේද නීතිය නමා දිනුමට

යුක්තිය සොයාවිද දෙපිලම කරට කරසිට
විත්තිය නොයාවිද අධිකරණයේ හමුවට
කල්පය ගෙවේවිද සතුරන් වෙලා සදහට
විනිසය ලැබේවිද හැරමිටි ගසා යනවිට



# වාස්තු

ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයින්ගේ ආයතනය



















නව ප්‍රචාරයන් සඳහා අමතන්න;
පරිගණක නිර්මාණ විධායක සේනක ජයතුංග

**011-267-9507**